# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2021.07.20

වර්ෂ 2021 ක් වූ ජූලි මස 20 වන අඟහරුවාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ ජූලි මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
04. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
05. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
06. ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා
07. ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
09. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
10. ගරු මන්ත්‍රීනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය
11. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
12. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
13. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
14. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
15. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා
16. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
17. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
18. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
19. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
20. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
21. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**නොපැමිණි.**

01. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා

මීට අමතරව ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**<u>ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියළුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

**<u>(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**<u>01) 2021-05-19 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2021-05-19 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න. නැත්නම් 2021-05-19 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

(ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා, ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** 2021-05-19 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** සියළුම ගරු මන්ත්‍රීවරුන්ගෙන් සහ මන්ත්‍රීවරියන්ගෙන් අවසරයි. 2021-05-19 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාවේ 22 පිටුවේ අපේ ආදාහනාගාරය ගැන ගරු සභාපතිතුමා විසින් යෝජනා කරලා තියෙනවා බෙදීමකට යන්න ඕන කියලා. ඒකෙදී චනක චමල් මන්ත්‍රීතුමා යෝජනාවක් ගෙනල්ලා තියෙනවා බෙදීමකට යන්න ඕන කියලා. එම යෝජනාව අපේ චමින්ද මන්ත්‍රීතුමා ස්ථිර කරලා තියෙනවා. නමුත් ඒක ස්ථිර කරලා තියෙද්දී ඒ යෝජනාවට වෙච්ච දෙයක් නැහැ. ආයේමත් නැවත ටෙන්ඩර් කරන්න තීන්දු කරලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මහා සභාව ඒකට ඒකමතිකව තීන්දු කරානේ නැවත ටෙන්ඩර් කරන්න.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඒක තමයි. ඒ යෝජනාව එක්කෝ ඉල්ලා අස්කර ගන්න ඕන. ඒ මුකුත් කරලා නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං බෙදීමකට ගියේ නැහැනේ. වාර්තාවේ ඇතුළත් වෙලා තියෙන්නේ සභාවේ සිද්ධ වෙච්ච දේ නේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඉතිං ඒක තමයි. බෙදීමකට ගියේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බෙදීමකට ගියේ නැහැ. සමස්ථ සභාව තීන්දු කරා නැවත ටෙන්ඩර් කරනවා කියන එක. ඉතිං ඒකට ගනිපු තීන්දුවක් තියෙනවානේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** බෙදීමකට ගියේ නැහැ කියලත් නැහැ. ඒක එහෙම ඇවිල්ලා නැහැනේ එතන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සිදුවෙච්ච දේ තමයි වාර්තාවේ සඳහන් වෙලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඒක ඉල්ලා අස්කර ගැනීමක් කරලා නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කතා කරපු දෙයක සංශෝධනයක් තියෙනවා නම් ඒක ඉදිරිපත් කරන්න. සිදුවෙච්ච සිද්ධිය වාර්තාවේ තියෙනවා. ඒකට අපිට වෙනත් එකක් ඇතුළත් කරන්න බැහැනේ. බෙදීමකට ගියා කියලා ඇතුළත් කරන්න බැහැනේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** අඩු ගාණේ ඒක ඉල්ලා අස්කර ගැනීමක්වත් කරන්න ඕන සභාවෙන් එහෙම යෝජනාවක් ආවට පස්සේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වාර්තාවේ වැරැද්දක් තියෙනවා නම් ඒක ඉදිරිපත් කරන්න. මේක ගැන අපි ඕන නම් වෙනම කතා කරමු. සභා වාර්තාවේ වැරැද්දක් නැහැනේ. වාර්තාවේ අඩුපාඩුවක් නෙමෙයිනේ මේක.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඒක වාර්තාවේ අඩුපාඩුවක් නෙමෙයි. නමුත් එතන වැරැද්දක් තියෙනවා කියන එක කිවුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වාර්තාවේ අඩුපාඩුවක් තියෙනවා නම් කරුණාකරලා ඒක ඉදිරිපත් කරන්න.

සංශෝධන නැති බවයි පෙනෙන්නේ.

2021-05-19 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**02) 2021-06-16 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2021-06-16 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න. නැත්නම් 2021-06-16 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** 2021-06-16 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

සංශෝධන නැති බවයි පෙනෙන්නේ.

2021-06-16 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නවක මන්ත්‍රීධූරය සඳහා අද සභා රැස්වීමට සහභාගි වන ටී.එච්. කුලරත්න මන්ත්‍රීතුමාව ඉතාමත් ගෞරවයෙන් යුතුව මේ අවස්ථාවේදී පිළිගන්නවා සියළුම මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා වෙනුවෙන්. ටී.එච්. කුලරත්න මන්ත්‍රීතුමා නවක කෙනෙක් කියලා මම කිවුවට මේ සභාවට තමයි එතුමා නවකයෙක් වෙන්නේ. එතුමා 2011-2015 කාලයේදී මේ සභාව නියෝජනය කරපු ගරු මන්ත්‍රීවරයෙක්. ඒ පිළිබඳවත් මම සිහිපත් කරනවා. මේ අවස්ථාවේදී බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක් වශයෙන් ඔබතුමාගේ සම්ප්‍රාප්තිය ඇත්තටම සභාපතිවරයා විදියටත්, සියළුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා විදියටත්, ලේකම්තුමා ප්‍රධාන සියළුම නිලධාරි මණ්ඩලය වෙනුවෙනුත් ඉතාමත් ගෞරවයෙන් යුතුව පිළිගන්නවා.

ප්‍රධාන කාරණා දෙකක් කියන්න තියෙනවා. පළවෙනි කාරණාව තමයි, අපි පොළ භූමියේ වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවීම සිදු කරා. ඒකට ටෙන්ඩර්කරුවන් අට දෙනෙක් ඉදිරිපත් වුණා. අපි පහුගිය මුදල් කමිටුවේදී ඒ ටෙන්ඩර්පත් විවෘත කළා. එතනදී ටෙන්ඩර්කරුවන් අට දෙනෙක් ඉදිරිපත් වෙලා තිබුණා විවිධ මිල ගණන් යටතේ. රුපියල් කෝටි දහයකට ආසන්න ගාණක් තිබුණා අපේ ඇස්තමේන්තුව. කොහොම හරි අවම ලංසුව ඇවිල්ලා තිබුණේ රුපියල් කෝටි හතයි ලක්ෂ හැත්තෑ ගාණක් මට මතක හැටියට. ඒ වැට් එක නැතුව. වැට් එක නැතුව රුපියල් කෝටි හතයි ගාණ තිබුණේ. වැට් එක එකතු වෙන කොට රුපියල් කෝටි අටයි ගාණක් වෙනවා. කොහොම හරි රුපියල් එක්කෝටි දස ලක්ෂයක් වගේ අඩුවෙන් තමයි අවම ලංසුව ඉදිරිපත් වෙලා තිබුණේ. අපිට කියන්න බැහැ මොකක්ද තාක්ෂණ ඇගයීම් කමිටුවේ තීන්දුව කියලා. නමුත් ඔය මට්ටමෙන් තමයි ටෙන්ඩර් ඉදිරිපත් වෙලා තිබුණේ. ඉතිං ඒ පිළිබඳව සඳහන් කරන්න ඕන. ඒකෙ වැඩ ආරම්භ කරන්න අපි සියළු කටයුතු සූදානම් කරලා තියෙන්නේ. ඒකෙ තාක්ෂණ ඇගයීම් කමිටුවේ තීන්දුව ආවම අපි ඒකට කමිටුව විසින් තීන්දු කරලා ඒ වැඩ ආරම්භ කරන්න ලේස්ති කරලා තියෙන්නේ. එතනදී අපිට පොඩි ගැටළුවකට මුහුණ දෙන්න සිදු වුණා. ඒක ප්‍රධාන ගැටළුවක්. තැපැල් කන්තෝරුව එතනින් අයින් කරන්න සිදු වෙනවා. ඒකෙදී අපිට මේ ගොඩනැගිල්ලේ තව කොටසක් ඉතුරු වෙලා තියෙනවා. අපි බලාපොරොත්තු වෙනවා එතන ඒ කටයුත්ත ඉටු කරන්න තාවකාලික මට්ටමෙන් වෙනත් තැනක් හොයා ගන්නකම්. ඒක ඉදිකරලා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා.

දෙවෙනි කාරණය තමයි ආදාහනාගාරය පිළිබඳ කාරණය. ගිය සභාවේදී අන්තිමට ඒකට තීන්දු කරේ නැවත ටෙන්ඩර් කරන්න කියලා. ඒ තීන්දුව ඒකමතික තීන්දුවක්. ඒ තීන්දුව තුළ අපි දැනට ටෙන්ඩර් දැන්වීම පුවත්පත්වල පළ කරලා තියෙනවා. ලබන 29 වෙනිදාට ඒ කාලය සම්පූර්ණ වෙනවා. අපි ඒ ටෙන්ඩරය 29 වෙනිදාට විවෘත කරන්න බලාපොරොත්තු වෙනවා ටෙන්ඩර් මණ්ඩලය කැඳවලා.

තුන්වෙනි කටයුත්ත තමයි කොවිඩ් 19 එන්නත්කරණය පිළිබඳව. ඒක ගැනත් සඳහන් කරන්න ඕන. අපේ සභාවේ සියළුම නිලධාරීන්ගෙන් කැමති අයට කොවිඩ් 19 එන්නත්කරණය සිදු කරා. ඒක බලෙන් කරන්න බැහැ. කැමති අයට කොවිඩ් 19 එන්නත්කරණය සිදු කරා. දෙන්නෙක් හෝ තුන් දෙනෙක් තමයි ඒකට අකමැති වුණේ. අනෙක් සියළුදෙනාටම මේ වන විට කොවිඩ් 19 එන්නත්කරණ කටයුතු අවසන් කරලා තියෙනවා. ඒ වගේම බෝපෙ පෝද්දල බල ප්‍රදේශය ගත්තම පැලවත්ත, කලේගාන උතුර, කලේගාන දකුණ, මාම්පිටිය කියන ග්‍රාම නිලධාරි වසම් ඇරෙන්න අනෙකුත් සියළුම ග්‍රාම නිලධාරි වසම් වල අයගෙන් වයස අවුරුදු 60 ට වැඩි අයට කොවිඩ් 19 එන්නත්කරණය කරලා අවසන් වුණා. බ්‍රහස්පතින්දා දිනයේදී කොවිඩ් 19 එන්නත් තව 5000 ක් එනවා. සෙනසුරාදා දිනයේදී එස්.ඕ.එස්. ළමා ගම්මානයේදී අර ග්‍රාම නිලධාරි වසම් වල වයස අවුරුදු 60 ට වැඩි අයට ප්‍රමුඛතාවය ලබා දීලා ඒ කොවිඩ් 19 එන්නත්කරණ කටයුතු අවසන්

කරනවා. එදාම නැවත අපි ආරම්භ කරනවා වයස අවුරුදු 30 - 60 ත් අතර අයගේ කොවිඩ් 19 එන්නත්කරණ කටයුතු. ඒක අර මට්ටමින් සිදු වෙන්නේ නැහැ. මධ්‍යස්ථාන තුනක් වගේ තමයි යොදන්නේ. උදාහරණයක් විදියට හපුගල පන්සල, ගොඩකන්ද විද්‍යාලය ඔය තැන් දෙක තමයි දනට තීන්දු කර ගෙන තියෙන්නේ. ඒකෙදී ටෝකන් එකක් ලබා දෙනවා. හැඳුනුම්පත පෙන්වලා ග්‍රාම නිලධාරීගෙන් ඒ ටෝකන් එක අරගන්න ඕන. වයස අවුරුදු 30 - 60 අතර අයට කොවිඩ් 19 එන්නත්කරණය කරන්න බලාපොරොත්තු වෙනවා. එන්නත් 5000 ක් බ්‍රහස්පතින්දාට එනවා. ආයේමත් තව එන්නත් 5000 ක් සඳුදා වෙන කොට එනවා. අර එන්නත් 5000 සඳුදා වෙන කොට ඉවර වෙන්න ඕන ඉතුරු එන්නත් 5000 පටන් ගන්න. ඉතිං ඒක හින්දා බලාපොරොත්තු වෙනවා ඉදිරි සතිය තුළ බෝපෙ පෝද්දල වයස අවුරුදු 30 ට වැඩි සියළුදෙනාටම කොවිඩ් 19 එන්නත්කරණ කටයුතු සිදු කරලා ඉවර කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ៖-** වසමෙන් පිට අයටත් එන්නත් ලබා දෙනවාද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** වසම කියන්නේ බෝපෙ පෝද්දල බල ප්‍රදේශය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ៖-** ගරු සභාපතිතුමනි, මේ එන්නත්කරණ කටයුතු වලට සභාවෙන් පොඩ්ඩක් මැදිහත් වෙන්න. නරාවල, වලවත්ත, පන්විල, මගදෙණිය කියන ග්‍රාම නිලධාරි වසම් හතරේ පහුගිය දිනවල කොවිඩ් 19 එන්නත්කරණ කටයුතු සිදු කරා වයස අවුරුදු 60 ට වැඩි අයට. අවාසනාවන්ත ලෙස මරණයකුත් සිදු වුණා දරා ගැනීමට නොහැකිවීම හේතුවෙන්. කොවිඩ් 19 එන්නත ලබා ගන්න බැරිවීම නිසා මැණියන් කෙනෙක් කම්පනයට පත් වෙලා මිය ගියා නහරයක් පිපිරීම හේතුවෙන්. ඒ කියන්නේ එන්නත් 500 යි අරගෙන ඇවිල්ලා තිබුණේ. සෙනග 700 ක් විතර ඇවිල්ලා තිබුණා එන්නත ලබා ගන්න. ඒ මදිවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයෙන් ඇගළුම් කර්මාන්ත ශාලාවල වැඩ කරන අයට, පිට ආයතන වල වැඩ කරන අයට එන්නත්කරණය කිරීමත් මේ එන්නත් 500 න්ම සිදු කරා. වසමේ ඉන්න වයස අවුරුදු 60 ට වැඩි අයට මේ නිසා එන්නත ලබා දෙන්න නොහැකි වුණා. ඉතිං ඒක නිසා ලොකු ගැටළුවක් මතු වුණා. මිනිස්සු උදේ පාන්දර නැගිටලා නාලා කියලා එනවා එන්නත ලබා ගෙන යන්න. වෙලාවල් ලබා දීලා තිබුණා. ඒ අවශ්‍ය වෙලාවට ඒ අය ටෝකන් එකත් අරගෙන ආවා. හැබැයි එන්නත ලබා ගන්න බැරි වුණා. ඉතිං ඒක නිසා අවාසනාවන්ත ලෙස මරණයකුත් සිදු වුණා. ඉතිං මේ නිසා ඒ ගැටළු වළක්වා ගන්න සභාවෙන් පොඩි හෝ මැදිහත්වීමක් කරලා මේකට අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් මම ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

(ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** අපි බලාපොරොත්තු වෙනවා චනක මන්ත්‍රීතුමා ඉරිදා දිනයේදී නරාවල සුදර්ශනාරාම පන්සලේදී කොවිඩ් 19 එන්නත් ලබා දෙන්න. එදා දිනයේදී එන්නත ලබා ගන්න බැරි වුණ අයටයි, වයස අවරුදු 30 ට වැඩි අයටයි එන්නත් ලබා දෙනවා නරාවල තැනකදී. මේ එන්නත් ටික සෙනසුරාදා සහ ඉරිදා කියන දවස් දෙක ඇතුළත ලබා දෙන්න ඕන. එන්නත් 5000 ක් ලබා දෙනවා කියන එක ලේසිත් නැහැ. ඒක ලේසි පහසු කටයුත්තක් නෙමෙයි. එන්නත් 5000 ක් දවස් දෙකකින් ඉවර කරන්න ඕන. ඒකට අපි බලාපොරොත්තු වෙන්නේ නරාවල තැනකදී ඒ එන්නත් ලබා නොගනිපු අයටයි, වයස අවුරුදු 30 ට වැඩි අයටයි කොවිඩ් 19 එන්නත්කරණය කරන්න. ගොඩකන්දට තව කොටසක් දාලා වයස අවුරුදු 30 ට වැඩි සියළුදෙනාටම කොවිඩ් 19 එන්නත්කරණ කටයුතු සිදු කරලා අවසන් කරන්න බලාපොරොත්තුවක් තියෙනවා. කොහොමත් එන සතිය තුළ බලාපොරොත්තු වෙනවා බෝපෙ පෝද්දල වයස අවුරුදු 30 ට වැඩි අයගේ කොවිඩ් 19 එන්නත්කරණ කටයුතු අවසන් කරන්න. ඊට පස්සේ අපි වයස අවුරුදු 18 - 30 අතරේ අයට එන්නත් ලබා දෙනවා. ඒ කටයුතු දනට සිදු වෙනවා. මම හිතන්නේ දනට කොහොම වුණත්, මොන ප්‍රශ්න තිබුණත්, මොන දේ තිබුණත් අනිත් ඒවායේ වගේ ආරවුල් නැතුව බෝපෙ පෝද්දල සමස්ථයක් වශයෙන් අපි ගොඩක් දුරට පිළිවෙලකට ඒ කටයුතු කරා. සමහර තැන්වල ප්‍රශ්න ඇති නොවුණාම නෙමෙයි. සමහර ප්‍රශ්න ඇති කරපු තැනුත් තිබුණා. ඒ මන්ත්‍රීවරු නෙමෙයි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ වැඩ කරන නිලධාරීන් කිහිප දෙනෙක්. ඉතිං ඒක තුළ ප්‍රශ්න ඇති වෙච්ච තැනුත් තිබුණා. නමුත් සමස්ථයක් වශයෙන් ගත්තම අනිත් තැන්වලට වැඩිය සාර්ථකව බෝපෙ පෝද්දල ඒ කටයුත්ත සිදු වුණා. අක්මීමන ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ දනට ග්‍රාම නිලධාරි වසම් පහක විතරයි වයස අවුරුදු 60 ට වැඩි අයට එන්නත්කරණය සිදු කරලා තියෙන්නේ. ඉතිං ඒක තුළ අපි විශාල ජයග්‍රහණයක් ලබා ගෙන තියෙනවා. ගාල්ල බලප්‍රදේශයේ තිබුණ ප්‍රශ්නය ගැන ඔබතුමන්ලා දන්නවා. ටෝකන් ලබා දීලා, ඒවා අවභාවිතා වෙලා ගැටළු ගණනාවකටම මුහුණ දුන්නා. නමුත් යම් කිසි පිළිවෙලකට ඒ වැඩේ අපිට හැකි විදියට කරා. වෙලාව විනාඩි දහයෙන් දහයට වෙන්කරලා අපි ඒක හැකි පමණ කරා. නමුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන්ට තියෙන අවිවේකි බව තුළ ඒ අය වයස අවුරුදු 30 ට වැඩි අය ගැන වැඩිය බලන්නේ නැහැ. ඒ නිලධාරීන් ඒකට සම්බන්ධ කරන්නම්. ඒ සම්බන්ධීකරණ වැඩ කටයුතු, ඒක සංවිධානය කිරීමේ කටයුතු, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විදියට මට මැදිහත් වෙලා කරන්න කියලා ඉල්ලීමක් තියෙනවා. ඉතිං ඒක තුළ අපිට මන්ත්‍රීවරු විදියට තමන්ගේ කොට්ඨාශවල පක්ෂ භේදයක් ඕන නැහැ. ටෝකන් දෙන කොට සමස්ථ මන්ත්‍රීවරුන්ටම තමන්ගේ කොට්ඨාශවල එක ක්‍රමයකට ලබා දෙන්න කතා කර

ගමු. ඉතිං ඒක තුළ ඒ සහයෝගය ලබා දෙන්න කියන එක සියළුම මන්ත්‍රීතුමන්ලාගෙන් සහ මන්ත්‍රීතුමියන්ලාගෙන් මේ වෙලාවේදී ඉල්ලා සිටිනවා.

සභාවේ රාජකාරි කටයුතු අපි පහුගිය සඳුදා දිනයේ ඉඳලා සාමාන්‍ය පරිදි ඉටු කරනවා. අපිට පහුගිය මාස දෙකක කාලයක් තුළ සෑහෙන්න අඩුපාඩුකම් සිදු වුණා. මොකද, නිලධාරීන් 50% යි කැඳවන්න කියලා කිව්වේ. ඉතිං මේක තුළ නොයෙකුත් අපහසුතාවයන්ට මුහුණ දෙන්න අපිට සිදු වුණා. නමුත් අපි සඳුදා ඉඳගෙන නැවත සුපුරුදු පරිදි මහජනතාව වෙනුවෙන් ඒ කරන්න පුළුවන් වැඩ කොටස කරන්න කටයුතු ආරම්භ කරලා තියෙන්නේ. ඒක ගැන මේ අවස්ථාවේදී සියළුම මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලාව දැනුවත් කරන්න ඕන.

**(ඈ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම ඃ- නැත**

**(ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඃ- නැත**

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** කලේගාන පොල භූමියේ ඇති කඩ කාමර ඉවත් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපේ සභාවේ ජේ.සී.බී. යන්ත්‍රය සහ කම්කරුවන් යොදාගෙන ඒක කඩන්න ඉන්නේ. අපි මේ වර්ෂයේදී ඒ කඩකාමර වලින් මුදල් අය කරේ නැහැ. මේක අනිවාර්යයෙන්ම ඉවත් වෙන බව අපි දන්න හින්දා මුදල් අය කරේ නැහැ මේ වර්ෂයේ මුල ඉඳන්.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** ගම සමඟ පිළිසඳරක් වැඩසටහන යටතේ ඇස්තමේන්තු සකස්කර ඇති ව්‍යාපෘති (ඇමිණුම් 01 හා ඇමිණුම් 02) අනුමත කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒකෙදී සමහර කොට්ඨාශ කෙරෙහි කිසිම අවධානයක් යොමු කරලා නැහැ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේකට කොහොමද යෝජනා ඇවිල්ලා තියෙන්නේ. කරාපිටියෙන් එහාට යෝජනා මුකුත්ම නැහැ මේකෙ. හපුගල, කුරුඳුවත්ත කොට්ඨාශ ටිකේ යෝජනා ටිකක් විතරයි තියෙන්නේ. ඒක ගැන පැහැදිලි නැහැ. ඒ නිසා මේ ගැන පැහැදිලි කිරීමක් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇත්තටම මෙහෙමයි. අපි කිලෝ මීටර් 40 ක් කියලා නිකං යෝජනාවක් ඉදිරිපත් කරා. එහෙන් යෝජනා ඉල්ලපු වෙලාවේදී අපි ඒකට ඉල්ලීමක් කරා. දැනට අපි මේක යැව්වට 100% ක් දෙන්න බැරි වෙයි කියන කතාව තමයි කියන්නේ. ඉක්මනට යෝජනා ටික එවන්න කිව්වා. අපි මේකෙදී කාණු පද්ධතියට වඩා බලාපොරොත්තු වුණේ අනිත් යෝජනා ටික කර ගන්න බලන්න. ඒකෙදී උදාහරණයක් වශයෙන් කිව්වොත් සභාව ඉදිරිපස තාප්පය, ජනසභා ගොඩනැගිල්ලේ වැසිකිළි පද්ධතිය, ඊට පස්සේ හපුගල, මොල්ලිගොඩ වත්තේ අපේ සභාව සතු ඉඩමේ සභාවේ වාහන ටික ගාල් කරන්න ස්ථානයක්, සභා ගොඩනැගිල්ල ගන්න පුළුවන්. සභා ගොඩනැගිල්ල ඉදිකරන්න සාමාන්‍යයෙන් කෝටි දහඅටක් විතර යනවා. ඇත්තටම අපි හිතන්නේ නැහැ එච්චර මුදලක් ලැබේවි කියලා. ඊට අමතරව තමයි අපි කාණු පද්ධති සඳහා මෙච්චරයි කියලා දැම්මේ. ඒ හින්දා අපි ඉක්මනින් මෙහේ තිබුණ යෝජනා ටිකයි, හදන්න පුළුවන් ඇස්තමේන්තු ටිකයි හදලා දැම්මේ. 100% ක් බලාපොරොත්තුවක් නැහැ කාණු පද්ධතිවල යෝජනා සම්මත වේවි කියලා. ඒ ගැන බලාපොරොත්තුවක් නැහැ. දැනට මෙහෙමයි. දැනට මන්ත්‍රීවරුන්ගේ කොට්ඨාශවල කාණුවලට ඇස්තමේන්තු හදලා තියෙනවා නම් ඒවා දාන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් මේ ප්‍රදේශයේ ඉන්න චමින්ද මන්ත්‍රීතුමා කාණු පද්ධතිය ලබා ගන්න වැඩ කරේම නැද්ද, මේකෙ නැහැනේ පෝද්දල කිසිම දෙයක්.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** අවශ්‍යතාවය තියෙනවා. මේක මොන විදියටද කරලා තියෙන්නේ, මොන ප්‍රදේශ වලටද වෙන් කරලා තියෙන්නේ කියලා දන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේකෙ වෙන් කරලා තියෙනවානේ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** දැනට වෙන්කරලා තියෙන්නේ මේ ටිකට විතරයි. පෝද්දල, නරාවල, උළුවිටිකේ කොට්ඨාශ වලට මේක නැත්තේ ඇයිද කියන එක ප්‍රශ්නයක්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** උළුවිටිකේ ඒවා තියෙනවානේ. හිරිඹුරගම, තුන්හිරිපාන, ජස්ටින්කන්දේ ඒවා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකෙදී ඇත්තටම වුණේ මේකයි. මේක කෙරෙයි, නොකෙරෙයි කියන මේවා එක උඩ දාපු එකක්.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** සභාපතිතුමනි, කාසල්වත්තේ ඔබතුමාම ගිහිල්ලා බලපු කාණු තියෙනවා. ඒ වගේම තමයි අපි මේකෙ යෝජනා කරලා ඇස්තමේන්තු හදපු ඒවා තියෙනවා. අපි යෝජනා කරපු දේවල් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා මේක මෙහෙමයි. ඔබතුමා දන්නවානේ තාක්ෂණ නිලධාරි ප්‍රශ්නයක් තිබුණා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඔබතුමා කියපු විදියට මේ තිබුණ යෝජනා ගත්තා නම් හරිනේ. අපේ යෝජනා වලට හදපු ඇස්තමේන්තුත් තියෙනවා. අපිට කිව්වා නම් ඒවා අරගෙන දෙනවා. සභාවේ තියෙනවා අපි කරපු සමහර යෝජනා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා, මට 1000% ක් විශ්වාසයි මේ ටික එන්නේ නැහැ.

(ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමා, මේක එන්නේ නැහැ කියන එක මමත් පිළිගන්නවා. හැබැයි පරක්කු වැඩි හින්දා තමයි එන්නේ නැත්තේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොම හරි මේක එන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එහෙමනම් මේක දාලා වැඩකුත් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම පළාත් පාලන අමාත්‍යාංශයේ සහකාර ලේකම්තුමාට කතා කරා. ඒ කතා කරේ දැන් මාස එකහමාරකට විතර කලින්. ඊට පස්සේ අපිට ෆැක්ස් කිහිපයක් ආවා මේක එවන්නේ නැද්ද කියලා අහලා. එතකොට තමයි මෙහේ තිබුණ ටික අවසානයේදී යැව්වේ. ඒ මුල් මාස එකහමාරට කලිනුත් කිව්වා අනිත් යෝජනා ටිකට අපි උත්සාහ දරන්නම්, කාණු පද්ධතිය පිළිබඳව විශ්වාසයක් නැහැ කියලා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු මන්ත්‍රීතුමන්ලා සියළුදෙනාගෙන් අවසරයි. මම මේ අවස්ථාවේදී තරයේ විරුද්ධ වෙනවා මේක එන්නේ නැහැ කියනවා නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එන්නේ නැහැ කියන එක නෙමෙයි, මට විශ්වාසයක් නැහැ කියලා කිව්වේ. මම ඒක ගැන කියන්න එපැයි ඉතිං.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මම මේක මුලින්ම පටන් ගත්තේ එතනින්. මම දන්නේ නැහැ අනිත් මන්ත්‍රීවරුන්ට මේක නොලැබුණා කියලා. මම දවස් තුනක් ගිහින් කාණු මැන්නා අපේ තාක්ෂණ නිලධාරිතුමා එක්ක. අපි ඒවා මැනලා ගමේ මිනිස්සුන්ට මේවා හදනවා කියලා පොරොන්දු වෙලා ඇවිල්ලා තියෙනවා. ඒ නිසා පළාත් පාලන අමාත්‍යාංශයෙන් මේකට මෙහෙම කියනවා නම් ඒක මොන තරම් නින්දිත වැඩක්ද, මිනිස්සුන්ට බලාපොරොත්තු දීලා මිනිස්සුන්ගේ කාණු හදලා දෙන්නම් කියලා කිව්වා. සමහර මිනිස්සු මෙතනට ඇවිල්ලා හඬා වැටුණා. අපේ තාක්ෂණ නිලධාරිතුමන් ඒක දන්නවා ඇති. මෙතනට ඇවිත් කිව්වා ගෙවල් යට වෙනවා කියලා. ඉතිං අපිට ඒ බලාපොරොත්තුව දීපු හින්දා තමයි, අපිට මේක කියපු හින්දා තමයි අවධානය යොමු කරලා මේක කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කතාව වැරදියි. මොකද මම කිසි කෙනෙකුට මේක ගැන කිව්වද, මම කිසි කෙනෙකුට කිව්වේ නැහැ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** සභාපතිතුමා එහෙම බැලුවම ඔබතුමා සම්පූර්ණයෙන්ම වැරදියි. එහෙමනම් කියන්න තිබුණානේ අනිත් මන්ත්‍රීවරුන්ටත්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සුගත් මන්ත්‍රීතුමා නිලධාරීන්ගෙන් අහන්න මේ එක කාණුවක්වත් මනින්න මම ගියාද කියලා. එක කොට්ඨාශයකවත් කාණු මනින්න කියලා මම මන්ත්‍රීවරුන්ට කිවුවේ නැහැ. නමුත් එහෙම කියන්න එපා. අපි ගිය සභාවට කලින් සභාවේදී ඔක්කොටම මේක ගැන කියලා තියෙනවා, අපි මේ යෝජනාව යැවුවා කියලා. මේ යෝජනා ටික යැවුවා කියලා සභාවේදී කියලා තියෙනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** සභාවට එන මුදල් ටික වියදම් කරන්න සභාපතිතුමා මහන්සි වෙන්නේ නැහැ. ඒක තමයි මෙතනදී වෙලා තියෙන්නේ. සභාවට එන මුදල් ටික අරගෙන ඒකෙන් වැඩ කරන්න ඔබතුමා අවධානය යොමු කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා මම දැනට ගිය සතිය ඇතුළත දවස් තුනක් කොළඹ ගිහිල්ලා තියෙනවා සභා ගොඩනැගිල්ලට රුපියල් කෝටි දහඅටක් ලබා ගන්න. ඔබතුමන්ලා එහෙම කතා කරන්න එපා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** සභාපතිතුමා කලේගානේ සභා ගොඩනැගිල්ල හදනවා. තාප්පය හදනවා. හැබැයි අපේ කොට්ඨාශවල තියෙන වැඩත් කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සුගත් මන්ත්‍රීතුමා මම ඔබතුමාට කිවුවාද ගිහිල්ලා කොට්ඨාශයේ කාණු මනින්න කියලා. ඒක මම කිවුවාද කියලා කියන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒක කවුරුවත් කියන්න ඕන නැහැ. අපි දැන ගන්න ඕන වැඩ කර ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි ඉතිං. මේවා නොකෙරුණොත් මම මොනවා කරන්නද, මේවා සභාවෙන් කරන දේවල්ද.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඇයි අනිත් මන්ත්‍රීවරු මේ අසාධාරණයට විරුද්ධව කතා කරන්නේ නැත්තේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද අසාධාරණය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** තමන්ට එන වැඩ ටික තමන් කරන්නේ නැත්නම් මොකක්ද කරන්නේ. මේක ගැන කියන්න අනිත් මන්ත්‍රීවරුත්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකට ඇස්තමේන්තු යවලා තියෙනවානේ. ඔබතුමාගේ ඇස්තමේන්තු නොයවා තියෙනවාද.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මගේ ඇස්තමේන්තු තියෙනවා. මම මේ වැරැද්ද ගැන කතා කරන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මේකෙ වැරැද්දක් සිදු වෙලා තියෙනවා කියන එක පිළිගන්න. මොකද ඇත්තටම හේතුව අනිත් මන්ත්‍රීවරුන්ගේ ඒවා නොකෙරුණා හරි, ඔබතුමා කියන විදියටම නොකෙරුණා හරි ඒවත් යවන්න තිබුණා. අපිට මේකෙ වගකීමක් නැහැ කියලා එකක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා ඒක නෙමෙයිනේ වුණේ. මම සභාවාර දෙකකදී මේක ගැන කිවුවා. අහගෙන ඉඳපු කට්ටියට ඒක මතක ඇති. කාණු කිලෝ මීටර් මෙච්චර ගාණක් යවලා තියෙනවා කියලා මම කිවුවා. මන්ත්‍රීවරු දැන ගන්න ඕන තමන්ගේ කොට්ඨාශවල ඒවා මැනගෙන ඒක ලබා දෙන්න. ඒක තමන් කරන්න ඕන කාරණාවක්නේ. මමත් කරේ නැහැ. ඒ ලැයිස්තුවේ මගේ කොට්ඨාශයේ කාණු තියෙනවාද කියලා බලන්නකෝ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මෙහෙට එන මුදල් වලින් වැඩ ගන්න දන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක ප්‍රායෝගිකව හිතලා බලන්න ඕන කාරණයක්. රුපියල් කෝටි දහඅටක් සභා ගොඩනැගිල්ලට, තව රුපියල් කෝටියක් විතර සභාව ඉස්සරහ තාප්පයට, අනිත් යෝජනා වලටත් රුපියල් කෝටි තිහක් විතර ඕන වෙනවා. ඒ කාණු වලට ඇරෙන්න. මෙච්චර ප්‍රමාණයක් මුදල් එවනවාද, මේක තේරුම් ගන්න ඕන කාරණාවක්. අපි යෝජනා යවන එක වෙනම දෙයක්. අපෙන් යෝජනා ඉල්ලුවම ඒවා යවන එක වෙනම දෙයක්.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** සභාපතිතුමා යෝජනා යවන එක වෙනම දෙයක් තමයි. හැබැයි අපේ කොට්ඨාශවලත් වැඩ කෙරෙන්න ඕන. එක කොට්ඨාශයක විතරක් කෝටි ගාණක වැඩ කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කෝටි ගාණක වැඩ කරපු කොට්ඨාශය කොහෙද තියෙන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේවාට අපි විරුද්ධයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මාර කතාවක් මෙතුමා කියන්නේ. සභාවේ තාප්පය හදන එක කොට්ඨාශයේ වැඩක්ද, ඔබතුමන්ලා ඉන්නේ මහ අමුතු තැනකනේ. තාප්පය හදන එක කොට්ඨාශයේ වැඩක් වෙන්නේ කොහොමද.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** රුපියල් ලක්ෂ හැත්තෑවක්, රුපියල් ලක්ෂ අසූවක් වියදම් කරලා සභාවේ තාප්පය හදන එක කොට්ඨාශයේ වැඩක් වෙන්නේ කොහොමද, ඒක මාර කතාවක්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා විනාඩියක් ඇහුම්කන් දෙන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඕනනම් මම කියන්නම් මේවාට හරි උත්තර.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි කියන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා මේකයි තියෙන්නේ. අපිට මේක පේනවා. අපිට විරුද්ධ පක්ෂය විදියට ප්‍රතිපාදනයන් ලබා දෙන්නෙත් නැහැ. ඔබතුමන්ලා කවුරු හරි කිවුවොත් ගිහිල්ලා වැඩ කරනවා. මම බලාගෙන ඉන්නවා. අපේ පැතිවල වාසනා මන්ත්‍රීතුමිය හරි, ලියනගේ මන්ත්‍රීතුමා හරි, චමින්ද මන්ත්‍රීතුමා හරි වැඩ කරනවා. ඒකට අපි විරුද්ධ නැහැ. අපි කියන්නේ ඒවා කරන්න. මේ ලයිට් දාන්න කියලා අපිත් කියනවා. ඒවා කරන්න. නමුත් එක වැරැද්දක් බොහොම පැහැදිලිව වෙලා තියෙනවා. ඒ තමයි ඇත්තටම ඔබතුමාට යුතුකමක් තියෙනවා. මේක ආවම මේ හැම කෙනෙකුටම කියන්න වහාම යෝජනා ගේන්න කියලා. හැබැයි ඒවා නොගෙනාවා නම් ඒක වාසනා මන්ත්‍රීතුමියගේ, චමින්ද මන්ත්‍රීතුමාගේ, ලියනගේ මන්ත්‍රීතුමාගේ වැරැද්දක්. ඇත්තටම සභාපතිතුමා මේ දේ කළ යුතුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා මොනවද අබේසේකර මන්ත්‍රීතුමා මේක ගැන දන්නේ. මන්ත්‍රීවරු එකොළොස් දෙනෙක්ගේ යෝජනා මම කොළඹ අරගෙන ගිහිල්ලා අනුමත කර ගෙන ආවේ. ඔබතුමා මොනවද මේ කියන්නේ. සියළු මන්ත්‍රීවරුන්ගේ යෝජනා කොළඹ මාර්ග සංවර්ධන අධිකාරියට අරගෙන ගිහිල්ලා මම අනුමත කර ගෙන ආවේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක ඔබතුමාගේ වගකීම. එහෙම ගිහිල්ලා කරන එක ඔබතුමාගේ වගකීම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි. මට කිවුවේ මේකයි. මට කියපු දේ කියන්න එපැයි. සහකාර ලේකම්තුමා මට කිවුවේ එහෙමයි. ඒක නිසා මම අනිත් ඒවාට උනන්දු වුණේ නැහැ. ඇත්ත කතාව ඒක. අන්තිමට මේවා නොකෙරුණාට පස්සේ මම බැනුම් අහන්නද, ඔබතුමාට මම කිවුවද යෝජනා හදලා යවන්න කියලා. මම ලියනගේ මන්ත්‍රීතුමාට කිවුවද යෝජනා හදලා යවන්න කියලා. ඒ නොකිවුවේ මට විශ්වාසයක් නැති නිසා ඒක ගැන. මම දැනටත් ඒක ගැන කියනවා. හැබැයි මම පොදු වැඩ ටික කර ගන්නවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමා මෙහෙමයි. සියළුදෙනාටම කිවුවා හෝ නොකිවුවා හෝ කතාව නෙමෙයි මම කියන්නේ. මම අහන්නේ ගම සමග පිළිසඳරක් වැඩසටහන තිබුණේ කොයි කාලයේද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මාස හය හතක් වෙනවා ඒක තිබිලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ වෙලාවේදී තමයි ප්‍රාදේශීය සභාවලින් මේ ඉල්ලීම් කරලා තිබුණේ. දැන් මේ මුදල් ඇවිල්ලත් ඉවරයි සමහර ප්‍රාදේශීය සභාවල් වලට. ගාල්ල දිස්ත්‍රික්කයේ අනෙකුත් සියළුම ප්‍රාදේශීය සභාවල් වලට මේක ඇවිල්ලා ඉවරයි. මේක ලැබෙන්නේ නැහැ. ඒ අතරේදී තමයි මට මේක ගැන පිටින් ආරංචි වුණේ. ඒ නිසා මම කාණුවලට ඇස්තමේන්තු තුන හතරක් හැදෙව්වා. ජස්ටින් කන්දේ ප්‍රශ්නය දීර්ඝකාලීන එකක්. ඒක මම ඊට කලිනුත් යැවුවානේ. ජස්ටින් කන්දේ පද්ධතිය හදලා දෙන්න කියලා වෙනම සභා යෝජනාවක් දාලා මම ඒක ජනාධිපතිතුමාට යැවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියන්නේ මේක නෙමෙයි මන්ත්‍රීතුමා. ඒ ගම සමග පිළිසඳරක් වැඩසටහන ගියේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා. මේ ආවේ ඒක නෙමෙයි. මේ ප්‍රාදේශීය සභාව තුළින් කරන්න ඕන වැඩ වලට යෝජනා ආවේ. අපි ඒකට අපේ ප්‍රධාන යෝජනා ටික

ඉදිරිපත් කරා. එතනදී අපිට ප්‍රධාන වෙන්නේ සභා ගොඩනැගිල්ල ඉදිකිරීම, සභාව ඉදිරිපිට තාප්පය ඉදිකිරීම, ඊට පස්සේ අපේ වාහන ටික ගාල් කරන්න මොල්ලිගොඩ වත්තේ වාහන අංගනයක් ඉදිකිරීම. ඒ ඉඩමේ එහා පැත්තේ බැම්ම ඉදිකරලා ඒ වාහන ටික ගාල් කරන්න පුළුවන් විදියට හදන්න ඕන. ජන සභා ගොඩනැගිල්ලේ වැසිකිළි පද්ධතිය ඉදිකරන එක තමයි අනෙක් එක. මේ පොදු කාරණා ටික දාලා නිකමට අපි දැම්මා වෙන දාන්න දෙයක් නැති නිසා මාර්ගවල පැති කාණු සඳහා කිලෝ මීටර් හතළිහක් කියලා. ඊට පස්සේ එහෙන් මේකට ඇස්තමේන්තු ටික හදලා ඉල්ලුවා. ඒවා ඉල්ලද්දීම ඇහුවා මේවාට කීයක් යාවිද කියලා. මම කිවුවා සභා ගොඩනැගිල්ල ඉදිකරන්න රුපියල් කෝටි දහඅටක්, විස්සක් අතර මුදලකුත්, ඊළඟට තාප්පය ඉදිකරන්න රුපියල් ලක්ෂ අසූවක් සියයක් අතර මුදලකුත් යාවි කියලා. කාණු පද්ධතිය ගැන ලොකු උත්සාහයක් දරන්න එපා, අනිත් ටිකට අපි උත්සාහ දරමු කියලා තමයි කිවුවේ. මේ අවුරුද්ද තුළ මේක කරන්න ඕන කියලත් කිවුවා. ඒ නිසා අපි අනිත් ටිකට උත්සාහයක් දරමු කියලා කිවුවා. ඔන්න ඕක තමයි කිවුවේ. මම ඒක හින්දා කිසිම මන්ත්‍රීවරයෙකුට මේක ගැන විශේෂයෙන් කිවුවේ නැහැ. නිලධාරීන්ගෙන් අහන්නකෝ මම එක තැනකවත් ගිහින් කාණු මැනලා නැහැ. එක තැනකටවත් නිලධාරියෙක්ව එක්ක ගෙන ගියේ නැහැ. ඔබතුමන්ලාගෙන් සමහරු ඒක කරන්න ඇති. මම සභාවාර දෙක තුනකදීම කිවුවා මෙන්න මෙහෙම කාණු පද්ධති කෙරේවි, මෙන්න මේක කෙරේවි කියලා. මම දන්නේ නැහැ ඒක. අහගෙන හිටපු අයට ඒක ඇහෙන්න ඇති. ඕන නම් සභා වාර්තා අරගෙන පෙන්වන්නම්. ඉතිං ඒක තුළ දැනටමත් මම කියන්නේ මට 100% ක් විශ්වාස නැහැ කාණු පද්ධති වලට අනුමැතිය ඒවි කියලා. ඒකට මට කරන්න දෙයක් නැහැ. තමුන් නිලධාරීන් එක්ක ගිහිල්ලා ප්‍රචාරය කරලා, මේවා මැනලා ඇවිල්ලා මේක අනිවාර්යයෙන්ම කරලා දෙනවා කියන එකේ වගකීම මට ගන්න බැහැ. මොකද මට ඒක කියන්න බැහැ. ඔබතුමන්ලා මාත් එක්ක කතා කරලාවත් නෙමෙයි ඔය ඇස්තමේන්තු හදලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේකට පළාත් පාලන ආමාත්‍යාංශයෙන් ඉල්ලීම් කරලා ආවාද, පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ආපු නිලධාරීන් තමයි මේක මැන්නේ. මට සඳහනක් කරන්න සභාවෙන් ඒකට ඉල්ලීම් කරාද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි සභාවෙන් ඉල්ලීමක් කරේ නැහැ. ඒ අය අපෙන් ඉල්ලුවා යෝජනා මොනවද කියලා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** අනිත් ප්‍රාදේශීය සභා වලට ලැබෙන්නයි, මෙහෙට නොලැබෙන්නයි හේතුව මොකක්ද.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මේ පිළිබඳව මටත් අදහසක් දක්වන්න තියෙනවා. ගම සමඟ පිළිසඳරක් කියන වැඩසටහන අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් හික්කඩුව ප්‍රදේශයේදී පැවති අවස්ථාවේදී තමයි මෙම යෝජනා කාණු පද්ධතිය පිළිබඳව ඉදිරිපත් වෙලා තියෙන්නේ. එතුමා ගරු ආණ්ඩුකාරතුමාට ප්‍රකාශ කරලා තියෙනවා මෙම කාණු ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත කරලා දකුණු පළාත් සභාවේ අරමුදල් වලින් මෙම කාණු පද්ධති ඉදිකරන්න කටයුතු කරන්න කියලා. ඉතිං මේ පිළිබඳව දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) සුනිල් දහනායක මහතා හමුවෙලා මම අද උදෙත් විමසුවා. ඉතිං මේ කාර්යය දැනට කරන්න තරම් දකුණු පළාත් සභාවේ මුදල් කොහොමටවත් නැහැ කියන බව එතුමා ප්‍රකාශ කරා. මම දන්නේ ඒ පැත්ත. මන්ත්‍රීවරුන්ගෙන් මේ යෝජනා ලබා ගනිපු ආකාරය පිළිබඳව මට දීර්ඝ විස්තරයක් කරන්න දැනුමක් නැහැ. සභාවකදීත් ප්‍රකාශ වුණා කාණු පද්ධති වලට යෝජනා ලබා ගන්නා බව. මම මේක දැන ගත්තම තාක්ෂණ නිලධාරිතුමියට දිගින් දිගටම වද කරලා වගේ එක්ක ගෙන ගිහිල්ලා කාණු කිහිපයක් මැන්නා. ඊළඟට ඊයේ දවසේදී පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් තවත් තාක්ෂණ නිලධාරිතුමියක් ආවා. ඒ කාණු හඳුනාගත්ත ස්ථාන හඳුනාගැනීම සඳහා අපි ගියා ඒ තාක්ෂණ නිලධාරිතුමියත් සමඟ. ඉතිං ඒ ස්ථාන හඳුනාගත්තා. ඉතිං මේ කාණු පද්ධති ගැන ලිස්ට් එක බැලුවම ඇත්තටම මටත් මේක කරන්න බැරි බව තේරුණා. මෙතන එක කාණුවක වියදම රුපියල් ලක්ෂ තිස් හතරයි. තව කාණුවක වියදම රුපියල් ලක්ෂ විසි නමයයි. ඔය ලිස්ට් එකේ ඒ මිල ගණන් සඳහන් වෙලා තියෙනවා. ඉතිං මම ඒ ආපු නිලධාරිතුමියගෙන් ඇහුවා මේවාට මුදල් ඒවිද කියලා. ඒ නිලධාරිතුමියත් මුදල් එන එකක් නැහැ කියන අඩමාන ගතියෙන් තමයි ඉන්නේ. අපිට කියන්න බැහැ මේකට යම් විදියකින් හරි එකපාරටම මුදලක් ඇවිල්ලා ක්‍රියාත්මක වේවිද කියලා. ඒ අදහස කියන්න අමාරුයි. ඉතිං ඒක තමයි මේකට තියෙන තත්ත්වය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු. මම ගැන මේ කතා කරන්නේ. මම මේ රජයට ඡන්දය ලබා දෙන්න කියලා ප්‍රාදේශීය සභා මැතිවරණයට වැඩ කරා. ඊට කලින් ඉඳන් මේ පක්ෂයේ හිටියා. ජනාධිපතිවරණය, මහ මැතිවරණය වෙනුවෙන් අපි මිනිස්සු ගාවට ගිහිල්ලා ඡන්දය ඉල්ලුවා. එම නිසා රජය විසින් අද මේ කාණු පද්ධති ගැන යෝජනා කරලා තියෙනවා කියලා මට පේනවා. ඒක නිසා තමයි ප්‍රාදේශීය සභාවේ නිලධාරීන් අපිත් සමඟ ගිහිල්ලා මැනුම් කටයුතු සිදු කරේ. එම නිසා මම පැහැදිලිව ඉල්ලා සිටිනවා. ගරු ජනාධිපතිතුමා හෝ මේ රජයේ කවුරුහරි

හෝ එම ඉල්ලීම අපෙන් කරලා තියෙන විදියට අපි ඒ අවස්ථාව දීලා තියෙනවා. අපි මැනුම් කටයුතු සිදු කරලා තියෙනවා. අපිට මේ මුදල් වහාම එවන්න කියලා අපි ඉල්ලීමක් කරනවා. අපිට නැත්නම් ඉදිරි මැතිවරණයකදී සභාවක් විදියට ඉදිරියට යන්න බැරි තත්ත්වයක් ඇති වෙනවා. නැත්නම් මේ යෝජනා ගේන්න එපා කියන්න පැත්ත පළාතකවත් අපිට ඇහෙන්න. අපිට මේවා ඇහිච්ච ගමන් අපි වැඩ කරන මන්ත්‍රීවරු විදියට කොහේ හරි ගිහිල්ලා වැඩක් කරන්න ඕන අපේ කොට්ඨාශයට. ඒක තමයි ඇත්ත කතාව. නැත්නම් මේ දේශපාලනය කරලා ඇති වැඩකුත් නැහැ.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය :-** ගරු සභාපතිතුමනි, මටත් මේ සම්බන්ධව දෙයක් කියන්න තියෙනවා. හැම තිස්සෙම මේ කතා කරන දේවල් වලට අපි කතා කරන්නේ නැහැ. නමුත් හැම තිස්සෙම අපිට ආසාධාරණයක් වෙනවා කියලා අපි හොඳටම දන්නවා. හැබැයි මේකට මටත් ඇඟිල්ල දික් කරන්න වෙනවා. ගිය අවුරුද්දේ මගේ සභා ප්‍රතිපාදන ඉතුරු වෙලා තිබුණා. මම වැඩ කරේ නැති නිසා ප්‍රතිපාදන ඉතුරු වෙලා තිබුණා. මගේ සභා ප්‍රතිපාදන වලින් කොරෝනා දවස්වල වැඩ ටික කරන්න කාණු මනින කොට අපේ මන්ත්‍රීවරයෙක් කෝල් කරලා ඇමතිතුමාට කිවුවලු අන්න ලබුදූවේ කාණු මනිනවා කියලා. මගේ සභා ප්‍රතිපාදන වලින් වැඩ කරන්නයි මම කාණු මැන්නේ. එතකොට අපි මේවාට මොනවද දෙන උත්තර. සභාවේ ඉතුරු වෙලා තියෙන මගේ ප්‍රතිපාදන වලින් මට වැඩක් කරන්න බැහැ. මම ඒකට අවසර ගන්න ඕන. දැන් මේවාටත් අපිට නිහඬව ඉන්න බැහැ. නමුත් අපි නිහඬව ඉන්නවා. මේ වගේ බලු වැඩ කරන කොට අපිට නිහඬව ඉන්න බැහැනේ. මම තාමත් ඒ වැඩේ කරේ නැහැ. ඒක ඕන කෙනෙකුට බලන්න පුළුවන්. කාංචනා මන්ත්‍රීතුමියට වැඩිපුර ලබා දුන්නා කියාවිනේ. ඒක නිසා තමයි මගේ සභා ප්‍රතිපාදන ඉතුරු වෙලා තියෙන්නේ. එතකොට මේවාට අපිට නිහඬව ඉන්න බැහැනේ. මමත් දැන් මෙච්චර වෙලා මේක ගැන අහගෙන හිටියා. මගේ ප්‍රතිපාදන වලින් වැඩක් කරන්න මට අයිතියක් නැත්නම් වැඩක් නැහැ. මම අනිත් මන්ත්‍රීවරුන්ගෙන් අවසර ලබා ගන්න ඕන නැහැ. මගේ සහෝදර මන්ත්‍රීවරු ඔක්කොම මේ ඉන්නේ. අපිට මේවා කතා කරලා විසඳ ගන්න පුළුවන්. ඇමතිතුමාට කතා කරලා කාණු මනිනවලු. දැන් මේවා නෙමෙයි මැනලා තියෙන්නේ එතකොට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මේ කාණු පද්ධතිය පිළිබඳව නැවත කොච්චර කතා කරත් වැඩක් නැහැ. චන්ද්‍රකුමාර මන්ත්‍රීතුමා උදාහරණයක් කිවුවා. ඔබතුමන්ලා හිතන්න එක කාණුවකට වැය වන මුදල රුපියල් ලක්ෂ විසි අටක්, තිහක් නම් කිලෝ මීටර් හතළිහක් කාණු හදන්න මුළු ලංකාවටම ලබා දෙන මුදල දුන්නත් මදි. ඒක ප්‍රායෝගික වෙන්න ඕන. අපි ඒක යැවුවේ සභාවට ප්‍රතිපාදන ටිකක් හරි ලැබේවි කියන බලාපොරොත්තුව අනුව. අනිත් එක තමයි තව ගැටළුවකට අපි මුහුණ දුන්නා. ඒ පිළිබඳවත් කියන්න ඕන. මෙතන අඩුපාඩුවක් සිද්ධ වුණා නම් ඒක වුණේ මගෙන් නෙමෙයි. විශේෂයෙන්ම මේ තාක්ෂණ නිලධාරීන් දෙන්නව මේ ටිකේදී මන්ත්‍රීවරු එක්ක ගිහිල්ලා ඒ වැඩේ කෙරුණා. නැති කෙනෙකුට චෝදනා එල්ල කිරීම නෙමෙයි මේ කරන්නේ. හිටපු තාක්ෂණ නිලධාරිතුමාට සම්බන්ධකම් තිබුණෙත් නැහැ. ප්‍රශ්න ගණනාවකුත් ඇති කරගෙනත් තිබුණා. ඒ වගේම ස්ථාන මාරු යනවා කියන මානසිකත්වයෙන් තමයි හිටියේ. මම වැරැද්දකට කියනවා නෙමෙයි. එතුමා ස්ථාන මාරු යන්න හිටියේ. ජුනි පළවෙනිදා ඉඳන් ස්ථාන මාරු ක්‍රියාත්මක වෙන්න තිබුණේ. මේ නිලධාරීන් නිරෝධායනයට ප්‍රාදේශීය සභාව වහපු දවස් වල පවා ඇවිල්ලා මේ ඇස්තමේන්තු හැදුවා. මෙතන සභා ගොඩනැගිල්ල, අතන වැසිකිළි පද්ධතිය, තාප්පය, වාහන නැවතුම්පොළ, මන්ත්‍රීවරු කියපු කාණු වලට ඇස්තමේන්තු හදන්න වැඩ කරා. නමුත් අර නිලධාරියා ඒ කාලය තුළ නිකමටවත් ආවේ නැහැ. ඒ ගැටළුව තමයි තිබුණේ. එක කලාපයකට ඇස්තමේන්තු සකස් නොකිරීම ඒ අවාසනාවන්ත සිද්ධියත් එක්ක වෙච්ච දෙයක්. ඒක මම මේ වෙලාවේදී කියන්න ඕන දෙයක්. එතනදී එතුමා වැඩට ආවෙම නැහැ. මම බලෙන් කතා කරලා කීප පාරක්ම කිවුවා. නමුත් ඒකට සම්බන්ධ වුණේ නැහැ. ඒ අඩුපාඩුව ඔතනදී තියෙනවා.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය :-** ගරු සභාපතිතුමාගෙන් අවසරයි. මටත් පොඩි වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්න තියෙනවා. මොකද දැන් ඇත්තටම කියනවා නම් මේ සංවර්ධන වැඩසටහන් ගමට අත්‍යාවශ්‍යයි. අපි හැමෝම යෝජනා ලබා දීලා තිබුණාට සභාවේ මුදල් නොමැතිකමක් තිබුණා පහුගිය කාලයේදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** කොටින්ම කාංචනා මන්ත්‍රීතුමිය ඔය කියන කාණු දෙක මැනලා මාස හයක් විතර වෙනවා. අද වෙනකම් ඇස්තමේන්තුව ලබා දීලා නැහැ.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය :-** ඇත්තටම මේ මුදල දැක්කම හිතෙන්නේ සභාපතිතුමා ලංකාවෙන්ම බෝපෙ පෝද්දල කාණු ටික විතරයි හදන්න වෙන්නේ. මේවා මේ විදියට ගියෝතින් හොඳ නැහැ. මම කියන්නේ මුදල ගැන.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** මෙච්චර කාණු හදන්න තියෙනවා කියලා දැනුම් දීපු එකත් ලොකු දෙයක්. මෙතන යෝජනා ලබා දීලා තියෙන්නේ මන්ත්‍රීවරු කිහිපදෙනයි. ඔක්කොම මන්ත්‍රීවරු යෝජනා ලබා දුන්නා නම් රජයක් විදියට බලාවි කොපමණ කාණු ප්‍රමාණයක් හදන්න තියෙනවද කියලා. හදන්න කාණු නැහැ කියලානේ හිතන් ඉන්නේ.

**ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය :-** ඒක හරි. මම ඒක ගැන නෙමෙයි කතා කරන්න නැගිට්ටේ. මුදල් ගැන බැලුවම මම කියන්න යන්නේ මුලින්ම අපි මේකට කතා කරන අතරවාරයේම, අපි කොට්ඨාශ භාර මහජන නියෝජිතයෝ පත් කරලා ඉන්න මොහොතක රට තියෙන තත්ත්වය ගැන බලලා පක්ෂ විපක්ෂවත් සංවර්ධන කටයුතු පොඩ්ඩක් තියලා මූලිකම කාරණයක් කරන්න තියෙනවා. අපි ප්‍රාදේශීය සභාවේ නියෝජිතයෝ විදියට මූලිකම කාරණයක් කරන්න තියෙනවා. ස්වයං රැකියා ව්‍යාපෘති ටිකක් ලබා දුන්නා නම් හරි මේ ගෙවල්වල ඉන්න මිනිස්සුන්ට කීයක් හරි හම්බකර ගන්න. ඒකට යම් කිසි ක්‍රමවේදයක් සකස් කරන්න ප්‍රාදේශීය සභාව හරහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයත් අනුබද්ධ කරගෙන. මොනවා හරි වැඩසටහනක් කරනවා නම් ගොඩක් වැදගත් කියලා කියනවා අද මේ දේට කතා කරන අතරවාරයේදීම. මොකද, ගෙවල්වල මිනිස්සු ඉන්නවා. ත්‍රීරෝද රථ රියදුරන් ඉන්නවා. ඒ අය අපිට කතා කරනවා. ඒ මිනිස්සුන්ට දරු පවුල රැක ගන්න, එදා වේල හම්බකර ගන්න විදියක් නැහැ. ඉතිං ගරු සභාපතිතුමා මම මේ කරන්නේ රටේ උද්ගත වෙලා තියෙන ප්‍රශ්නයට රජයට දොස් කීම නෙමෙයි. අපෙනුත් කරන්න ඕන කර්තව්‍යයක් තියෙනවා යම් කිසි ක්‍රමවේදයක් ඇතුව. අන්න ඒකට මමත් උපරිම සහයෝගය ලබා දෙන්න කැමතියි. ඒ වගේම තමයි ගරු සභාපතිතුමා බලප්‍රදේශයේ ප්‍රධාන පුරවැසියා විදියට හොඳ තීරණයක් අරගන්න මේ සංවර්ධන යෝජනා ගම්මාන වලට, කොට්ඨාශ වලට අත්‍යාවශ්‍යයි. නමුත් මූලික අරමුණ වෙන්නේ අපි ජීවත් වෙන්න නම් අපේ ජනතාව එක්ක ඉදිරියට යන්න ඕන. එයාලගේ මේ තියෙන ආර්ථික ප්‍රශ්න වලට අපි හොඳ වැඩපිළිවෙලක් සකස් කරන්න සුදුසු ක්‍රියාමාර්ගයක් ඔබතුමා ගනීවි කියන බලාපොරොත්තුවත් එක්ක මේ යෝජනාව මම ඉදිරිපත් කරනවා බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියගේ යෝජනාව හොඳයි. ස්වයං රැකියා කරන අයට ඒක කරන්න ඕන. හැබැයි ස්වයං රැකියා ගැන කතා කරන කොට මේකත් මතක තියා ගන්න. අද වෙනකොට ගොවිතැන් කටයුතු කර ගන්න බැහැ මේ කාණු පද්ධති නැති හින්දා. පැහැදිලිවම ගොවිතැන් කටයුතු කර ගන්න බැහැ. මම ඊයේ ඇළබඩ ප්‍රදේශයට ගිහිල්ලා බැලුවා. ඒ ගොවිතැන් කටයුතු එකක්වත් කරන්න බැහැ. මොකද වෙලා තියෙන්නේ කියලා බැලුවම කාණු වලින් වතුර බහින්නේ නැහැ. කාණු ඔක්කොම ගොඩ වෙලා. ඒ පළාතෙම කාණු ගොඩ වෙලා. මේකට අවධානය යොමු කරපු නිසා තමයි මම මේක කියන්නේ.

**ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය :-** ඒකත් ඇත්ත.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** එහෙමනම් ස්වයං රැකියාවක් විදියට කුඹුරු අස්වද්දන්න නම් මේ කාණු ටික සුද්ධ වෙන්න ඕන. මේකට මොකක් හරි වැඩපිළිවෙලක් තියෙන්න ඕන. මේකට වැඩපිළිවෙලක් තාම හදලා නැහැ.

**ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය :-** ගරු සභාපතිතුමා කුඹුරු ඉඩමක් ගොඩකරලා ඉදිකිරීමක් කරලා තියෙනවා. මේක හොඳට නිරීක්ෂණය කරන්න සභාවෙන්. පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයිති පාරවල්, මාර්ග සංවර්ධන අධිකාරියට අයිති පාරවල්, අනෙකුත් පාරවල් වලින් එන වතුර බහින්න ඒ කාලයේදී හදපු බෝක්කු අද වෙන කොට වහලා. තව සමහර මිනිස්සු තමන්ගේ වාසියට පාරවල් හදා ගන්න ඒවා යොදා ගෙන. ඒ කාණු වැහිලා ගිහිල්ලා තියෙනවා. මේ ප්‍රාදේශීය සභාවේ යම් කිසි සැලැස්මක් තියෙනවා ගමේ තියෙන පාරවල්, බෝක්කු තියෙන තැන් අනුව. සභාපතිතුමා මූලික වෙලා ඔය කාණු පද්ධති හදන අතරවාරයේම අර ස්වයං රැකියා කරන අය පිළිබඳවත් පොඩ්ඩක් හොයලා බලන්න. වතුර බහින්න අහවල් තැන කාණු පද්ධතියක් තිබුණා, මෙතන වතුර ගලා යන්න බෝක්කුවක් තිබුණා වුණත් අද වෙනකොට ඒවාට මොනවාද වුණේ කියලා බලන්න. සභාපතිතුමා මේ සභාවේ ඉන්න කාලය ඇතුළත ඉදිරියේදී මෙන්න මේ වගේ දේවල් කරන්න. ඒ වගේම කාණු පද්ධති හදන්න. ඒවා සංවර්ධනය කරන අතරවාරයේදී මම කියන දේ ගැනත් බලන්න. ස්වයං රැකියා කරන්නත් කාණු පද්ධති අවශ්‍යයි. මම කියන්නේ මේකට යම් කිසි වැඩසටහනක් හදන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** දැන් මෙහෙමයි. දැන් නැවත අරකට අන්තිම වශයෙන් කියන්නම් කාණු පද්ධතිය පිළිබඳව. ඒකට දැනටත් මම කියන්නේ ඒ ටික දැම්මේ ආවොත් එහෙමයි, නාවොත් එහෙමයි කියන පදනම මත. එතනදී ඒක ආවොත් අපි සතුටු වෙනවා. මොකද එතකොට කොටසක හරි කාණු ටිකක් කෙරෙනවා. ඒ වගේම මම අනිත් හැමදේම ගැන අපේ රමේෂ් පතිරණ ඇමතිතුමාට කතා කරනවා. ඉතිං මේකෙදී ඔබතුමන්ලා සකස්කරපු ඇස්තමේන්තු ටික යවලා තියෙනවා පළාත් පාලන අමාත්‍යාංශයට. පහුගිය දවසකත් එතුමාට කතා කරහම කිවුවා, අනිත් ඒවා නෙමෙයි සභා ගොඩනැගිල්ලේ වැඩේට මූලිකත්වය අරගෙන කරලා දෙන්නම් කියලා. මොකද දැන් ආදාහනාගාරයට මුදල් එවුවා. ඔබතුමන්ලා මට චෝදනා කරන්න එපා. මම මේකෙ සභාපතිවරයා වුණාට රමේෂ් පතිරණ ඇමතිතුමා තමයි දිස්ත්‍රික් නායකවරයා. එතුමා තමයි වැවිලි අමාත්‍යවරයා. එතුමාගෙන් මම ඉල්ලන්න ඕන. අමාත්‍යාංශයට ගිහිල්ලා මම ඉල්ලනවට වැඩිය එතුමා හරහා අමාත්‍යාංශයට කරදර කරන්න තමයි මම බලන්නේ. ඊට අමතරව මම වෙනම අමාත්‍යාංශය එක්ක කටයුතු කිහිපයක් කරනවා. ඉතින් එතනදී මම ඇමතිතුමාගෙන් ආදාහනාගාරයට මුදල් ඉල්ලුවම කිවුවා එතුමා අදාහනාගාරයට නෙමෙයි, සභා ගොඩනැගිල්ලට මුදල්

කොහොම හරි අරගෙන දෙන්නම් කියලා. එතනදී ඔබතුමන්ටත් යුතුකමක් තියෙනවා. සියළුදෙනාටම මම ඒක කියන්නේ. මෙතන අනවශ්‍ය දේවල් කියලා ඔළුව අවුල් කරනාවාට වඩා ගිහිල්ලා ඇමතිතුමාට කියන්න. අපි කාණුවලට යෝජනා යවලා තියෙනවා. ඇමතිතුමාට කියන්න අපිට මේ මුදල් ලබා දෙන්න කියලා. ඒ ඉල්ලීම ඇමතිතුමාට කියන්න. මම දිගින් දිගටම ඒක කිවුවා. මට කිවුවා සභා ගොඩනැගිල්ල හදන්න උදවු කරන්නම් කියලා. එතකොට ඇත්තටම පළාත් පාලන දෙපාර්තමේන්තුවේ මුදල් තියෙනවා. ඒ තිබුණ මුදල් වලින් අපි තාප්පය හදන්න මුදල් ඉල්ලලා තියෙනවා. අනිත් කාරණාවලටත් අපි මුදල් ඉල්ලලා තියෙනවා. එතකොට ඒවායින් කොටසක් හරි අපිට හම්බවේවි. මම ඒක ගැන සියළු මන්ත්‍රීවරුන්ට දැනගන්න කියන්නේ. අපිට මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ග්‍රාම නිලධාරී වසමකට රුපියල් ලක්ෂ විස්සක යෝජනා දැනට අනුමත වෙලා ඇවිල්ලා තියෙනවා. එක ග්‍රාම නිලධාරී වසමකට රුපියල් ලක්ෂ විස්සක මාර්ග සංවර්ධනය කරනවා කාපට් මාර්ග වලට අමතරව කුට්ටි ගල් සහ රෙඩිමික්ස් යටතේ. ඔය දෙකෙන් හැම ග්‍රාම නිලධාරී වසමකට රුපියල් ලක්ෂ විස්ස ගානේ ඇවිල්ලා තියෙනවා. දැනට ඒවායේ ඇස්තමේන්තු හදනවා. ඉතින් ඔය ටික කරාට පස්සේ මම හිතනවා ගමේ ඊළඟට ඉතුරු වෙන්නේ කාණු පද්ධති ටික. ඒක මන්ත්‍රීවරයාගේ ශක්තිය තමයි කාණු පද්ධති ටික සකස්කර ගැනීම.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, විනාඩියක කාලය මට ලබා දෙන්න. ඔබතුමා මේ ගැන මතක් කරපු නිසා මේක ගැන මට මතක් වුණේ. රුපියල් ලක්ෂ විස්සක යෝජනා ඇවිල්ලා තියෙනවා. ඒක ඇත්ත. නමුත් ඊයේ ඒ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා තාක්ෂණ නිලධාරියෙක් ඇවිල්ලා මැනුම් කටයුතු සිදු කරද්දී ආපු තීරණයක මේකයි. එකම පාරකවත් බෝක්කුවක් දාන්න බැහැ ඒ රුපියල් ලක්ෂ විස්සෙන්. එකම පාරකටවත් කොරිපස් දාන්නත් බැහැ. ඒ පාරවල්වල කොන්ක්‍රීට් හෝ කුට්ටිගල් පමණයි අල්ලන්න හැකියාව තියෙන්නේ. ඊළඟට කොරිපස් දාන්න බැරි නිසා ඒවාට දාන්න පුළුවන් ඒ.බී.සී පමණයි. ඊළඟට කොන්ක්‍රීට් මික්ස්චර් වලින් අනලා, අතින් දාන්න බැහැ. රෙඩිමික්ස් පමණයි දාන්න ඇවිල්ලා තියෙන්නේ. පොඩි පොඩි ගැටළු තියෙනවා. පොඩි බෝක්කු නැතුව කොන්ක්‍රීට් ටිකක් දාලා වැඩක් නැහැ. පෝද්දල ඉන්ධන හල පිටිපස්සේ ජයවික්‍රම මහතාගේ කඩය අයිනේ තියෙන පාරේ බෝක්කුව නොදා පාර කොන්ක්‍රීට් කරලා වැඩක් නැහැ. එතකොට ඒ පාර කොන්ක්‍රීට් කරන්න විදියක් නැහැ. මොකද බෝක්කු දාන්න ප්‍රතිපාදන නැහැ. ඒ වගේ ගැටළු තියෙන තැන් තියෙනවා සභාපතිතුමා. ඒවා නිවැරදි කළ යුතුයි අනිවාර්යයයෙන්ම. නැත්නම් මේ රුපියල් ලක්ෂ විස්සෙන් නිසියාකාරයෙන් පාරවල් හදා ගැනීමට හැකියාවක් ඇත්තේ නැහැ. මේ සභාවට ඇවිල්ලා ඕපාත ජනතාව වෙනුවෙන් වෙච්ච පොරොන්දු අතරින් කරන්න බැරිවුණ වැඩක් තමයි ඕපාත පන්සලට යන පාර සංවර්ධනය කරන එක. අබේසේකර මන්ත්‍රීතුමත් ඒක දන්නවා ඇති. ඒ පාරට මේ රුපියල් ලක්ෂ විස්ස දැම්මට අනුමත වෙලා ඇවිල්ලා නැහැ. පන්සලට යන පාර හින්දද කියන ගැටළුව තියෙනවා. හැබැයි ඒකට කොරිපස් තමයි දාන්න ඕන පාර උස්සන්න. නැත්නම් ඒ පාර ඒ.බී.සී දාලා උස්සන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ යෝජනාව අනුමත නොවී තියෙන්න හේතුවක් නැහැ.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ඒ පාර අනුමත වෙලා ඇවිල්ලා නැහැ. ඊළඟට ඕපාත ප්‍රධාන මාර්ගය කාපට් කිරීම සඳහා ගරු ඇමතිතුමාගේ යෝජනාවට ඇතුළත් වෙලා ටෙන්ඩර් කැඳවලා ඒක ආරම්භක අවස්ථාවේ දැන් තියෙන්නේ. ඊළඟට අපේ කුලරත්න මන්ත්‍රීතුමාගේ නිවසට යන මාර්ගය කාපට් කිරීම සඳහා ඇමතිතුමාගේ යෝජනාවට දාලා ඒකත් ක්‍රියාත්මක වෙමින් තියෙනවා. මීපාවල, කලංසූරිය මාවත බලගොඩ මහා විද්‍යාලය දක්වා කාපට් කරන්න දාලා ඒක ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඉතින් මේවා කරන එක ඇත්ත. අර රුපියල් ලක්ෂ විස්සේ යෝජනා වලට දාපු තීරණයක වැරදියි. ඒවා වෙනස්කළ යුතුයි කියන තැන මම ඉන්නවා ගරු සභාපතිතුමනි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට ගිය සෙනසුරාදා ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමා සමඟ සාකච්ඡාවක් තිබුණා. ඒ සම්බන්ධව එතුමන්ලා ඉන්න මතය තමයි සාමාන්‍ය ඒවාගෙන් අනලා දානකොට මික්ස්චර් එක වෙනස් වෙලා පාර නැවත අවුරුදු පහකින්, හයකින් හදන්න වෙනවා කියන එක. ඒ කාරණය උඩ තමයි රෙඩිමික්ස් කියන එක හරි කුට්ටිගල් කියන එක හරි ඒ අය තීන්දු කරලා තියෙන්නේ. ඒකෙදී අනිවාර්යයෙන්ම ඒ.බී.සී. අතුරලා, තලලා ඒක ඉස්සෙල්ලා ටෙස්ටින් කරන්න ඕන. ඊට පස්සේ තමයි රෙඩිමික්ස් දාන්න හරි කුට්ටි ගල් හරි අල්ලන්න ඕන. ඒකටත් ටෙස්ටින් එක කරන්න ඕන ඊළඟට. ඉතිං ඒකට ටෙස්ටින් දෙකක් යනවා. පාරේ ඝණකම අඟල් හය කියන එක වෙනස් කරලා එවන්නම් කිවුවා අඟල් පහට. අඟල් හය කියන එක තමයි එවලා තිබුණේ. ඒක අඟල් පහට වෙනස් කරලා එවන්නම් කියලා කිවුවා. රෙඩිමික්ස් යන්න බැරි පාරවල් වල විස්තර වෙනම එවන්න කිවුවා. ඒක වෙනස් කරලා අනුමැතිය ලබා දෙන්නම් කියලා කිවුවා. ඒක දෙන්නේ ප්‍රවාහනය කරන්න බැරි පාරවල් වලට.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මීපාවල පන්සල පාරේ දෙණිය මංසන්ධියේ තුන්මං හන්දියක් තියෙන්නේ. අනිවාර්යයෙන්ම එතනට පෙට්ටි බෝක්කුවක් දාලා ඕන කොන්ක්‍රීට් දාන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට අනුමැතිය නැහැ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** එතකොට ඒ මුදල් කොහෙන්ද ලැබෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පෙට්ටි බෝක්කු දාන්න අනුමැතිය නැහැ. පාර හදන්න විතරයි පුළුවන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමනි, ඇත්තටම ඔය නොකෙරුණා කියන වැඩ පැත්තකට දාන්න. ඒවා කෙරෙනවා නම් හොඳයි. ඒක කෙරෙයි. මම නම් විශ්වාස කරනවා ඒක කෙරෙයි කියලා. ඒක කෙරෙනවා නම් තමයි හොඳ. ඇත්තටම මේ මන්ත්‍රීවරුන්ගෙන් හිටපු තාක්ෂණ නිලධාරි මහතාට චෝදනාවක් ආවා. ඒක චෝදනාවක්. ඒක නිවැරදියි එහෙම වුණානම්. ඔබතුමන්ලා පාරවල් මනින්න කියලා දුන්නම එතුමා විසින් ඒක නොකර හැරියද.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මම කියපු දේවල් ටික නම් කරා. මම පාරක් මනින්න කිවුවා නම් හවස් වෙලාවක හරි ඇවිල්ලා දිනූෂ මහතා ඒක මැනලා ගියා. ඒකට මම දන්නේ නැහැ මොන ප්‍රශ්නයක්ද තියෙන්නේ කියන එක.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, සියළුම මන්ත්‍රීවරුන්ගෙන් සහ මන්ත්‍රීවරියන්ගෙන් අවසරයි. අද දින මෙම සභාව නියෝජනය කරන්න ඇවිල්ලා ඉන්න කුලරත්න නවක මන්ත්‍රීතුමා ඇතුළු සියළුම නිලධාරීන්ගෙන් අවසරයි. ගරු සභාපතිතුමා, දැන් මෙතන දීර්ඝ වශයෙන් කෙරිච්ච සාකච්ඡාව තවදුරටත් ඉස්සරහට ගෙනියන්න ලොකු අවශ්‍යතාවයක් ඇත්තේ නැහැ. ගරු සභාපතිතුමනි, අපි දැන ගන්න කැමතියි මේක ගැන. දැන් මෙතන විවේචන ගොඩක් ආවා පැති බැමි සහ කාණු සම්බන්ධයෙන්. මේක හොඳ වැඩක්. අපිට තියෙන බරපතල ගැටළුවක් තමයි මේක. පාරවල් හදනවා. නමුත් පාරේ කොලර් එක නඩත්තු වෙන්නේ නැහැ. වතුර බහින්නෙත් නැහැ. පාර කඩා ගෙන ගිහිල්ලා. මේ නිසා පාරට අලාභ හානි වෙනවා. ඒක නිසා නැවත නැවත ඉතා ඉක්මනින් පාරවල් නඩත්තු කරන්න ඕන මට්ටමට පත් වෙනවා. ඒ නිසා පාර දෙපස, පාර හදන මොහොතේම පැති බැමි සහ කාණු යොදන්න පුළුවන් නම් නිවැරදියි. නමුත් මෙහෙම හරි ඒකට මේ යෝජනා ටික ඇවිල්ලා ඒක ක්‍රියාත්මක වෙනවා නම් තමයි හොඳ. පළවෙනි කාරණය ඒක.

ඊළඟට ඔබතුමාම මේක ගැන කතා කරද්දි දෙයක් කිවුවා. පොඩි අපැහැදිලිකමකින් සහ බලාපොරොත්තුවක් නැති මට්ටමේ ස්වරූපයෙන් තමයි ඔබතුමා මේක ගැන කතා කරේ. මම දන්නේ නැහැ මේකට හේතුව මොකක්ද කියලා. රජයක් හැටියට මේ යෝජනා ලබා ගැනීමේදී, ඒ යෝජනාවන් එවන්න කියන කොට යම් කිසි ඉලක්කයක් සහ සැලැස්මක් ඇතුව තමයි කරනවා ඇත්තේ. ඒ වගේම තමයි මේ මන්ත්‍රීවරුන්ගෙන් ප්‍රකාශ වෙච්ච කරුණු කාරණා එක්ක සලකා බැලුවට පස්සේ මේ සමහර ප්‍රාදේශීය සභාවල් වලට මේ යෝජනා ක්‍රියාත්මක කරන්න ප්‍රතිපාදන වෙන් වෙලා. එතකොට අපිට ප්‍රතිපාදන වෙන් වෙලා නැහැ කියන කාරණය තමයි කියන්නේ. එහෙම නම් මේ ක්‍රියාමාර්ගය ඉස්සරහට ගෙනියද්දි අපිට ප්‍රතිපාදන වෙන් නොවෙන්නත්, අනෙකුත් ප්‍රාදේශීය සභාවලට ප්‍රතිපාදන වෙන් වෙන්නත් තාක්ෂණික දෝෂයක් තියෙන්න පුළුවන්. මේක ප්‍රමාද වීම හෝ වෙන මොකක් හරි හෝ තාක්ෂණික දෝෂයක් තියෙන්න පුළුවන්. ඒක අපිට එවන්න ඕනනේ එහෙමනම්. අපිට අදාළ නැත්නම්, බෝපෙ පෝද්දල බලප්‍රදේශයට අදාළ නැති ව්‍යාපෘතියක් නම් අපිට ඒක එවන්න ඕන නැහැ. යෝජනා ඉල්ලලා එවලා තියෙන්නේ මෙහාටත් ඒක අදාළ නිසා. බෝපෙ පෝද්දලට ඒක අදාළ නිසා තමයි එවලා තියෙන්නේ. ප්‍රශ්නය තියෙන්නේ එතනදී මේක අපිට ක්‍රියාවට නඟන තැනට ගෙනියන්න බැරි වීම. අපි ඒක ගැන දැන ගන්න කැමතියි සභාවේ මන්ත්‍රීවරු හැටියට. ප්‍රදේශයේ වෙන කටයුතු වලදී අපි මේකට ඉල්ලීම් නොකර ඉන්න එක ඇත්ත.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඔබතුමාගෙන් මෙහෙම ඉල්ලා සිටිනවා. කරුණාකරලා ඔබතුමා කියන්න එක ප්‍රාදේශීය සභාවක් මෙන්න මේ වැඩසටහන යටතේ මෙන්න මේ කාණු පද්ධතිය හදනවා කියන එක. එහෙම කරන එකක් මට කියන්නකෝ. ඇස්තමේන්තු හදලා ඒක කරන එක සභාවක් මට කියන්නකෝ. මේ ගාල්ල දිස්ත්‍රික්කයේ මෙන්න මේ අහවල් ප්‍රාදේශීය සභාව වැඩ ආරම්භ කරලා තියෙනවා, මුදල් වෙන් වෙලා ඇවිල්ලා තියෙනවා කියලා කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමන්ලාගේ රජය තමයි මේක නියෝජනය කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා දැන් එහෙම කියනවානේ. මට කියන්නකෝ මෙන්න මේ ප්‍රාදේශීය සභාවට මෙන්න මේ කියන මුදල් අනුමත වෙලා ඇවිල්ලා, මෙන්න මේ වැඩේ ආරම්භ කරලා තියෙනවා කියලා. ඔබතුමා වගකීමෙන් කියන්නකෝ ප්‍රාදේශීය සභාවේ නම කියලා. මන්ත්‍රීතුමා මේක ඉල්ලුවේ අපි. සභාවට ආපු එකට අපි ඒවා ඉල්ලුවේ. එහෙන් ඉල්ලපු එකට තමයි අපි උත්තර යැවුවේ. නිකං කතාවට ලියලා යැවුවා කිලෝ මීටර් විස්සක කාණු තියෙනවා කියලා. පස්සේ ලියලා යැවුවා ඒක කිලෝමීටර් හතළිහක් කියලා. ඒ කොහොම වුණත් මේ කාණු පද්ධති වලට විශේෂයි කියලා අනුමත වෙලා ආපු එකක් නෙමෙයි. අපි හිතලා අනිත් ඒවා දාලා ඉවර වෙලා ඒ අතරේදී මේක කෙරෙයි, නොකෙරෙයි කියන මේවා එක උඩ තමයි අපි කාණු පද්ධතිය දැම්මේ. අපිට සතුටුයි මේකෙන් එක කාණුවක් හරි කෙරෙනවා නම්. ඒ උපකල්පනය උඩ තමයි මේක දැම්මේ. එහෙම නැතුව මන්ත්‍රීවරු තෝරලාවත්,

ප්‍රදේශයන් තෝරලාවත් දාපු එකක් නෙමෙයි මේක. එහෙම නම් මම දානවා මේකෙ සභාපතිවරයා විදියට කාණු දහයක් විතර. මගේ කොට්ඨාශයේ කාණු දෙකක්ද කොහෙද තමයි මේකෙ තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම මේ ඉදිරිපත් කරපු යෝජනාවට කිවුවේ. දැන් ඔබතුමාම කියනවානේ මේකට විශ්වාසයක් නැහැ කියන එක. ඉතිං ඒ නිසා මේ ප්‍රශ්නය තියෙන්නේ දැන් රජයට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා මෙන්න මේක තේරුම් ගන්නකෝ. අපි ප්‍රමුඛතාවය අනුව අවශ්‍ය දේවල් දාලා අන්තිමට තමයි කාණු දැම්මේ. අපි බලාපොරොත්තු වුණේ ඊට වඩා මූලික කාර්යයන් කර ගන්න. මෙතන තියෙන පොදු කාරණා ටික තමයි ඒ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ අපේ ලැයිස්තුවේ තිබුණ ප්‍රමුඛතාවයන්. අපේ සභාවට තියෙන එකක්නේ ඒක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා මේ බලන්නකෝ. එගොඩ කනත්ත වත්ත කැපූ ඇළ මාර්ගයේ කාණු පද්ධතිය හදන්න රුපියල් අසූතුන් ලක්ෂ පනස්දාහයි ඇස්තමේන්තුව. මවුන්ට්ප්ලසන්ට් වත්ත මාර්ගයේ කාණු හදන්න රුපියල් හැත්තෑ තුන් ලක්ෂ පනස් දාහයි ඇස්තමේන්තුව, ඩාලින්ටන් වත්ත මාර්ගයේ කාණු හදන්න රුපියල් හැත්තෑ තුන් ලක්ෂ පනස්දාහයි ඇස්තමේන්තුව. කහඳුව වත්ත - කොහොඹන් වත්ත මාර්ගයේ කාණු හදන්න රුපියල් තිස් හතර ලක්ෂ පනස් දාහයි ඇස්තමේන්තුව, කිතුලම්පිටිය මාර්ගයේ කාණු හදන්න රුපියල් විසි හත් ලක්ෂ හැටපන්දාහයි ඇස්තමේන්තුව. මම කියන්නේ ඇස්තමේන්තු හදලා යැවුවා. ඒකට අපි කාණු තිස්පහක් යවලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පාරක තියෙන දුර ප්‍රමාණය එක්ක ඒ ඇස්තමේන්තු මුදල එනවා ඇති.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ කාණු තිස්පහ හදන්න කෝටි විසි ගාණක් යනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක ලොකු ගාණක්. ඒකෙ වැරැද්දක් නැහැ. හැදෙන්න ඕන කාණුවේ දුර ප්‍රමාණය අපි යවන්න ඕනනේ. ඒකෙ ගැටළුවක් නැහැ. ඒක හදනවද නැද්ද කියලානේ අපි බලන්න ඕන. මේක ඉලක්කයක් නැතුවද එවන්නේ. අපිට වෙන්වන මුදලක් හෝ අපිට ප්‍රතිපාදන මෙච්චරයි කියලා හෝ කෝටි විසිපහක් හරි, කෝටි පනහක් හරි කියලා නිකං සීමාවක් නැතුවද, මේක එවන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා මේක තේරුම් ගන්න. අපෙන් යෝජනා තමයි ඉල්ලුවේ. නමුත් අපි අන්තිමට කාණු දැම්මේ කිසි බලාපොරොත්තුවක් නැතුව. ඒක මූලිකවම තේරුම් ගන්න ඕන. ඊට පස්සේ මම සහකාර ලේකම්තුමාට කතා කරලා මේක කිවුවා. කාණු වැඩේ නම් කෙරෙන එකක් නැහැ, ඒක හින්දා මුල් යෝජනා ටික එවන්න කියලා මට කිවුවා. අපි නැවත මේ කාණුවල ඇස්තමේන්තු ටික යැවුවේ අපි අර යවපු අනිත් යෝජනා වලට ඇස්තමේන්තු යවන්න ඕන හින්දා. අපිට එතකොට කියන්න පුළුවන් කාණු ටිකක් හදන්න ප්‍රතිපාදන දෙන්න කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එතකොට ගරු සභාපතිතුමා මට තියෙන ප්‍රශ්නය මේ කතා කරන්නේ. දැන් එතකොට ඇත්තටම මේ යෝජනා යවද්දි අපේ තියෙන ප්‍රමුඛතාවය අනුව පෙළ ගස්සවලා මේ සභාව දැනුවත් කරා නම් අපිට පොඩි අවබෝධයක් තියෙනවා. අපි යොමු කරේ මේ ආකාරයෙන් කියලා සභා ගත කරන්න තිබුණා මේක. එතකොට අපිට අවබෝධයක් තියෙනවානේ. දැන් මේක එකපාරටම ආවම කාටවත් මේක ගැන අවබෝධයක් නැහැ. ගියපු ක්‍රමවේදය මොකක්ද කියලා අපි දන්නේ නැහැ. යෝජනා කරපු ක්‍රමවේදය මොකක්ද කියලා අපි දන්නේ නැහැ. ඒ සම්බන්ධව සභාවේ සියළු මන්ත්‍රීවරු ගැන මම මේ කියන්නේ. ඒ ප්‍රශ්නය මට වගේම අනිත් අයටත් තියෙන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා මම සභාව දැනුවත් කරලා තියෙනවා මීට කලින් දෙවතාවක් මට මතක හැටියට. මේ යෝජනා ටික අපි යැවුවා කියලා කිවුවා පළාත් පාලන දෙපාර්තමේන්තුවට. මට මතක විදියට මේක ගැන දෙවරක් සභාව දැනුවත් කරලා තියෙනවා. ඒ අපෙන් ඉල්ලපු එකට අපි යෝජනා යැවුවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපිට එතකොට අවබෝධයක් තියෙනවා. අපි හිතන්නේ එතකොට ඒ එවපු එක මේ කොට්ඨාශ කිහිපයකට වෙන් කර ගෙන ඒකට ඇස්තමේන්තු යවන්න කටයුතු කරා කියලා. ඒක නිසා යම් යම් ප්‍රදේශ වලට අසාධාරණයක් සිදු වෙනවා. සමහර මන්ත්‍රීවරුන්ට අසාධාරණයක් සිදු වෙනවා. මම කියන්නේ අපි කොට්ඨාශ නියෝජනය නොකරාට මේ සභාව නියෝජනය කරන මන්ත්‍රීවරු. ඒ වගකීම කියන එක අපිටත් තියෙනවා. කොට්ඨාශ නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට ඒ වගකීම වෙනම භාර දීලා තියෙනවා. එතකොට අපිත් දැනගන්න ඕන මේ සභාවට එන යෝජනා ගැන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ යෝජනා ලබා දීපු එක මන්ත්‍රීවරයෙකුටවත් මම කියලා නැහැ ගිහිල්ලා ඇස්තමේන්තු හදලා දෙන්න කියලා. මේ ඔක්කොම මම සභාවේ කියපු එකට ඒ තාක්ෂණ නිලධාරීන්ව කතා කර ගෙන ගිහින් ඇස්තමේන්තු හදලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මන්ත්‍රීවරයා මැදිහත් වෙන්නේ වඩා නිවැරදිව ඒක කර ගන්න. මන්ත්‍රීවරයාගේ අවධානය සහිතව ඒක කර ගන්න ඕනනේ. ඒක මන්ත්‍රීවරුන්ගේ පැත්තෙන් වැරැද්දක් විදියට මම දකින්නේ නැහැ. ඒක ඔබතුමන්ලාගේ පැත්තෙන් හරි. නිලධාරියාට වගකීමක් පැවරුවාම ඒ නිලධාරියා විසින් මේ වගකීම ඉෂ්ට කරන්න ඕන. ඒකෙ කිසි ගැටළුවක් නැහැ. දැන් මේ ප්‍රශ්නය පැන නැගුණේ මේකයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීවරුන්ගේ අඩුපාඩුකම් ගොඩක් තියෙනවානේ. දැන් අර රුපියල් ලක්ෂ විස්සක් ග්‍රාම නිලධාරි වසමකට එනවා කියලා කියපු ගමන් මන්ත්‍රීවරු කරේ මෙහේ ඉන්න තාක්ෂණ නිලධාරීන්ව එක්ක ගෙන ගිහිල්ලා පාරවල් මැන්නා. මට කියලාවත් නෙමෙයිනේ ඒක කරේ. නමුත් නැවත එහෙන් කිව්වා ඇස්තමේන්තු නෙමෙයි යෝජනා ටික ගෙනල්ලා දෙන්න කියලා. ඉතිං දැන් නැවත ඒවාට ඇස්තමේන්තු සකස් කරන්න වෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පාලම් කීපයකටම ඔය පාලම් සම්බන්ධයෙන් වන ඇස්තමේන්තු සකස් කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ඒකට මට චෝදනා කරලා වැඩක් නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම කියන්නේ ගරු සභාපතිතුමා ප්‍රශ්නය තියෙන්නේ මේකයි. මේක සභාගත කරලා මන්ත්‍රීවරුන්ට මේ ගැන අවබෝධයක් ලබා ගන්න තිබුණා නම් තමයි හොඳ. සභාවේ මන්ත්‍රීවරු විදියට අපිට එතකොට මෙච්චර වෙලා මේ ගැන සාකච්ඡා කරන්න ඕන නැහැ. එහෙමනම් අපි මේක ගැන පොඩි අවබෝධයකින් වැඩේට යනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ඔබතුමන්ලා මේ ගැන අවබෝධයෙන් ඉන්න එපැයි. මේ කාරණය ගැන දෙපාරක් සභාවේදී මතු කරලා තියෙනවානේ. ඔබතුමන්ලාට එතකොට අහන්න තිබුණානේ කොයි විදියටද කාණු මනින්නේ කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ යෝජනා කරපු ඒවා සම්බන්ධයෙන් අපි දන්නේ නැහැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමාට මම දැනුත් කියන්නේ පාරවල් නොකෙරුණත් කමක් නැහැ කාණු හදන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපිට ප්‍රතිපාදන ලැබෙන්නේ නැහැනේ. ඒක සභාවේ ප්‍රතිපත්තිමය තීන්දුවක්නේ. නමුත් මන්ත්‍රීවරයා කියන භූමිකාවේ වගකීම අපි කාටත් සභාව තුළදී තියෙනවානේ. ඒ නිසා මම කියන්නේ අපි මේවා ගැන දැන ගත යුතුයි. ඒකෙ වගකීම තියෙන්නේ ඔබතුමාට. ඔබතුමා තමයි මේකෙ මූලාසනය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමනේ මන්ත්‍රීතුමා. සමහර දේවල් ක්‍රියාත්මක වෙනවා. දැන් උදාහරණයකට කිව්වොත් ලියනගේ මන්ත්‍රීතුමා කිව්වා හවස හරි ඇවිල්ලා එතුමන්ගේ පාරවල් මැනලා දුන්නා කියලා. නමුත් ඒක අනිත් අයට කරේ නැහැනේ. මම ඉල්ලීමක් කරානේ අඩුම තරමේ වැඩට එන්න කියලා. මෙතන අඩුපාඩු තියෙනවානේ. ලබුදූවේ වෙළඳ සංකීර්ණයේ ඇස්තමේන්තු හැදුවද, පොදු එකක්වත් කරේ නැහැනේ. ඒක හැදුවේ නැහැනේ අද වෙනකම්. ඉංජිනේරුවරයා එක්ක ගෙන ඇවිල්ලා ලබුදූවේ වෙළඳ සංකීර්ණයේ දෙපැත්තේ පඩි පෙළවල් දාන්න බැලුවා. ඒකත් ඔය යෝජනාවට දාලා තියෙනවා. ඒකත් අපිට යවන්න බැරි වුණානේ. එතකොට කාගෙද දුර්වලකම.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මගේ යෝජනාව අඩුම තරමේ මේවා සභාගත කරලා අපිව දැනුවත් කරන්න කියන එක. ඒ ඉල්ලීම මම කරනවා.

ඊළඟට ගරු සභාපතිතුමා චනක චමල් මන්ත්‍රීතුමා දැන් ඉදිරිපත් කරපු කාරණය ගැන බලන්න ඕන. කොවිඩ් 19 එන්නත්කරණ කටයුතු සිදු කිරීමේදී වෙච්ච ඒ කාරණය ඉතාමත් කණගාටුදායක සිද්ධියක්. නරාවල ග්‍රාම නිලධාරි වසමේ සිද්ධ වෙච්ච දේ මේ. ඇත්තටම ප්‍රමුඛතාවය ලබා දුන්නේ ග්‍රාම නිලධාරි වසමේ අවුරුදු 60 ට වැඩි අයට නම් ඒක ඒ අයට ලබා දෙන්න ඕන. ඊට පිටස්තරව රජය තීන්දුවක් අරගෙන තියෙනවා රාජකාරි මට්ටමින් රැකියාවල යෙදෙන අයටත් මේකට අවස්ථාව ලබා දෙන්න ඕන කියලා. නමුත් ප්‍රමුඛතාවය ලබා දුන්නේ වයස අවුරුදු 60 ට වැඩි අයට. නිශ්චිතවම වයස අවුරුදු 60 ට වැඩි අයගේ ලැයිස්තුව ඉලක්ක කර ගෙනනේ මේ එන්නේ. ඒක නොදන්නවා කියලා කියන්න බැහැ. එන්නත් 500 ක් ගෙනල්ලා 700 ක් සෙනඟ හිටියා කියලා කියන්න බැහැ. ග්‍රාම නිලධාරීන් හරහා නිශ්චිතවම ඒ සංඛ්‍යාලේඛන යනවා. ඒක ඒ අය සතුව තියෙනවා. එතකොට ඒක හරි නිශ්චිතයි. හැබැයි දැන් එන්නත් අඩුවෙන් ගෙනල්ලා ඒ ප්‍රමාණයට එන්නත් ලබා දෙන්න බැරි වුණා නම් ඒක වෙන ප්‍රශ්නයක්. මේවා නිරාකරණය විය යුතුයි. ඒක ඉතා

අවාසනාවන්ත සිද්ධියක්. මෙතුමා තමයි ඒක මතු කරේ. කොටින්ම ඒ පණිවිඩය මටත් ආවා. ඒ මනුස්සයාව රෝහලට ගෙනියන කොට මට පණිවිඩය ආවා. ඔබතුමාටයි ඒ නරක නාමය ආවේ. මම කියන්නේ මේක නරකයි. මට පණිවිඩය ආවේ චනක මන්ත්‍රීතුමා පිටින් ගෙන්වලා එන්නත් ලබා දුන්නා කියලා. ඒ පාර මම හොයලා බැලුවම දැන ගත්තා එහෙම නෙමෙයි සිද්ධ වෙලා තියෙන්නේ කියලා. රජය තීන්දුවක් අරගෙන තියෙනවා. හොයලා බලන කොට එහෙම තීන්දුවක් අරගෙන තියෙනවා කියලා දැන ගන්න ලැබුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ මන්ත්‍රීතුමා. ඒක ඔහොම නෙමෙයි වුණේ. අවදානම් ක්ෂේත්‍රවල රාජකාරි කරන අයට එන්නත් ලබා දෙන්න ගත්තා. දැන් අපිට ඒක වළක්වන්නත් බැහැ. නමුත් අවදානම් කියලා එන්නත් ලබා දුන්නේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ වැඩ කරන අයගේ හිතවත් අයට. අපි උදාහරණයක් ගමු. යම් කිසි වැඩපළක තුන් හතර දෙනෙක් ඉන්නවා. අන්න ඒ වගේ හිතවත්කම් මත ඒ අය ඒක බෙදා ගත්තා. අන්න එතනයි ඔය ප්‍රශ්නය වුණේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒකට අපි ක්‍රමවේදයක් හදා ගන්න ඕන. ඒකෙන් නැත්නම් අමාරුවේ වැටෙන්නේ අහිංසක මිනිස්සු. ඊළඟට ඒ නරක නාමය එන්නේ ඒකට මැදිහත් වෙන අයට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එක වෙලාවක ලියනගේ මන්ත්‍රීතුමාට මම කිව්වා කරාපිටියේ ශ්‍රීධර ෆාමසිය ගාව ත්‍රීවිල් පාර්ක් එකේ අයට එන්නත් ලබා දෙන්න කියලා. මන්ත්‍රීවරයා යනකොට අපි දන්නෙත් නැහැ ලැයිස්තුව අරගෙන ගිහිල්ලත් ඉවරයි. ඔය විදියට තමයි ඕක කෙරුණේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒකෙ විනිවිදභාවය පිළිබඳ ප්‍රශ්නයක් තියෙනවා. මම කියන්නේ මෙන්න මේවා නිවැරදි වෙන්න ඕන. අපරාදේ ජීවිතයකින් ඒ මනුස්සයා වන්දි ගෙවුවේ. ඒ මනුස්සයා ගාවින් එන්නත් ලබා දෙන එක නතර වෙලා. පෝලිමේ ඉඳලා තව වයස අවුරුදු 60 ට වැඩි අය. එයා ගාවින් එන්නත් ලබා දෙන එක නතර වෙලා. ඒ නිසා එයා කම්පනයට ලක් වෙලා තියෙනවා. ඒ කම්පනය නිසා එයා එදා රෑම නැති වෙලා. කොවිඩ් 19 එන්නත ලබා දීපු නැති නිසා එයා මැරුණා කියලා නෙමෙයි මම කියන්නේ. මේවා වෙන්නේ එක විදියකට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ඕක ඔතන විතරක් නෙමෙයි වුණේ. ඕක හැමතැනම වුණානේ. ඒකට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමා වගකීම ගන්න ඕන. උදාහරණයක් මම කියන්නම්කෝ. ලබුදූව සිරිධම්ම විද්‍යාලයේදී එන්නත් ලබා දීපු වෙලාවේ ත්‍රීවිල් පාර්ක් එකේ අයටත් එන්න කිව්වා. දහ දෙනෙක් විතර පෙනි පෙනී එන්නත් ලබා දෙන එක නැවැත්තුවා. ඒ අයට එදාම හවස සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයෙන් එන්නත් ලබා දුන්නා. අවදානම් කට්ටිය කියලා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේදී එන්නත් ලබා දුන්නා. එතකොට මොකක්ද වුණේ. මම කියන්නේ ඉලක්ක කරලා චෝදනා එල්ල කරන්න පුළුවන් විදියට කරපු දේවල් මේ. නරාවලත් ඕකම තමයි එදා දවසේදී වුණේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම කියන්නේ ග්‍රාම නිලධාරි වසම් වලට එන්නත් ලබා දෙන කොට ඒක නිශ්චිතයිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ මන්ත්‍රීතුමා. ඒක නිශ්චිත නැහැ. අපි හිතමු ග්‍රාම නිලධාරි ලැයිස්තුවකින් හත්සිය දෙනෙක් ආවොත් එතනින් ගොඩක් අය පිටින් එන්නත් ලබා ගෙන එන්නේ. ගාල්ලෙන් එහෙම එන්නත් ලබාගෙන. එතකොට 200 ක් විතර අඩු වෙනවා. දැන් උදාහරණයක් මම කියන්නම්. දැන් එදා ගොඩකන්ද පන්සලේ එන්නත් ලබා දීපු වෙලාවේ එක්දහස් හයසිය ගාණට අවදානම් කට්ටියත් එකතු වෙන කොට ඔක්කොම 2000 ක් විතර වෙනවා. නමුත් සම්පූර්ණයෙන්ම ආවේ එක්දාස් එකසිය ගාණක්. ඉතිං සම්පූර්ණයෙන්ම එන්නත් ලබා දුන්නේ එක්දාස් එකසිය ගාණක්. ඒ ඉතුරු අය එහෙන් මෙහෙන් එන්නත් ලබා ගෙන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, එතකොට ඒක හරිනේ. එතකොට එන්නත් ඉතුරු වෙලානේ. මෙතනදී වුණේ එන්නත් ඉතුරු වෙන එක නෙමෙයිනේ. එන්නත් මදි වුණ එකනේ වුණේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තමයි. මේකෙ වුණේ මොකක්ද කියලා දන්නවාද, නරාවල ලිස්ට් එකේ තිබුණේ නැහැ. අන්තිම එන්නත් ටික තමයි මේ. හත්සිය ගාණක් තමයි නරාවල හිටපු මුළු ගණන. මේ අය පන්සිය දෙනෙක් ඉලක්ක කරගෙන තමයි එන්නත් ලබා දුන්නේ. එන්නත් ඉතුරු වෙලා තිබුණේ 500 යි. මුල අයට ඔය ප්‍රශ්නය ආවේ නැහැ. හිටපු අයට එන්නත් ලබා දුන්නා. අන්තිම ටිකේදී තමයි ප්‍රශ්නය ආවේ. ඒ ඉතුරු වෙච්ච අනෙකුත් සියළුදෙනාටම මේ සෙනසුරාදා සහ ඉරිදා දිනයන් වලදී එන්නත් ලබා දෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ ක්‍රමවේදය හදන එක හරි. ඒකට අවදානයෙන් ඉඳලා මේක නිරවුල් කරන්න කියන යෝජනාව තමයි අපි කරන්නේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** කුට්ටිගල් සහ රෙඩිමික්ස් ව්‍යාපෘති යටතේ අපි මේක ප්‍රාදේශීය සභාවේ තාක්ෂණ නිලධාරීන් යටතේ කරනවාද, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණ නිලධාරීන් යටතේ

කරනවාද, අපේ තාක්ෂණ නිලධාරි මහත්වරුන් යම් යම් පාරවල් මැනලා ඇස්තමේන්තු සකස් කරලා තියෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණ නිලධාරි මහත්වරුනුත් ඇස්තමේන්තු සකස් කරලා තිබුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඉල්ලීම කරේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා සියළු ඇස්තමේන්තු සහ අනෙකුත් සියළු කටයුතු කරන්න කියලා. මොකද හේතුව අපේ නිලධාරීන්ට මේකෙ තියෙන වැඩ කොටසත් එක්ක ඔය ටිකත් ගත්තම කරන්න අමාරුයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණ නිලධාරීන් වෙන් කරලම ඉන්නේ ඔය කටයුත්ත සඳහා. එතකොට මෙහේ නිලධාරීන්ට සැලසුම් කමිටුවේ වැඩ තියෙනවා. මහජන පැමිණිලි ගැන බලන්න තියෙනවා. ඔය ටික කරන්න ගියාට පස්සේ එතන අඩුපාඩුවක් වුණාම අපිට ඒකෙ වගකීම ගන්නත් අමාරුයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඕක කරන එක හොඳයි. මම දකින මතය ඒක.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** හපුගල ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයේ ආයුර්වේද වෛද්‍ය නිලධාරිණිය ස්ථාන මාරු කර ඇති බැවින් ඒ සඳහා අනුයුක්ත කර ඇති ආයුර්වේද වෛද්‍යවරයා වහාම අප ප්‍රාදේශීය සභාව වෙත ලබා දෙන ලෙස ගරු දකුණු පළාත් ආණ්ඩුකාරතුමාගෙන් සහ අදාළ ආයතනවලින් ඉල්ලීම් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙතනදී අපේ හිටපු නිලධාරියාව නිදහස් කරලා තියෙනවා. අපිට එන්න ඕන කෙනාව තාම නිදහස් කරලා නැහැ. ඊළඟට අපිත් එහෙම කරහම ඉවරයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එහෙන් ඉල්ලීමක් කරේ නැද්ද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉල්ලීම් කරලා තියෙන්නේ. ඉල්ලීම් ලිඛිතව යවලත් තියෙන්නේ. ගුරුගේ මහතාට මම කතා කරලා දනුම් දුන්නා කෙනෙක්ව එවන්න කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒකට මොකක්ද තියෙන බාධාව. එහෙම කරන්න බැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අක්මීමන ප්‍රාදේශීය සභාවේ ඉන්න කෙනා තමයි අපිට එන්න ඉන්නේ. අක්මීමන ප්‍රාදේශීය සභාවට එන්න ඕන කෙනා තාම එහෙට ඇවිල්ලා නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක එයාලා බේරගන්න එපැයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** නව කාර්යාල සංකීර්ණය ඉදිකිරිමේදී දැනට තිබෙන කාර්යාල ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම සිදුවන බැවින් නව ගොඩනැගිල්ල ඉදිකරන තුරු කාර්යාලය කුලී පදනම මත ලබාගත් වෙනත් ස්ථානයකට ගෙන යාමට හෝ දැනට තිබෙන ගරාජ දෙක තාවකාලික කාර්යාල බවට පත් කිරීම හෝ වෙනත් සුදුසු විකල්ප ක්‍රියාමාර්ගයක් ගැනීමට හෝ යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම මේ යෝජනාව ඉදිරිපත් කරේ ඉක්මනටම අපිට මේ කාරණය සිද්ධ කරන්න වුණොත් කියන පදනම මත. ඉතිං ඒක සභාව තීන්දු කරන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** සභාවේ ගරාජ දෙක හරිගස්සවමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අපි තීරණය කරලා තියෙන කොට ලේසියි. ඒක අනුමත වෙලා ආපු ගමන් අපිට ඒ වැඩේ කරන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේ පරිශ්‍රයම වෙනස් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ යෝජනාව ස්ථිර කරලා තියමු. එතකොට අපිට කතා කරලා අවශ්‍ය දේ කරන්න පුළුවන්නේ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.** ප්‍රධාන කාර්යාලය සඳහා පරිගණක යන්ත්‍ර දෙකක් සහ මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

සභාපතිතුමා මුද්‍රණ යන්ත්‍රයක් කියලා අදහස් කරේ මොකක්ද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** චෙක් ප්‍රින්ට් කරන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** දැනට ඒකට පාවිච්චි කරන්නේ මොකක්ද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැනට චෙක් අතින් ලියන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** රුපියල් ලක්ෂ එකහමාරක්, දෙකක් වියදම් වේවි. ඩොට් මෙට්‍රික්ස් එකක් නෙමෙයිද ගන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** රුපියල් පහළොස් දාහක විතර එකක් මිලදී ගන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මෙහෙම ප්‍රශ්නයක් තියෙනවා. ඒ මුද්‍රණ යන්ත්‍රයක් ගන්න කොට බොඳ වෙන්නේ නැති තීන්ත තියෙන එකක් වෙන්න ඕන. නිකං ලියුමක් නම් ප්‍රශ්නයක් නැහැ. මේ චෙක්නේ ප්‍රින්ට් කරන්නේ. එතකොට ඒකට හරියන එකක් වෙන්න ඕන. Epson M 100 ප්‍රින්ටරයේ තීන්ත තියෙන්නේ. නමුත් ඒකෙ ලේසර් එක තත්ත්වයෙන් උසස්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක බලලා තියෙන්නේ. ඒක ගැටළුවක් වෙන්නේ නැහැ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06.** තණකොළ කපන යන්ත්‍ර දෙකක් මිලදී ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(තේ පානය සඳහා සභාව කල් තබන ලදී.)**

<u>ගරු මන්ත්‍රීනි ඩී.පී.වාසනා උදයංගනී මැතිණියගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රීනි ඩී.පී.වාසනා උදයංගනී මැතිණිය ඃ- 07.** උළුවිටිකේ, දූවවත්තේ ශ්‍යාමලී මහත්මියගේ නිවසට යන අතුරු මාර්ගය පැති බැම්මක් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔය කොතනද.

**ගරු මන්ත්‍රීනි ඩී.පී.වාසනා උදයංගනී මැතිණිය ඃ-** පහුගිය දවසක පාර කඩා ගෙන ගිය තැන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ටිකිරිජ්ජදූව වත්තද.

**ගරු මන්ත්‍රීනි ඩී.පී.වාසනා උදයංගනී මැතිණිය ඃ-** ටිකිරිජ්ජදූව වත්තේ තමයි. අඩි තුනට තිබුණ පාර අඩි පහට කරපු එක මේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 08.** දිවා කාලයේදී බල ප්‍රදේශය තුළ වීදි පහන් විශාල ප්‍රමාණයක් දැල්වෙමින් පවතින බැවින් ඉදිරි සතිය තුළ ශබ්දවාහිනී යන්ත්‍ර යොදාගෙන මේ පිළිබඳ ජනතාව දැනුවත් කිරීමටත්, මින් ඉදිරියට දිවා කාලයේදී බල ප්‍රදේශය තුළ දැල්වෙමින් පවතින වීදි පහන් ගලවාගෙන ඒමට අවශ්‍ය කටයුතු සූදානම් කිරීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** දැන් ගොඩකන්දේ එක වීදි ලාම්පුවක් තියෙනවා. ඒක හයි කරපු දවසේ ඉඳලා අද වෙනකම් කවදාවත්ම නිවන්නේ නැහැ. ඒක අකුණකටවත් පිච්චෙන්නෙත් නැහැ. මම දැන් මේක පිච්චෙනකම් බලාගෙන ඉන්නේ. මේක මම පෞද්ගලිකවමත් කිව්වා. එතකොට කියන්නේ හොරා ගිහින් කපලා එමු, වයර් එකක් ගලවමු කියලා. එහෙම කරන්න ඕන නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොතනද මේ තැන.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ගොඩකන්දේ වෙන්දේසි ඉඩමක මේක තියෙන්නේ. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට එහා පැත්තේ පාරේ තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපේ අයට කියන්න ඒක ගලවාගෙන එන්න කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මම කිව්වා, නමුත් ඒක වෙන්නේ නැහැනේ. දැන් මාස ගාණක් තිස්සේ මේක ගැන කියනවා. දැන් ඊයේ ඒ කණුව ගාව සුද්ධ කරා. උදේ 10.00 ටත් ඒ වීදි ලාම්පුව පත්තු වෙනවා. ඒක හින්දා දවස් කිහිපයක් ඒකට අවවාද කරලා මේක ගලවන්න. මේ වීදි ලාම්පුව ගැන මම එක දවසක් එහේ රැස්වීමක් තිබුණ වෙලාවකදිත් කිව්වා.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ගරු සභාපතිතුමනි, තව කාරණයක් ඒකට එකතු කරන්න ඕන. එක ස්විච් එකෙන් වීදි ලාම්පු හතරක් පහක් පත්තු වෙන තැන් තියෙනවා. එතකොට ෂෝට් එකක් ආවම ඒවා නිවන්න විදියක් නැහැ. වීදි ලාම්පු දැල්වෙවී තියෙනවා. අපිත් ඒවා නිවන්න බලලා තියෙනවා. නමුත් ඒ වැඩේ කරන්න බැහැ. හැම කණුවකටම එක ස්විච් එකක් ගාණේ සවිකරන්න. මම දැක්කා උක්වත්ත පැත්තේ එහෙම සවි කරලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔය ගැටළුව තියෙන්නේ එක තැනකටයි. වක්වැල්ලේ තියෙන ටිකට තමයි ඔය ප්‍රශ්නය තියෙන්නේ.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ෂෝට් එකක් එහෙම ආපු ගමන් වෙන්නේ දිගටම ඒ ලයිට් ටික දිවා රාත්‍රී මුළුල්ලේම දැල්වෙමින් පවතිනවා. ඊළඟට විවිධ ජාවාරම් වලටත් ඒක කරනවා. මම මීට කලිනුත් ඒක ගැන මේ සභාවේදී කිව්වා. මත්ද්‍රව්‍ය වලට පුරුදු වුණ අය ඒ ස්විච් එක නිවනවා. ඊට පස්සේ තමයි ඒක නැවත දාන්නේ. කවුද දාන්නේ, කවුද නිවන්නේ කියලා කවුරුවත් දන්නේ නැහැ. එළිවෙනකොට තමයි එහෙම දෙයක් වෙලා කියලා දන්නේ. සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා ඒ නිසා වීදි පහන් තියෙන හැම කණුවකටම ස්විච් එකක් බැගින් ලබා දෙන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 09.** බල ප්‍රදේශය තුළ පිහිටි අප ප්‍රාදේශීය සභාව සතු ඉඩම් වල ප්‍රාදේශීය සභාව මගින් හෝ බල ප්‍රදේශයේ ලියාපදිංචි සංවිධාන මගින් තාවකාලික බෝග වගා කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒ ප්‍රදේශයේ තියෙන ලියාපදිංචි ස්වෙච්ඡා සංවිධානයකින් හෝ අපි විසින් හෝ ඒක කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකෙදී අපිට පොඩි ගැටළුවක් මතු වෙනවා මන්ත්‍රීතුමා. අපි ඒ ඉඩම් කැබලි වෙන් කරලා තියෙන්නේ ඒ ප්‍රදේශයේ මේ ඉඩම්වල පදිංචි වෙලා ඉන්න පදිංචිකරුවන්ගේ පොදු පහසුකම් සඳහා. ඉතිං ඒකෙදී අපිට බෝග වගා කරන්න දෙන්න බැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒ ඉඩම් දැනට පාවිච්චි කරන්නේ නැති හින්දා වගා කරන්න කියන්නේ තාවකාලික භෝගනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ යෝජනාවේ පොඩි අඩුපාඩුවක් තියෙනවා. ඒ අඩුපාඩුව තමයි මේකෙ තියෙන්නේ. එහෙම නැත්නම් වහපු ළිං තියෙන තැන් වලත් මේක කරන්න පුළුවන්. ඒ වගේ තැන් නිකං තිබුණම කවුරුහරි අල්ලා ගන්නවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** තාවකාලික භෝග වගා කරන නිසා අවශ්‍ය වුණොත් ඒ ටික ගලවලා ඉඩ දෙන්න පුළුවන්නේ. අනිත් එක ඒ ප්‍රදේශයේ තියෙන සමිතියටනේ මේක භාර දෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක මෙහෙමයි. ඇතුළේ කවුරුහරි කරනවා නම් කමක් නැහැ. ඕකට පිටින් ගෙනල්ලා කරොත් ප්‍රශ්නයක්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** එහෙම නෙමෙයි. සමිතියකටනේ දෙන්නේ. පුද්ගලිකව කිසිම කෙනෙකුට ලබා දෙන්නේ නැහැ. එක්කෝ අපේ සභාවේ සේවකයන් යොදවලා මේක කරන්න ඕන. ඒ වත්තේ සමිති තියෙනවානේ.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** අපි ඒක සභාවෙන් කරමු.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** දැන් අර රියල් ප්ලේස් එකේ කහ වගාවක් දාන්න ලැස්ති කරලා තියෙනවා. මම ඒකත් අරමුණු කරගෙන තමයි මේක යෝජනා කරේ. ඒ ලියාපදිංචි සමිතිය හරහා ඒක කරන්න පුළුවන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 10.** ගොඩකන්ද පන්සල වත්ත මාර්ගයට අවහිර වී ඇති ගස්වල අතු කපා ඉවත් කිරීමට අවශ්‍ය රැකවරණය ලබාදීමටත් එහි වියදම මාර්ගයේ ගමන් කරන නිවාස හිමියන්ට පැවරීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මේ අර පහුගිය දවසක අපි කතා කරපු ප්‍රශ්නය. ඒ වගේම සභාපතිතුමා ගොඩකන්ද මාර්ගය කියන්නේ ඔබතුමා නිතරම යන එන මාර්ගයක්. ඒ මාර්ගයේ අඹ ගහක් තියෙනවා. මම දැන් අවුරුදු ගාණක් තිස්සේ ඒක අයින් කරන්න කියලා යෝජනා දාලා තියෙනවා. ඒක වැට මායිමේ තියෙන්නේ. පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයිති මාර්ගයක් මේක. දැනට විදුලිබල මණ්ඩලයෙනුත් මේක කපා ඉවත් කරන්න කියලා තියෙනවා. ගොඩකන්දේ සංස්කෘතික මධ්‍යස්ථානයට මෙහා මේක තියෙන්නේ. ඒ අවට නිවාස හිමියන් කිහිපදෙනෙකුත් මේක ගැන මට කිවුවා. මේකට විශාල වියදමක් යනවා. වයර්වල අස්සෙන් අතු ගිහිල්ලා තියෙන්නේ. ඒක දරට කපාගෙන යන්න හරි අනුමැතියක් ලබා දෙමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකෙ රිසවේෂන් ඇත්තේ දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට. මේක අපේ ප්‍රාදේශීය සභාව සතු පාරක් නෙමෙයිනේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මේක දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සතු පාරක්. අනතුර ඉවත් කිරීමට අපිට වගකීමක් තියෙනවානේ. ඒක හින්දා ඒ ආයතනයෙනුත් මම ලියුමක් ගන්නම්. අපිත් මැදිහත් වෙලා ඒක කාටහරි කපාගෙන යන්න දෙන්න බලන්න. අඹ ගහක් තියෙන්නේ. ඒක කපන්න බැහැ. වයර් අතරින් අතු ගිහිල්ලා තියෙන්නේ. ඒ නිසා කැපුම් කුලිය යනවා විශාල මුදලක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි ඒකෙ යෝජනාව දාලා බලමු.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒක ඉක්මනට මේවා කරලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒ වගේම සභාපතිතුමා විදුලිබල මණ්ඩලයත් පහුගිය කාලයේදී අපි පාරවල් සුද්ධ කරලා ගියාට පස්සේ අතු කපලා එතනම දාලා යනවා. ඒවා කාණුවල හිරවෙනවා. මම මීට කලින් ඒකට යෝජනාවක් දැම්මා දැනුවත් කිරීම කරන්න කියලා. ගියපාරත් ගස්වල අතු කපලා දාලා සම්පූර්ණ කාණුවක්ම අවහිර වුණා. වැහිකාලයට කොළරොඩු ගිහිල්ලා හිරවෙලා අර කාණු ඔක්කොම උතුරනවා. ඒකට නැවතත් විදුලිබල මණ්ඩලය දැනුවත් කරන්න. ඒකට යෝජනාවක් දාලා තියෙන්නේ.

<u>ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මම මගේ පළවෙනි යෝජනාව ඉල්ලා අස්කර ගන්නවා. ඒක අපි යම් මට්ටමකින් කරලා තියෙනවා. ඒකට යෝජනාවක් දාන්නම් පාර කොන්ක්‍රීට් කරන්න කියලා.

**12.** බල ප්‍රදේශය තුළ දෛනිකව එක්රැස්වන දිරාපත්වන කසළ උපයෝගී කරගෙන කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මම මේ යෝජනාව ගැන කෙටියෙන් කියන්නම්. ඒකට සභාපතිතුමත් යෝජනාවක් ඉදිරිපත් කරලා තියෙනවා. ඒකට විධිමත් වැඩපිළිවෙලක් සකස් කරන්න කියලා මම යෝජනා කරනවා කාබනික පොහොර වල අවශ්‍යතාවය දැන් තියෙන හින්දා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 13.** අප ප්‍රදේශීය සභාව සතු කාපට් යොදා සංවර්ධනය කරන ලද මාර්ගයන් වල ජල නල එලීම සඳහා වෙනත් විකල්ප ක්‍රමයක් නොමැති අවස්ථාවල මාර්ගය පළුදු කිරීම සඳහා වූ ගාස්තු සංශෝධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒක සඳහන් වෙන්නේ මෙහෙම. අලුතෙන් කාපට් දාපු පාරවල් තියෙනවා. ඒ පාරවල් වලට අය කරන ගාස්තු ගත්තොත් ඒ පාරවල් කවදාවත් හදා ගන්න වෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමා දැන් මේ වෙනකොටත් බෝගහවේල්ල පාරේ වැඩ කටයුතු අවසන් වෙලා නැහැ. හැබැයි දෙපලක් කඩලා තියෙනවා. දැන් ඊයේ යනකොට තව තැනක් කඩලා තිබුණා. සේරියගොඩ පාරේ තැන් තුනක් කඩලා තියෙනවා. මේකට එක්කෝ පාරවල් කාපට් කරන එක නවත්වන්න ඕන.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ගරු සභාපතිතුමනි, මේක ගැන ඇත්තටම කියන්න කණගාටුයි. බටුවන්තුඩාව පාර කාපට් කරන්න ඇවිල්ලත්, තාර දාලා පිළිසකර කරන්න යෝජනා කරා. මොකද එහෙම කරේ ඒ පාර කැඩීමට තියෙන නිසා. බට ලයින් එකක් යන්න තිබුණා ඒ පාරේ. නමුත් අවුරුදු පහක්වත් ඒ වියදම් කරපු සල්ලි භාවිතා කරන්නේ නැතුව පාරට කාපට් දැම්මා. කමක් නැහැ. ඒකත් ගමේ මිනිස්සුන්ට හොඳයි. දැන් ඇත්තටම කියනවා නම් ඒ පාරේ බට ලයින් එකක් යනවා. කලින් තාර දාන කොටත් ඒ කට්ට ටිකක් ඉතුරු කරලා තිබ්බේ බට ලයින් එක දාන්න අවශ්‍ය වුණාම ඒක ප්‍රයෝජනයට ගන්න. ඇත්තටම මේ කරන්නේ ජාතික අපරාධයක්. කාපට් එකක් කඩනවා කියන්නේ සල්ලි කීයක්ද, මේ ජනතාවගේ සල්ලිනේ. කොච්චර වැහුවත් කාපට් එකක් කැඩුවට පස්සේ ඒක කැඩි කැඩී යනවා. ඒක වැඩක් නැහැ. ඇත්තටම මේක අපරාධයක්. ඉදිරියටවත් මේක ගැන ටිකක් හොයලා බලලා වැඩ කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඕකට ගරු සභාපතිතුමා අපි අදහසක් විදියට යෝජනාවක් ඉදිරිපත් කරා. ඇස්තමේන්තුවටම බට දාන්න ඇතුළත් කරන්න කියලා අපි කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි අබේසේකර මන්ත්‍රීතුමා. දැන් ඔතන ප්‍රශ්න දෙකක් තියෙනවා. එකක් මිනිස්සුන්ට අවුරුදු ගාණක් තිස්සේ ඉඳන් වතුර හම්බවුණේ නැහැ. අවුරුදු හතරක් විතර පෝලිමේ ඉඳපු අයට තමයි දැන් එක දිගට වතුර හම්බවෙන්නේ. ඉතිං එතනදී ඒ ගැටළුව මූලික වශයෙන් තියෙනවා. අපි ඒක මේ වෙලාවේදී නවත්වන කොට මිනිස්සු බොහොම ආවේගශීලිව හැසිරෙනවා. ඒක පළවෙනි කාරණය. දෙවෙනි කාරණය තමයි අපි කොයි වෙලාවකවත් කාපට් පාරවල් හරහා කඩන්න මෙතෙක් අවසර දුන්නේ නැහැ එදා ගනිපු සභා තීන්දුවෙන් පස්සේ. නමුත් වෙලා තියෙන්නේ ප්‍රධාන බටය ගිහින් තියෙන්නේ පාර ඇතුළෙන්. දැන් පාර යටින් තමයි බටය ගිහින් තියෙන්නේ. එතකොට බටය හිල් කරලා වතුර ගන්න පාර සන මීටර් දශම තුනක් කොහොමත් කැඩෙනවා මොන ක්‍රමයෙන් හරි. ඔන්න ඔතනයි ප්‍රශ්නය තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි මීට ඉස්සරත් මේ අදහස් කියලා තියෙනවා. ඒක යෝජනාවක් විදියට ගේන්න බැරිවුණා. ඒක දැන් ඉඳලම ක්‍රියාත්මක කරන්න. ඒකට සභාව විරුද්ධ වෙන එකක් නැහැ. තාර පාරක්, කොන්ක්‍රීට් පාරක් වුණත් ඇස්තමේන්තුවට බටයක් දාන්න ඇතුළත් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** චනක මන්ත්‍රීතුමා එහෙම දැම්මා මතකනේ. පන්විල පාරේ කීපයක් දා ගත්තා. සමහරු වතුර ඕන නැහැ කියනවා. නමුත් පාර කාපට් කරාට පස්සේ කුප්පකමටද මම දන්නේ නැහැ වතුර ගන්නවා. පාර කාපට් කරලා ඉවර වුණාට පස්සේ තමයි වතුර ගන්න ඕන වෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** බටයක් අපි දැම්මොත් වතුර ගන්නකොට ඒක අයකර ගන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා දැන් අපිට රුපියල් දෙදාහක්, තුන්දාහක් තමයි ගෙවන්නේ පාර කඩනවට. කාපට් මාර්ගයක් කඩන්න ගණන් වැඩි කරන්න. එතකොට ඒ අයට දෙපැත්තෙන් විදලා වතුර ගන්න යන්නේ රුපියල් පහලොස්දාහයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට මන්ත්‍රීවරුන්ගෙත් යුතුකමක් තියෙනවා. දැන් වෙච්ච දේ පැත්තකට තියමුකෝ. ඉස්සරහට කාපට් කරන්න ඕන පාරවල් වලට හරි ඒ අදාළ පාර දෙපැත්තේ අයව දැනුවත් කරන්න ඕන. ඔබතුමන්ලා පාරවල් කාපට් කරනකොට බලන්න යනවානේ. පාර දෙපැත්තේ

ඉන්න අයව දැනුවත් කරන්න වතුර ලබා ගන්න අදහසක් තියෙනවා නම් ගැල්වනයිස් බටයක් දාලා තියන්න කියලා.

**ගරු මන්ත්‍රිනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** ගරු සභාපතිතුමා, මම පිලාන කඩේ ගාව ඉඳන් පාර කාපට් කරනකොට දෙපැත්තේ මිනිස්සුන්ට දැනුම් දුන්නා බට දාගන්න කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඇයි අපිට බැරි ඇස්තමේන්තුවට දාලා බටයක් දාන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අපිට මාර්ග සංවර්ධන අධිකාරියට කියන්න බැහැ. ඒක පුද්ගලිකව වතුර ගන්න ඕන මිනිස්සු කරන්න ඕන වැඩක්. අපිට ඒක කියන්න බැහැ අබේසේකර මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාවේ යෝජනාවක් ගෙනැල්ලා ඒක දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට දැම්මම ඒක රජයේ තීරණයක් වෙනවා. එතකොට ඒකට බැහැයි කියන්න බැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි සම්බන්ධීකරණ කමිටුවට ඒ යෝජනාව යවමු.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** සභාපතිතුමා ජල නල අලුතෙන් ගන්නකොට අපේ සභාවේ කාපට් පාරවල්, මාර්ග සංවර්ධන අධිකාරියට අයිති පාරවල් හැරෙන්න සාමාන්‍ය තාර පාරවල් වලදී අපි පාර පළුදු කරනකොට මුදලක් අයකරනවානේ ඒ පාරිභෝගිකයාගෙන්. නමුත් කවදාවත් අපි විසින් ඒ වළ වහන්නේ නැහැ. කවදාවත් එහෙම කරලා නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැත්තේ නැහැ. අපි පාරවල් ප්‍රීමික්ස් කරන කාලයේදී පළවෙනි වටයේදී මන්ත්‍රීවරුන්ට අවස්ථාව ලබා දුන්නා තමන්ගේ කොට්ඨාශවල පාරවල් අළුත්වැඩියා කරන්න. දෙවැනි වටය ලබා දුන්නේ ඕවා වහන්න. එතකොටත් මන්ත්‍රීවරු චෝදනා කරා මන්ත්‍රීවරුන්ට අවස්ථාව දෙන්න ඕන කියලා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** පාරවල්වල ප්‍රීමික්ස් දානකොට ඒවා තිබුණොත් වහනවා. ඒ ප්‍රීමික්ස් ව්‍යාපෘතියේදී ඇත්ත වශයෙන්ම පාරක් ඉවර වෙනකම් කරා තමයි. ඔය වගේ තැන් දෙක තුනක් එතකොට අහුවෙන්න ඇති. නමුත් අපි මේ පළුදු කරන ස්ථාන කඩිනමින් වහන්න වැඩපිළිවෙලක් හදන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ වුණාට මන්ත්‍රීතුමා ඒක කියන්න එපා. මේ මුළු සභාවම ඒකට සාක්ෂි දරාවි. පළවෙනි වටය මන්ත්‍රීවරුන්ට දීලා දෙවැනි වටය අපි ආරම්භ කරේ ඕවා වහන්න. එතකොට මන්ත්‍රීවරු පැනලා ඒක වෙනස් කරා. අපි අවංකව කතා කරමු. දැන් චෝදනාව එනවා ඒක කරේ නැහැ කියලා. ඉදිරියටත් ප්‍රීමික්ස් හදනවා. එතකොට කරන්නේ ඔය දේ. මන්ත්‍රීවරු එන්න එපා අපේ පාරවල් කැඩිලා කියන්න එතකොට.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** නව සැපයුම් විශාල ප්‍රමාණයක් ලබා දෙනවානේ. හාර දහසක් විතර ලබා දෙනවා. ඒ නිසා ඉක්මනින් ඒක ප්‍රීමික්ස් දාලා හදලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පොදුවේ නෙමෙයි මම කියන්නේ කොට්ඨාශවල ඒවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපි කොහොම හරි ඒක කරගමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 14.** ශ්‍රී පියරතන පටුමගේ සිට හසරලි උත්සව ශාලාව දෙසට විහිදී ඇති මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමාගේ යෝජනා**

**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා ඃ- 15.** උක්වත්ත, මැදගොඩ, හාමිනාවත්ත මාර්ගයේ නිවාස පහකට පමණ නල ජලය ලබා දීම සඳහා නල එලීමේදී මාර්ගය පළුදු වන බැවින් මෙය පොදු කටයුත්තක් සේ සලකා එම කාර්යය මුදල් ගෙවීමකින් තොරව සිදුකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකෙ පවුල් කීයක් ඉන්නවාද.

**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා ඃ-** පවුල් හයක් ඉන්නවා. නිවාස දොළහක් විතර තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ පාර කොච්චර දිගද, දුර ප්‍රමාණය කොච්චරද, පාර කැඩෙන දුර ප්‍රමාණය කොච්චරද.

මෙහෙමයි මන්ත්‍රීතුමා. අපි ලියුමක් දෙන්නම් ඒ යන අලාභය අපි දරා ගන්නවා කියලා. ඒ පාර සභාව විසින් අළුත්වැඩියා කරනවා කියලා කියන්නම්. ඔබතුමා ඊළඟට මොකක් හරි ක්‍රමයකින් ඒ පාර හදලා දෙන්න.

**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා ඃ-** ඒ පාර හදන්න ප්‍රතිපාදන දාලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕකට අන්තිමට එගොඩ වත්ත පාරට වෙච්ච දේ වේච්ද දන්නේ නැහැ. මිනිස්සු කිවුවා අපිට පාර නැති වුණත් කමක් නැහැ වතුර ටික අරන් දෙන්න කියලා. අපි කරේ කොන්ක්‍රීට් කරපු පාර කැඩුවා. වතුර ටික ගහිපු දවසේ ඉඳන් බනිනවා අපේ කැලි යන්න. පාර කැඩුවා, ඒ නිසා දැන් යන්න බැහැ කියලා කියනවා. ඒක ඔබතුමා කොට්ඨාශය තුළ බේර ගන්නවා නම් ගැටළුවක් නැහැ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 16.** ගාල්ල බද්දේගම මාර්ගය සංවර්ධනය කිරීම කාලීන අවශ්‍යතාවයකි. වැදගත් අත්‍යාවශ්‍ය කටයුත්තක් වන එම කටයුත්ත නිසි ආකාරව සිදු කරනවාද යන්න සොයා බැලීම සෑම පුරවැසියෙකුගේම අයිතිවාසිකමකි. මේ නිසා එම ව්‍යාපෘතියේ BOQ එක මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලබා ගැනීමට කටයුතු කරන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක ගැන ඔබතුමන්ලාට කියන්න ඕන. ඒකෙන් ඉල්ලුවේ වෙන මොකක්වත් නෙමෙයි. දැන් මේ පාර ඉතාම වටිනා දෙයක්. මේක කෙරෙන්නම ඕන වටිනාම දෙයක්. හැබැයි මේක වැරදියට කෙරුණොත් හොඳ නැහැ. මම ඔබතුමන්ලාට බලාගන්න මේවා කරන්නම්. මම සභාවේ කතා කරපුවත් තියෙනවා. මේ හෝළුවාගොඩ ව්‍යාපාරය නිසා විනාශ වෙලා ගිය කට්ටියක් ඉන්නවා. ඒ නිසා මේ පාර මේ විදියට කරොත් එහෙම ගරු සභාපතිතුමනි ඒක ඉවරයි. අර බෝල්ඩර්ස් ගිහිල්ලා දානවා. මම ඔබතුමන්ලාට අහන්න සලස්වන්නම් අවශ්‍ය නම් ඉංජිනේරුතුමිය කතා කරන දේවල්. ඒ ඉංජිනේරුතුමිය එක පැත්තකින් දේශපාලඥයින්ට චෝදනා කරනවා. අනිත් පැත්තෙන් ඉඳගෙන කියනවා අරක කරනකම් අපි මේක කරන්නේ නැහැ කියලා. ඒ පාර ඉඳගෙන කියනවා අපි මේ පෙරහුරු පරීක්ෂණයක් කරන්නේ කියලා. ඒ කියන්නේ බෝල්ඩර්ස් දාන එක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔය වගේ තැනක පෙරහුරු පරීක්ෂණ කරන්න බැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔය පෙරහුරු පරීක්ෂණයක් නෙමෙයි. කරන්න ගියේ බෝල්ඩර්ස් ටික දාලා ඒක උඩින් පාර යන්න. ඊට පස්සේ ඉවරයි. ඒ නිසා තමයි මම ඒ අදහසින් මේක ගෙනාවේ. මේ ව්‍යාපෘතිය ඉතාම වැදගත්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 17.** හෝළුවාගොඩ සංවර්ධන ව්‍යාපෘතිය ඉතා වැදගත් අත්‍යාවශ්‍ය කාර්යයක් වන අතර එය නිසි ආකාරව සිදු වනවාද යන්න සොයා බැලීම බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ වගකීමකි. එම නිසා එම ව්‍යාපෘතියේ BOQ එක අදාළ ආයතනයෙන් ලබා ගැනීමට කටයුතු කරන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මොකද ඒ ව්‍යාපෘතිය කවදාහරි දවසක සභාවට පැවරෙන ව්‍යාපෘතියක්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අබේසේකර මන්ත්‍රීතුමා ටෙන්ඩර් කරලා කොන්ත්‍රාත් දීලා කරන වැඩක් නෙමෙයි. ඒක නාගරික සංවර්ධන අධිකාරියෙන් කරන කාර්යයක්. ඒකෙ BOQ එක ගන්න පුළුවන්ද කියලා මම දන්නේ නැහැ. ඒකට මම උත්සාහයක් දරලා බලන්නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඒ ව්‍යාපෘති වාර්තාව හා ලේඛන සභාගත කරන්න කියලා මම යෝජනාවක් කරා. මාර්තු මාසයේ සභාවට මම ඒ යෝජනාව කරේ. මාර්තු මාසයේ සභාවට කරපු යෝජනාව අප්‍රේල් සභාවට කලින් දවසේ ලැබුණා ඒක යොමු කරා කියලා. දැන් මේ ජූලි මාසය. ඒ සම්බන්ධව ක්‍රියාමාර්ගයක් ගනිපු බවක් පේන්න නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අර ගැටළුව තියෙන්නේ. ඒක සෘජු ශ්‍රමික පදනම මත කෙරෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේක ඉල්ලලා යවන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අයගේ යන්ත්‍ර සූත්‍ර යොදවලාම තමයි ඒක කරන්නේ. වෙන කාගේවත් ඒවා නෙමෙයි, රජයේ යන්ත්‍ර සූත්‍ර වලින්ම තමයි ඒ කාරණය කෙරෙන්නේ. ඒකට ඒ අය BOQ එකක් හදලද කියලා නම් මම දන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මූල්‍ය කාරණා ගැන නෙමෙයි අපි ඉල්ලන්නේ. ව්‍යාපෘතියක් කරන කොට ඒකට වාර්තාවක් තියෙනවානේ. ඒක සභාගත කරන්න කියලා අපි ඉල්ලන්නේ. ඒකෙ වංචාවක් වෙනවා කියලා නෙමෙයි අපි කියන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** වංචාවක් නෙමෙයි, අදට වෙන දේ තමයි මේ කියන්නේ. විශේෂඥ දැනුමක් නැති වුණත් අපිට පේන එක තමයි කියන්නේ. දැන් අර පස් දාන්නේ හැල් මඩ උඩට. එතකොට මොකක්ද වෙන්නේ. වතුර වැටුණ ගමන් අරක නැවත විහිදිලා යනවා. ඒක ගැන මම චමින්ද මන්ත්‍රීතුමා එක්කත් කතා කරා. එතුමාගේ ප්‍රදේශය නිසා තමයි විශේෂයෙන්ම කතා කරේ. ඇත්තටම ඒක මේ විදියට කෙරුණොත් එහෙම ලොකු අපවාදයක් එනවා. ඒ නිසා ඒවා ගැන ඔබතුමන්ලා දැනුවත් කරලා මේක හරියට කරන්න. ඒක වටිනා වස්තුවක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 18.** නීතිවිරෝධි අන්දමින් නාගරික සංවර්ධන අධිකාරිය අවසර ලබා දී ඇති වෙන්දේසි ඉඩම් වල නිවාස සැලසුම් අනුමත නොකරන ලෙසත්, දිගින් දිගටම නාගරික සංවර්ධන අධිකාරිය කරනු ලැබ ඇති නීතිවිරෝධි ක්‍රියාවන්ට එරෙහිව සංකේතාත්මක පැයක විරෝධතාවයක් නාගරික සංවර්ධන අධිකාරිය ඉදිරිපිට මහජන නියෝජිතයන් වන අප පක්ෂ භේදයකින් තොරව කිරීම සඳහා කඩිනමින් දිනයක් යොදා ගන්නා ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා ඔබතුමා මේවා ගැන බලන්න ගිහිල්ලා. ඔබතුමන්ලා මුලින්ම වතුර ටැංකියට යන පාරේ එකට ගිහින් බලන්න. ඒක ටිකෙන් ටික ඒ අය විකුණනවා. මේක වහාම නතර කළ යුතු දෙයක්. ඊළඟට දැන් මොකක්වත් නැතුව කපුහෙම්පල තියෙන ඉඩම ගැන ගිහින් බලන්න. අධිබල විදුලි රැහැන් පද්ධතියක් යට ඒක තියෙන්නේ. මොන හේතුවක් නිසාවත් එතන අනුමත කරන්න බැහැ. ඊළඟට අපේ මන්ත්‍රීවරු පස් දෙනෙක් විතර ගිහින් ඒක ගැන බැලුවා. ඉන්දික මන්ත්‍රීතුමා, සුගත් මන්ත්‍රීතුමා, ලියනගේ මන්ත්‍රීතුමා, ප්‍රියන්ත මන්ත්‍රීතුමා යන අය ගිහිල්ලා බැලුවා. දැන් වෙනකොට එක ගෙයක්වත් හදලා නැහැ. පාරකුත් නැහැ. ඊළඟට තව එකක් තියෙනවා, කාණු පුපුරලා ඉතිං මේක නම් සහෝදර මන්ත්‍රීවරුනි සිද්ධ වෙන්නේ ඒකට ඔබතුමන්ලාටත් ලොකු චෝදනාවක් එනවා. ඒ නිසා මේක නරක විදියට කෙරෙනවා. මගේ ඊළඟ යෝජනාවෙන් කියනවා මේකට විසඳුමක් විදියට කරන්න ඕන දේ. මොකද මේ සහතිකය දෙන අයට මේක වහාම නතර කරවන්න විරෝධය පාන්න අපි දිනයක් දා ගමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක කරන්න අබේසේකර මන්ත්‍රීතුමා. මනුස්සයෙක් මොන ක්‍රමයෙන් හරි ඉඩමට අවසර ගත්තට පස්සේ, ඒ ඉඩම මිලදී ගත්තට පස්සේ ඒ අය ඒක මිලදී ගත්තට දන්නේ නැහැ මේක නීතිවිරෝධිද, මේකට සභාව අකමැත්තෙන් ගියාද, නාගරික සංවර්ධන අධිකාරියේ අතයට ගනුදෙනු වලට ගියාද කියලා. ඒවා ගැන මේක මිලදී ගන්න මනුස්සයා දන්නේ නැහැ. ඉතිං එහෙම එකකට අපිට සැලසුම් අනුමත කිරීම නවත්වන්න බැහැ. ඒකට මිනිස්සුන්ගෙන් අපිට එතකොට ගැටළුවක් වෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අනුමත කරන එක පැත්තකට දාන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සැලසුම් අනුමත කිරීමේදී නීතියක් තියෙනවානේ. විදුලි රැහැන් තියෙනවා නම් ඒක කරන්න බැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කිවුවේ ඒකට නෙමෙයි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මේක තනි තට්ටුවට හදන්න දෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැනේ මන්ත්‍රීතුමා. අපි ඇහුවානේ ඒක ගැන විදුලිබල මණ්ඩලයෙන්. ඒකෙ නිර්ණායක ඒ අය ඉදිරිපත් කරනවානේ. ඒ අය ඉදිරිපත් කරන නිර්ණායක වලට අපි මොනවාද කරන්නේ. ඒකට අදාළ ආයතනය විදුලි බල මණ්ඩලයනේ. ඒ අය කියන්නේ තට්ටු දෙකට අනුමත කරන්න බැහැ, තනි තට්ටුවට අනුමත කරන්න කියලා. ඒ අය කියන්නේ විදුලි රැහැන් වලට උස මෙච්චරයි, මෙන්න මේ ප්‍රමාණය තුළ මේක කරන්න කියලා. ඒ අය එහෙම කිවුවට පස්සේ මොකද කරන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා මේ අහන්න. අපි ඒක තමයි කියන්නේ. මේකට විදුලිබල මණ්ඩලයද, වෙන කවුරු හරිද වැරැද්ද කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට එවලා තියෙනවානේ ලිඛිතව.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ ලිඛිතව එවපු එක හොඳට බලන්න. ඒක ගෙනල්ලා බලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙතන කලේගාන එහා පැත්තේ එහෙම එකක් වුණා. සපිරි හාඩ්වෙයාර් එක පිටිපස්සේ. ඒකට ලිඛිතව එවුවා මේ විදියට කරන්න ඕන කියලා. ඔබතුමා දන්නවාද, ඒ ක්‍රමය වැරදියි. අපිත් එකඟ නැහැ ඒකට. අපි දැන් මේ එක තැනකින් විතරක් අල්ලා ගෙන මේක නවත්වා ගෙන ඉන්නේ. විජයානන්ද මාවතේ ඉඩමට කැබලි සැලැස්ම පවා අනුමත කරලා දීලා ඉවරයි. දැන් තියෙන්නේ අනුකුලතා සහතිකය දෙන්න. අපි ඒකෙන් තමයි මේක හිරකර ගෙන ඉන්නේ. දැන් අපේ ක්‍රමය වෙන එකක්. අපි කමිටුවෙන් අනුමත කරන්නේ මෙහෙමයි. ප්ලෑන් එකයි, අනුකුලතා සහතිකයයි දෙකම අපි අවසානයේදී දෙන්නේ. ඔය ඔක්කොම ඉවර කරලා, ගිවිසුම් ගහලා 1% ක් දුන්නට පස්සේ තමයි අපි අනුමැතිය දෙන්නේ. නමුත් අර අය සංවර්ධන බලපත්‍රයක් එක්කම කොන්දේසි ටිකත් පිටිපස්සේ ලියලා දෙනවා. එතකොට ඒකෙන් සංවර්ධනය නොකරම මිනිස්සුන්ට ඉඩම විකුණන්න පුළුවන්. ඒ ප්ලෑන් එකටම ඉඩම විකුණන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ වැරැද්දට විරුද්ධව නාගරික සංවර්ධන අධිකාරිය ඉස්සරහ අපි පැයක් ලගින්න ඕන. මොකද මේ අය දිගින් දිගටම මේක කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමන්ලා ගිහිල්ලා ලගින්න. මගේ කිසි ප්‍රශ්නයක් නැහැ. නමුත් මම සැලසුම් කමිටුවට නිලධාරීන් ගෙන්වා ගන්න ඕන. දැන් පහුගිය මාස දෙකේ ලිපිගොනු 400 ක් විතර හිරවෙලා තියෙනවා. කිසි ප්‍රශ්නයක් නැහැ. ඔබතුමන්ලාගේ දේට මම එකඟයි. ඒකට මගේ කිසි තර්කයකුත් නැහැ. මම ඒක නැහැයි කියන්නේ නැහැ. රොස්වුඩ් වත්තේ වතුර ටැංකිය පාරේ කරපු ඉඩම් වෙන්දේසියට මම අදටත් විරුද්ධයි. ඕන පරීක්ෂණයක් දාන්න. මම ඒකට එකඟයි. ඒකෙ කිසි ප්‍රශ්නයක් නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේකට සභාපතිතුමා කොහෙන් හරි පටන්ගැන්මක් තියෙන්න ඕන. නැත්නම් මේ අය දිගටම මේ වැඩේ කරගෙන යනවා. දැන් මේකෙදී ඔබතුමා නිකං හිතන්න මෙහෙම. අපි දන්නවා ටෙලිෆෝන් ටවර් ඉදිකරන කොට හතරවටෙන්ම මීටර් හැටපහක් වට ප්‍රමාණයේ ඉන්න අයගේ කැමැත්ත ගේන්න ඕන කියලා. ඉතිං උක්වත්තේ අයගෙන් කැමැත්ත ගෙනාපු හැටි අපි දන්නවානේ. වතුර දෙන්නම් කියලානේ ඒ කැමැත්ත ගෙනාවේ. ඒකෙ තේරුම මිලේච්ඡ මේවා එකක්. ඒ කියන්නේ මැරෙන්න කැමති නම් දෙනවා වගේ. ඒ ටවර් එකේ උස මීටර් හැට ගාණක්. එතකොට මේක වැටුණොත් වෙන අනතුර නිසා තමයි මේ අයගෙන් කැමැත්ත ගන්නේ. අනිත් එක කිරණ වලින් වෙන හානිය වෙනයි. එතකොට මේ කියන එකේ වොට් තිස්තුන්දාහ නෙමෙයි තියෙන්නේ. මේ ටවර් එකක් වැරදිලාවත් මේවා වුණොත් වෙන හානියට මොකද කරන්නේ. මේවාට එක්කෝ අපි කොන්දේසි දාන්න ඕන. අනිත් එක මේ විදියට නාගරික සංවර්ධන අධිකාරියෙන් මෙහාට නිලධාරීන් එවන්නේ නැත්නම් ඒකට කරන්න දෙයක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා ඔබතුමා මොනවද කියන්නේ. මම දැන් කිව්වානේ. ඒ මිනිස්සුන්ට දැන් වුණත් ඕක අතහැරලා දාලා යන්න පුළුවන්. අපි වෙන එකකදී අල්ලා ගන්නවා හැරෙන්න ප්ලෑන් එක කෙළින්ම අනුමත කරලා දීලා ඉවරයි. ඔය කියන එකට අවසර දීලා ඉවරයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ දීපු එක කරුණාකරලා සභාගත කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැනටම ගොඩනැගිලි අයදුම්පතක් ඇවිල්ලා. ඔන්න තත්ත්වය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ මිනිස්සුන්ව අපි දැනුවත් කරන්න ඕන තත්ත්වය මේකයි කියලා. මේක හරි ක්‍රමයක් නෙමෙයිනේ. නාගරික සංවර්ධන අධිකාරියට ඔක්කොම දීලා කර ගන්න කිව්වා නම් ඉවරයි එහෙමනම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අධිවේගී මාර්ගයේ ඉඳන් මීටර් 300 ක් ඇතුළතට අයිති වෙන එකක් මේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේකට දිනයක් පක්ෂ භේදයකින් තොරව දා ගන්න. නාගරික සංවර්ධන අධිකාරිය ගෙනියන මේ විධික්‍රමයට විරුද්ධව අපි පැය කිහිපයක සංකේත වැඩවර්ජනයක් කරමු. ඉස්සෙල්ලම අපි ආණ්ඩුකාරතුමාව හම්බවෙන්න ගිහින් දැනුවත් කරමු මේක මෙහෙමයි කියලා. කීපදෙනෙක් හරි යමු. ඒක ගැන දැනුවත් කරලා ඉවරවෙලා අපි නාගරික සංවර්ධන අධිකාරිය ළඟට ගිහිල්ලා මේ වැඩේ කරමු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ අදාළ ආයතන මේවාට කටයුතු කරන්නේ නැත්නම් අපි ක්‍රියාමාර්ග ගන්නවා කියලා කියන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි ක්‍රියාමාර්ග ගන්නවා කියලා කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 19.** වෙන්දේසි ඉඩම් සඳහා වරලත් ඉංජිනේරුවන් කිසිදු සොයා බැලීමකින් තොරව දෙනු ලබන සහතික පිළිබඳව ඔවුන් ලිපියක් මගින් දැනුවත් කිරීමටත් එහි සියළු වගකීම් ඔවුන් පෞද්ගලිකවම දැරිය යුතු බවත් එම ලිපියේ සඳහන් කළ යුතු බවටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක ලිපියක් මගින් දැනුවත් කරන්න ඕන. ඔබතුමන්ලා මේක බලලා කියන්න කිසිම ප්‍රමිතියක් නැති ඒවාටත් සහතිකය ලබා දෙනවා කියලා. අපිට ඒකට කියන්න ඕන තරම් දේවල් තියෙනවානේ. සභාපතිතුමා ඔබතුමා මේක ගැන දන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා මෙහෙමයි. දැන් අපි දැනටමත් තරංගා ලෑන්ඩ්ස් ආයතනය කරන වෙන්දේසි ඉඩමේ අඩුපාඩු ටිකකට යවලා තියෙනවානේ අදාළ ඉංජිනේරුවරයාට. ඔය යෝජනාව ඊට වැඩිය ප්‍රායෝගිකයි. කෙනෙක්ගේ රැකියාව පිළිබඳව ඒ අයට උගන්වන්න යන්න ඕන නැහැ. ඒ ගොල්ලෝ දෙන්නේ ඕක ගැන දැන ගෙන. වරලත් ඉංජිනේරුවරයා ඒක දෙන්නේ ඉංජිනේරු වෘත්තිය ගැන නොදැන නෙමෙයිනේ. ඔය යෝජනාව සංශෝධනය වෙනවා නම් හොඳයි. ඒ අය අපේ කමිටුවක් එක්ක ගිහිල්ලා තීරණය කරලා දෙන්න කියන එක තියෙනවා නම් හොඳයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කමිටුවක් එක්ක ගිහිල්ලා තීන්දු කරනවා කියන්නේ, හදලා ඉවර වුණාමනේ යන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි අවසන් එක දෙන්නේ නැහැ. අනුකූලතා සහතිකය දෙන්නේ නැහැ. අපි ප්ලෑන් එක අනුමත කරලා දෙන්නේ නැහැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් මේකෙදී විතරක් නෙමෙයි ඔය හැම ඉංජිනේරුවෙකුටම ඒක බලපානවා. මොකද ඔය හදාගෙන එන ඒවාට පවා දේශපාලඥයෝ නෙමෙයි ඉංජිනේරුවෝ තමයි වගකියන්න ඕන. කොන්ත්‍රාත්කරුවෝ ඒ දෙන සැලැස්මටනේ කරන්නේ. දැන් මේකෙදී බලන්න අපි පාරක් හදනකොට දන්නවා අඟල් හතරේ ගල් දාලා, කපලා, තලලා, කරන්න. එහෙම තියෙන්නේ. ඉතිං මේකෙ එහෙම එකක් නැහැනේ. එක පාරකවත් අඟල් හතරේ ගල් දාලා තියෙනවාද, ඒවා දාලා නැහැ. ඊළඟට

මොකක්ද කරන්නේ. අවුරුදු පහ සම්පූර්ණ වුණ ඒවා ගැන බලලා තියෙනවද කියලා මම දන්නේ නැහැ. දැන් නගරිගෙවත්තේ එක කරා කියලා මට ආරංචියි. අර පැච් ටික දාලා ගියා. එතනින් පස්සේ මොකක්ද වෙන්නේ. අපි කියන්නේ අඟල් හතරේ ගල් දාලා මේ වැඩේ කරන්න. අපි සභාවෙන් හරියට කරනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් වර්තමානයේ කරන ඒවා හැම එකක්ම අපි බලනවානේ. හැම එකක්ම බලන්න කියලා තාක්ෂණ නිලධාරීන්ට කියලා තියෙනවා. ඒ අයට ඡායාරූපත් අරගන්න කියලානේ තියෙන්නේ. එහෙම නොදා තිබුණොත් ඒකත් ඒ අය එක්ක බලාගන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක හරි. ඒක ගැන බලාගන්න ඕන. ඒක දැනුවත් කරා කියලා කිසි වැරැද්දක් වෙන්නේ නැහැ. ඉතිං සභාපතිතුමා අදටත් මේ එකක්වත් අත හරින්න එපා. මොකද හේතුව මේ අය අවුරුදු පහ ඉවරවෙලා යනකොට යන්නේ යම්තම් පැච් එකක් දාලා. එහෙම තමයි කරොත් කරන්නේ. ඒ හින්දා ඒකට ඉඩ තියන්නේ නැතුව හරියට පාර කරලා යන්න කියන්න. නැත්නම් ඊළඟට ඔබතුමන්ලාගේ ප්‍රතිපාදන තමයි මේවාට වියදම් වෙන්නේ. ඔබතුමන්ලාට ඇවිල්ලා කරදර කරහම ඔබතුමන්ලාගේ ප්‍රතිපාදන වියදම් වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 20.** සභා න්‍යාය පත්‍රයේ ප්‍රගතිය විෂය, යථා පරිදි කල් දී ඇති යෝජනා (ඉ) යන්නට කලින් ගත යුතු යැයි යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා අපි ඉතිහාසයේ හැමදාම කරේ එහෙම. මොකද සභාපතිතුමනි හැමදාම අපිට සිද්ධ වෙන දේ තමයි අන්තිමටම හැම කෙනාටම මොකක් හරි ප්‍රශ්නයක් නිසා යන්න ඕන වෙනවා. කොහොම හරි ඒ නිසා නැගිටලා යනවා. ඒ නිසා අපි පහුගිය සභාවේ කරන ලද වැඩ පිළිබඳව ප්‍රගතිය බලලා ඉවර වෙලා තමයි අපේ අලුත් යෝජනා ගේන්න ඕන කියන එක තමයි මේ කියන්නේ. අපි මෙතෙක් කල් හැම සභාවකම කරේ ඒ දේ. ඒ නිසා තමයි මම ඒ යෝජනාව කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකෙ තියෙනවා (ඌ) යටතේ තමයි පහුගිය රැස්වීම්වල ප්‍රගතිය සමාලෝචනය කරන්න තියෙන්නේ කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි මෙතෙක් කල් කරෙත් එහෙමනේ. මම විමර්ශන නිලධාරීන්ගෙනුත් මේ ගැන ඇහුවා. සභා තීන්දුවක් අරගෙන ඒක කරන්න පුළුවන් කිව්වා. ඒක ප්‍රශ්නයක් නැහැ කියලා කිව්වා. මේකෙ තියෙනවා ප්‍රායෝගිකව ඇත්තටම පේන දෙයක්. ඒ තමයි අපි ගිය සභාවේ ගන්නා ලද තීන්දු තීරණ ක්‍රියාත්මක කරාද කියන එක කතා කරලා තමයි අපි අලුත් තීන්දු තීරණ වලට යන්න ඕන. මම ඒක ගැන මෙහෙනුත් ඇහුවා. ඒකෙ කිසි ප්‍රශ්නයක් නැහැ කියලා කිව්වා. අපේ ඉතිහාසයේ හැමදාම සභාවලදී ඒක කරලා තියෙනවා. මේ සභාවේදී ඇරෙන්න අපි හැමදාම කරලා තියෙන්නේ එහෙම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකෙ තියෙන තැන සම්බන්ධ ගැටළුව මොකක්ද, දැන් ඕකෙ වෙන ගැටළුව මම කියන්නම්කෝ. ඕක අපි කලිනුත් කරානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මුළු සභා ඉතිහාසයේම කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ඒක නීත්‍යානුකූලභාවයෙන් පිටකරේ. නමුත් ඒක එහෙම කරහම මන්ත්‍රීතුමා ඒ ටිකේදී කතා කරලා මන්ත්‍රීවරු කොටසක් නැගිටලා යනවා. අවශ්‍ය තීන්දු තීරණ ගන්න වෙලාවට ඒ අය නැහැ. ඉතිං න්‍යාය පත්‍රයේ කොතනටද අපි මේක දාන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේක මම දන්නවා. මේක ගැන මම ඇහුවා. පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අද ඊයේ නෙමෙයි බොහොම කාලයකට උඩදීත් මම මේක ගැන ඇහුවා. මේ මෑතකදීත් මේක ගැන ඇහුවා. එතකොට කිව්වේ කිසි ප්‍රශ්නයක් නැහැ ගන්න පුළුවන් කියලා. අපි මේක අනුව තමයි ගරු සභාපතිතුමා මීට කලින් සභාවල් කරෙත්. ඒකෙන් කිසිම හානියක් වුණේ නැහැ. කවුරුත් සභාව ඉවර වෙනකම් හිටියා. මොකද වැදගත් දේවල් තියෙන්නේ ප්‍රගතිය පිළිබඳව. මේකෙදී අන්තිමට තදියමේ කවුරුත් යන්න ලැස්ති වෙනවා. අපි ඊළඟට විශේෂ සභාවක් හරි දාමු කියලා යනවා. ඒ නිසා මම කරුණාවෙන් මේක කරන්න කියලා ඉල්ලනවා. මේක ඉතිං ප්‍රශ්නයක් නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඒකට එහෙන් උපදෙස් අහලා බලලා කරන්නම්. අනිත් එක මේක මතුවෙච්ච නිසා කියන්නම්. දැන් අපි මාසික දීමනාව ලබා දුන්නා සභාව එන්න කලින්. කීපවාරයක්ම අපි අප්‍රේල් මාසයේ ඉඳගෙන එහෙම ලබා දුන්නා. නමුත් දැන් විමර්ශන නිලධාරි බොහොම

පැහැදිලිව කියලා තියෙනවා දීමනාව ලබා දෙන්නේ සභාවට සහභාගි වීමට නිසා සභාවෙන් පස්සේ මිසක් සභාවට කලින් ඒක දෙන්න එපා කියලා. ඒක පළවෙනි කාරණය. දෙවෙනි කාරණය තමයි මේක. සමහර මන්ත්‍රීවරු නිවාඩු පිට හිටියත් අපි අසනීපයි කියලා නිවාඩු අනුමත කරලා දෙනවා. නමුත් අසනීප නිවාඩුවක් අනුමත කරන්න නම් අනිවාර්යයෙන්ම වෛද්‍ය වාර්තාවක් හෝ වෛද්‍ය සහතිකයක් ලබා දෙන්න කියන එක මේ අවස්ථාවේදී සියළුම මන්ත්‍රීතුමන්ලාට සහ මන්ත්‍රීතුමියන්ලාට කියනවා. ඒක අපේ ප්‍රශ්නයක් නෙමෙයි. මෙතනට ඇවිල්ලා විනාඩි කිහිපයක් හරි ඉඳලා යන්න කියන එක තමයි කියන්නේ. ඒක අපේ අඩුපාඩුවක් නෙමෙයි. අලුතෙන් විමර්ශන නිලධාරි කෙනෙක් පැමිණිලා ඉන්නවා. අපි බොහොම දන්න කියන කෙනෙක් මේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ක්ෂණික අපහසුතාවයක් ඇති වුණොත් ඒකට වෛද්‍ය සහතිකයක් ගන්න යන්න බැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අබේසේකර මන්ත්‍රීතුමාට කතා කරලා බේර ගන්න.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 21.** මීපාවල ලද්දුහෙට්ටිවත්ත වෙන්දේසි ඉඩම ප්‍රදේශයේ කුණු එකතු කිරීම සඳහා දිනයක් වෙන් කරන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** චමින්ද මන්ත්‍රීතුමා මේකට පොඩ්ඩක් උනන්දු වෙන්නකෝ ට්‍රැක්ටරයක් යවන්න.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** කුණු ගෙනයාම සම්බන්ධව මේ කතා කරන්නේ. අපේ ගමේ කුණු ටික අරගෙන යන්න ට්‍රැක්ටරය ඇවිල්ලා තියෙනවා. ඒ කුණු අරගෙන යද්දී ගමේ අයට කියලා තියෙනවා කොවිඩ් නිසා පී මාට් ෆුඩ්සිටිය හරියේ කුණු එකතු කරන්න එපා කිවුවා කියලා. සභාවෙන් කිවුවාලු කොවිඩ් නිසා කුණු එකතු කරන්න එපා කියලා. මම කිවුවා එහෙම වෙන්න විදියක් නැහැ කියලා. ඒ හරියේ කොවිඩ් ඇත්තේ නැහැ. ඇත්තටම ඒ හරියේ කොවිඩ් නැහැ, හන්දිය හරියේ තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙම දෙයක් තියෙන්නේ. කොවිඩ් ගෙවල් වලින් නම් කුණු ගන්න එපා කියලා අපි කියලා තියෙන්නේ. අපි දන්නේ නැහැ අනිත් ඒවා. ඒක අපි ඔයගොල්ලෝ කාගෙත් ආරක්ෂාවටනේ කරන්නේ. අපිට අපේ සේවකයන්ව අනතුරේ හෙළන්න කොයි වෙලාවකවත් බැහැ. ඒ ඇරෙන්න අපි කුණු ගන්න එපා කියලා නැහැ.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මමත් ඒක පිළිගන්නවා. කුණු අරගෙන නැහැ. කොවිඩ් නැති ගෙවල් ගැන මම කියන්නේ. ඒ හරියේ එක ගෙදරකින්වත් කුණු අරගෙන නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඊළඟට ගරු සභාපතිතුමා මගේ හත්වෙනි යෝජනාව ඔබතුමා අහක දාලා තියෙනවා. මම හිතන්නේ සභාපතිතුමාට යෝජනාවක් අයින් කිරීමේ අයිතිය තියෙනවා. මගේ හත්වෙනි යෝජනාව ඉන්ධන පිළිබඳ යෝජනාවක්. ඉන්ධන වලට පහුගිය වතාවේ විරෝධතාවයක් දාන ප්‍රමාණයට ප්‍රශ්නයක් තිබුණා. මම දැක්කේ නැහැ ඒකෙ එහෙම එකක් වෙනවා. මම ගෙනාපු යෝජනාව තමයි ගෘහස්ථව හරි ඇල්කොහොල් නිෂ්පාදනය සඳහා අවසර ලබා දෙන්න කියලා. මේක විහිළුවට ගන්න ඕන එකක් නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීවරුම කියන්න ඒක අස්කරපු එක හොඳද නැද්ද කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමන්ලා අපි මේ ඉන්නේ දියුණු ලෝකයක. අද යුරෝපීය සංවිධානය, ඇමෙරිකාව පවා මේක පිළිඅරගෙන තියෙනවා. අද ලෝකයේ ඉන්ධන වලට 15% ක් ඇල්කොහොල් මිශ්‍ර කරනවා. බ්‍රසීලය සම්පූර්ණයෙන්ම ඇල්කොහොල් වලින් ධාවනය වන වාහන හදලා තියෙනවා. මම කියන්නේ මේක සාකච්ඡා කරලා දම්මා නම් හරි. ඒ විතරක් නෙමෙයි සභාපතිතුමා දැන් ඇල්කොහොල් ගැන එච්චර අප්‍රිය විදියට කතා කරන්න කාටවත් අයිතියක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් කතා කරන්න පුළුවන්නේ. න්‍යාය පත්‍රයට දාලා තීන්දුවක් ගන්න ඕන වෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒකට තීන්දුවක් ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම වුණොත් ඒ යෝජනාව සභා සම්මත කරන්න වෙනවා. නැත්නම් බෙදීමකට යන්න වෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් මම ලබන සභාවට යෝජනාවක් ගේනවා. අනේ මේක නම් අයින් කරන්න එපා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** වවාගෙන කන්න, පෙරාගෙන බොන්න කියලද කියන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** පෙරාගෙන බොන්න නෙමෙයි කියන්නේ. බොනවා කියන එකේදී හැංගි හොරා ගිහින් බොන කට්ටියත් ඉන්නවා. අපි බොන්නේ නැහැ කියලා ඒ අය කියනවා. බොනවා කියන එක ගැන ඔය කියන ජාතියේ මේවා දාන්න බැහැ. මේ රටේ අමද්‍යප ව්‍යාපාරයේ හිටපු ලොකුම මැතිතුමා පවා පොඩි අඩියක් ගහනවා. නමුත් ඒක කියන්නේ නැහැ. ඒක කියා ගන්න බැහැ. මම ඒක ගැන පෞද්ගලිකවම දන්න නිසා මේ කියන්නේ. ඒ අමද්‍යප ව්‍යාපාරයේ හිටපු සභාපතිතුමෙක්. අද වෙනකොට එතුමා මිය පරලොව ගිහිල්ලා. ඒ නිසා මේ ගැන කතා කරන්න හොඳ නැහැ. එතුමා පොඩි අඩියක් ගහනවා. අවුරුදු පනහක්, පනස් පහක් පැන්නට පස්සේ චූටි පෙග් එකක් ගන්නවා නම් කිසි වැරැද්දක් නැහැ කියලා කියන්නේ. නමුත් වැඩක් තියෙන්නේ දොස්තර මහත්තයෙක් විදියට අරක කිවුවොත් අපේ කට්ටිය කොන්ද අනිත් පැත්තට යන්න ගහනවා. නෝනට අර වචනෙත් කියලා ඇහුනේ නැද්ද දොස්තර මහත්තයා මෙහෙම කිවුවා කියලා කියාවි. ඒක හින්දා තමයි මේක ඒ විදියට වෙලා තියෙන්නේ. දියුණු ලෝකයේ මේවා දැන් තියෙනවා. ඔබතුමන්ලා අපි ගියපු මුස්ලිම් රටවල්වල මේවා නොතිබුණාද, එක්තරා කාලයක සිගරට් බොනකොට බස් එකේ යද්දී අපි නැවිලා ගියේ. දැන් එහෙම සිගරට් බොන්නේ නැහැ. ඒ හින්දා විනයක් ඇති වෙනවා. ලෝකයේ වයින් වලට සහ ඇල්කොහොල් වලට වෙනම ගම්මාන තියෙනවා. ඒවා බ්‍රැන්ඩඩ්. මම අනිත් පාර ඇත්තටම යෝජනාවක් ගේනවා. ඒවා සම්මත නොවුණාට කමක් නැහැ. හැබැයි ඒක දාන්න. ඒ තමයි රෙඩ් ලයිට් ස්ට්‍රීට් නීතිගත කළ යුතුයි. මේවා විහිළුවට ගන්න ඕන දේවල් නෙමෙයි. මේවා අපිට කරන්න බැහැ. හැබැයි අපි මේ යෝජනාව උඩහට දාන කොට තමයි ඒවා යන්නේ. ඔබතුමා පළාත් සභාවට හරි පාර්ලිමේන්තුවට හරි ගියාම පහසුයි මේවා ගෙනියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වයසට ගිහින් බැරි වුණාමලු ඕවා මතක් වෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එකක් මතක තියා ගන්න. වඳුරෝ හැට පැන්නත් බිමින් යන්නේ නැහැ. මේක විහිළුවකට ගන්න එපා. මම මේවා ගේනවා. ඊළඟට පොඩි ළමයි මහණ කිරීම පිළිබඳවත් යෝජනාවක් ගේනවා. මම ජනප්‍රිය වෙන්න නෙමෙයි ඇත්තටම මේවා කියන්නේ. මේක ගැන ඇත්තටම කතා කරපු මිනිස්සු ඉන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕවා කතා කරලා මන්ත්‍රීධූරය නැති කර ගනිපු මිනිස්සුත් ඉන්නවා. අජිත් ප්‍රසන්න මන්ත්‍රීතුමාට මොකක්ද වුණේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මගේ මන්ත්‍රීධූරය නැති වුණා කියලා මම බයවෙන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අජිත් ප්‍රසන්න මන්ත්‍රීතුමාගේ මන්ත්‍රීධූරය නැති වුණා ඔය කතාව කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එහෙම නම් මංගල සමරවීර ඇමතිතුමාගේ මන්ත්‍රීධූරයත් නැති වෙන්න එපැයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේජර් අජිත් ප්‍රසන්න මන්ත්‍රීවරයා රට ගිහින් ඇවිල්ලා ඕක ගැන පළාත් සභාවේදී ප්‍රකාශ කරා. මේක කරන්න ඕන කියලා කිවුවා. මේ හොඳ දක්ෂ මන්ත්‍රීවරයෙක්. හොඳ ස්ථාවරයක හිටපු මන්ත්‍රීවරයෙක්. අන්තිමට මොකද වුණේ. මේ මාව නැති කරන්න ගේන එකක්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේකෙන් ඔබතුමාට බලපෑමක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැත්තේ මොකද, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව ඒකමතිකව මේක තීන්දු කරා කිවුවම කොහොමද ඒක යන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක කිසි ප්‍රශ්නයක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට වටකරලා ගහන්න බැලුවා. අද කසිප්පු පෙරන්න ගේනවා. ඊළඟ සභාවේදී ගණිකා වෘත්තිය නීතිගත කරන්න ගේනවා. මරු වැඩ තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ කාලයේ නිල නොවන විදියට වෙන්නප්පුව පැත්තේ මේවා කරා. නමුත් අල්ලන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, සන්සයිඩ් ගාර්ඩන් සුභ සාධක සංගමය විසින් මට ලියුමක් ඉදිරිපත් කරලා තියෙනවා. මම මේ ගැන ලියනගේ මන්ත්‍රීතුමා සමඟත් සාකච්ඡා කරා.

දෙවැනි පටුමග ප්‍රවේශ මාර්ගය නිරවුල් කර ගැනීම. (සන්සයිඩ් ගාර්ඩන් සුභ සාධක සංගමය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක නැවැත්තුවානේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඒකට මැනුමක් දාලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ කියන්නේ තාප්පය ඉස්සරහින් තව තාප්පයක් ඉදිකරපු එක. මල් වවන්න ඉදිකරපු එක නැවැත්තුවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒක නැවැත්තුවාද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ගිහින් නැවැත්තුවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඊළඟ එක තමයි මේ කපුහෙම්පල මාර්ගයේ පින්නදූවට වැටෙන මාර්ගයේ කිලෝ මීටරයේ කණුව ගාව ලයිට් එක නිතරම වාගේ නිවෙනවා. එතන ඒ සම්බන්ධව ප්‍රශ්නයක් තියෙනවා. ඒ සම්බන්ධව ඔබතුමන්ට උපුල් ගොඩගේ මහතාත් කතා කරලා කියන්න ඇති. කපුහෙම්පල මාර්ගයේ කිලෝ මීටරයේ කණුව ගාව තියෙන ලයිට් කණුවේ ලයිට් එක දැන් ටික කාලයක ඉඳලා දැල්වෙන්නෙම නැහැ. කපුහෙම්පල මාර්ගයේ දිගටම ලයිට් කිහිපයක් පත්තු වෙන්නෙම නැහැ. එතන මත්ද්‍රව්‍ය ජාවාරමකුත් තදින්ම යනවා.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** අපේ පැත්තෙත් ඕක තමයි ගරු සභාපතිතුමා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** එතන මාසයකට සැරයක් විශාල කුණුගොඩක් ගෙනල්ලා දානවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැනට ලයිට් එක දැල්වෙන්නේ නැද්ද.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අද ලයිට් හදන්නේ කපුහෙම්පල. ඒ අයට කෝල් එකක් දීලා මේක කියන්න.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ලයිට් කිහිපයක්ම පත්තු වෙන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ ගොඩදූව පාරද.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මේ කපුහෙම්පල පාර. එතන මාසයකට සැරයක් කුණු ටිකක් ගෙනල්ලා දානවා. ඒ කුණු ගෙනල්ලා දාලා යන කොට දවස් දෙකක් යනකම් ලයිට් එක පත්තු වෙන්නේ නැහැ. මම හිතන්නේ වෙන මොකක් හරි දෙයක් එතන යනවා. ඒක මත්ද්‍රව්‍ය සම්බන්ධව තමයි යන්නේ මම හිතන විදියට. ඒ කණුව වටේ නිතරම සුද්ධ කරලා තියෙනවා. ඒක නිසා ඒ සම්බන්ධව අවධානය යොමු කරන්න කියලා තමයි මම ඉල්ලීම කරන්නේ.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ගරු සභාපතිතුමා, අපේ මන්ත්‍රීවරු හැමෝගේම ගෙදරට ලියුමක් ආවා. ඒ පිළිබඳව කතා කරේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකෙන් පස්සේ ඒක ගැන කතා කරමු. මගේ රෙදි ගලවනවා කියලා තිබුණා ඒකෙ. මම ඒක ගැන කතා කරන්නම්.

**(ඊ) කාරක සභාවල වාර්තා ඃ-**

**01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I. 2021-06-28 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

දෙවැනි එකේ දිනයේ වැරදීමක් තියෙනවා. 2021-06-09 නෙමෙයි, ඒක 2021-07-09 දින ලෙස සංශෝධනය විය යුතුයි.

**II.** 2021-07-09 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**02. තාක්ෂණික සේවා කමිටුව ඃ-**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** **I.** 2021-06-28 දින පැවති තාක්ෂණික සේවා කමිටුව

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**03. නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව ඃ- නැත**

**04. පරිසරය සහ පහසුකම් කමිටුව ඃ- නැත**

**(ඉ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-**

**01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** **I.** 2021 වර්ෂයේ මැයි මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** **II.** 2021 වර්ෂයේ ජුනි මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** **I.** 2021 වර්ෂයේ මැයි මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** **II.** 2021 වර්ෂයේ ජුනි මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** **I.** 2021 වර්ෂයේ මැයි මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- II.** 2021 වර්ෂයේ ජූනි මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**04. වෙනත් ලේඛන ඃ- නැත**

**(ඈ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා**

**පසුගිය මහා සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2021 වර්ෂයේ ජූලි මස මහා සභාවට ඉදිරිපත් කරන ප්‍රගතිය සමාලෝචනය.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, කුඩුවැල්ලා කියලා එක්කෙනෙක් අනවසරයෙන් ඉදිකිරීමක් කරන සිද්ධියක් සම්බන්ධව නිර්ණාමික ලියුමක් ඇවිල්ලා තියෙනවා. මට විතරක් නෙමෙයි අනෙක් මන්ත්‍රීවරු සියළුම දෙනාටත් ඒක එවලා තියෙනවා. ඒක නිසා කරුණාකරලා ඔබතුමා මේක ගැන පැහැදිලි කරන්න. අපිට පැහැදිලි නැහැ. මොකක්ද වෙලා තියෙන්නේ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇත්තටම මම ඔය පිළිබඳව ඉතාමත්ම කණගාටු වෙනවා. මොකද මගේ හෘද සාක්ෂිය අනුව මම කියන්නේ. ඔය ඉදිකිරීමට විරුද්ධව චෝදනාව ගෙනාවේ එතුමාගේම සහෝදරයා. එතුමාගේ සහෝදරයා තමයි ප්‍රාදේශීය සභාවට ඕක ගෙනාවේ. මීපාවල, හෝළුවාගොඩ ඉවර වෙන කොට වැලිහන්දිය කියලා කියන තැන මේ. ඔය චෝදනාව අට දෙනෙක් අත්සන් කරලා ලිඛිතව ගෙනාවේ එයාගේ සහෝදරයා. ඔය කියන කුඩුවැල්ලා කියන කෙනාගේ අයියා මේක ගෙනාවේ. ඊට පස්සේ මම එවලේම අපේ තාක්ෂණ නිළධාරිතුමියට දුරකථනයෙන් දැනුම් දුන්නා. ඒ ලියුමේ මම සටහනක් දාලා එයාගේ අතේම යැවුවා තාක්ෂණ නිලධාරිතුමියට වහාම ඒක නවත්වන්න කියලා. මොකද එතන තියෙන්නේ පර්චස් හතරයි. සම්පූර්ණයෙන්ම පර්චස් හතරක ඉඩමක් ඒක. එතන එයා දැනටමත් එළවළු කඩයක් කරගෙන යනවා. ඒකෙන් පර්චස් 1.62 ක වගේ ප්‍රමාණයක් පාරට ගිහිල්ලා තියෙනවා. ඉතුරු වෙන්නේ පර්චස් දෙකයි ගාණක්. අඩි 20 x 35 තමයි ඒ මුළු භූමි ප්‍රමාණය තියෙන්නේ. ඒක අපිට කොහොමවත් අනුමත කරන්න හැකියාවකුත් නැහැ. අපිට එහෙම අනුමත කරන්න අවශ්‍යතාවයකුත් නැහැ. තාක්ෂණ නිලධාරිතුමිය ගිහිල්ලා වහාම ඒක නැවැත්තුවා. අපි ඒකට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත්තා. හවස නැවත දුරකථනයෙන් මට දැනුම් දුන්නා එයාගේ සහෝදරයා මේක නැවත කරන්න හදනවා කියලා. මම කිවුවා එයාටත් 119 අමතලා ඒක කියන්න කියලා. මමත් කියන්නම් කියලා කිවුවා. එතකොට පොලීසියෙන් එතනට ආවා. මට ඒ ගැන එයාගේ දුරකථනයෙන්ම දැනුම් දුන්නේ. ඒ පාර පොලීසියේ කෙනාට මම කිවුවා මේක නවත්වලා තියෙන්නේ, ඕක කරන්න දෙන්න එපා කියලා. ඒ පාර හා හොඳයි කියලා ඒක නැවැත්තුවා. ඒ පාර ආයේමත් මට කතා කරලා කියනවා මේ ගොල්ලෝ කියනවා කියලා ඉස්සරහ ටික කරන්න එපා, පිටුපස ටික අපි කරන්න කිවුවා කියලා. කිසිසේත්ම අපි එහෙම කියලා නැහැ. අපිට එහෙම කියන්නත් බැහැ. කරුණාකරලා ඒක නවත්වන්න කිවුවා. ඒ අනුව, ඒක නැවැත්තුවා. ඊට පස්සේ දවසේ ඒක නැවැත්තුවා. ඕක වුණේ හවස. නමුත් ඊට පස්සේ දවස වෙනකොට තමයි ඔය ලියුම් ටික ගිහිල්ලා තියෙන්නේ. මම දන්නේ නැහැ මේක මොන ක්‍රමයක්ද කියලා. මට ඒක තේරෙන්නේ නැහැ. ඇත්ත කතාව ඒක. ලියුමක් තැපැලට දාන්නවත් වෙලාවක් නෙමෙයි. ඒක තමයි මට හිතාගන්න බැරි. තාක්ෂණ නිලධාරිතුමිය එතනට ගියේ දවල් 12.30 ට 01.00 ට විතර. ඊට පස්සේ දවසේ උදේ තමයි ටෙක්ලා මන්ත්‍රීතුමියට ලියුම ඇවිල්ලා තිබුණේ. ඔක්කොටම ලියුම එන්න ඇත්තේ එදා උදේ. මට හිතාගන්න බැහැ මේක මොකක්ද කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** තැපැල් කන්තෝරුවෙන් සීල් එක වැදිලා තියෙන්නේ පහලොස්වෙනිදා.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** මට මුද්දරයකුත් නැතුව තමයි ලියුම එවලා තිබුණේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොම හරි මෙතුමිය මට කතා කරලා කිවුවේ ඊට පස්සේ දවසේ. නමුත් සිද්ධිය ඒක නෙමෙයි. කොහොම හරි මට නම් ඕක එච්චර ගැටළුවක් නැහැ. ඒ පුද්ගලයා මෙහාට ආවා තාත්තත් එක්ක. ඔය කියන කෙනයි, තව රජයේ නිලධාරියෙකුයි එක්ක මාව හමුවන්න ආවා. මම කිවුවා ඒක මට කොහොමවත් අනුමත කරන්න හැකියාවක් නැහැ කියලා. ඒක අනුමත

කරන්නේ නැහැ. හැබැයි මම මෙහෙම කිව්වා, ඔබතුමාට දැනට තියෙන ටික පාවිච්චි කරන්න පුළුවන් කියලා. නමුත් බේස් දාලා අලුත් ඉදිකිරීමක් කරන්න බැහැ. මොකද පර්චස් එකයි ගාණක් පාරට ලබා දීලා තියෙනවානේ. ඉතිං ඒකෙදී එයා අර ටික භුක්ති විඳලා තියෙනවා. ඒකෙ නරකම දේ තමයි එතනම තිබුණ මහ ඉඩම එයා රුපියල් ලක්ෂ ගාණකට විකුණලා එතන පර්චස් හතරක් ඉතුරු කරගෙන තියෙනවා. ඒක තමයි මේකෙ සිද්ධ වෙච්ච නරකම දේ. එයාගේ තාත්තත් ආවා. ඒ තාත්තා හිටපු පොලිස් නිලධාරියෙක්. තාත්තත් එන්නේ එයත් එක්ක. එයත් එක්ක ඇවිල්ලා කියනවා මෙයාට ලොකු අසාධාරණයක් වෙනවා කියලා. අපිට මොන අසාධාරණය වුණත් අදාළ නැහැ. එයාට පර්චස් හතර තිබුණත් ඒ ඉදිකිරීම කරගෙන යන්න අපිට අනුමැතිය දෙන්න බැහැ. දැනට තියෙන්නේ පර්චස් දෙකයි ගාණක්. සැලසුම් කමිටුවටත් එයා ආවා. කවුරු කියලද දන්නේ නැහැ. අපි කිව්වේ එතන ඉදිකිරීමක් කරන්න කිසිසේත්ම අවසර දෙන්න බැහැ කියලා. එයාට අපි ඒකට අවසරය ලබා දෙන්නෙත් නැහැ. ඒක බොහොම පැහැදිලිව කියන කාරණාවක්. මගේ රෙදි තියා මොනවා ගැලෙව්වත් ඒක එහෙම තමයි. ඕන කෙනෙකුට ඕන දෙයක් කියන්න පුළුවන්. ඔය විදියට තමයි ඒකට කටයුතු කරේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඒ ලියුම මටත් ආවා. ඒ පුද්ගලයා මාව මුණ ගැහෙන්න ඇවිල්ලා තිබුණා. මාව මුණ ගැහුණේ නැහැ, මම ඒ වෙලාවේදී හිටපු නැති නිසා. එයාගේ සහෝදරයත් හම්බවෙලා මට කතා කරා. මම මේකෙ දැනගන්න කැමති කාරණයක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි මම මේ වෙලාවේදී ස්තුතිවන්ත වෙන දෙයක් තියෙනවා. මේකට දේශපාලන අධිකාරියේ කිහිපදෙනෙකුත් මට කතා කරා. පහුගිය සෙනසුරාදා දවසේ රමේෂ් පතිරණ ඇමතිතුමාව හමුවෙන්න ගිහිල්ලා ඔය අදාළ පුද්ගලයා කතා කරා. මම එවෙලෙත් කිව්වේ කිසිසේත්ම ඒකට මම ඉන්න කාලයේදී අනුමැතිය දෙන්නත් බැහැ, අනුමැතිය දෙන්නෙත් නැහැ කියලා. මම ඒ පුද්ගලයාට කිව්වා ඒක කරොත් කඩා ඉවත් කරනවා කියලා. මම චමින්ද මන්ත්‍රීතුමාටත් ඒ සිද්ධිය වෙච්ච දවසෙම මේක ගැන දුරකථනයෙන් දැනුම් දුන්නා. එතුමා ඒ වෙනකොට මේ සිද්ධිය ගැන දන්නෙත් නැහැ. එතුමා දන්නෙත් නැහැ සිද්ධ වෙච්ච දේ. නමුත් ඊට පස්සේ දවසේ උදේ වෙන කොට මන්ත්‍රීවරුන්ට ලියුම් ඇවිල්ලත් ඉවරයි.

(ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා අපිට මේකෙ දැන ගන්න තියෙන කාරණයක් තියෙනවා. දැන් මේ පර්චස් හතරයි ගානෙන් පාරටත් කොටසක් අයින් වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එයා කරන්න ගියේ බේස් වළවල් දාලා. අපි ඒක නැවැත්තුවා. අපි එතනින් එහාට එයාට මේක ඉදිකරන්න දෙන්නේ නැහැ. නමුත් මට තියෙන ප්‍රශ්නය මන්ත්‍රීතුමා මේ ඔක්කොම කරලා තියෙනවා. මට එයාගේ සහෝදරයා කතා කරහම කිව්වා ඒ පැත්තේ සියළුදෙනාම දන්නවා කියලා මම ඒක නැවැත්තුවා කියලා. එයා නම් කියන්නේ මේක ඔය පුද්ගලයාට කරන කුමන්ත්‍රණයක් කියලා. එතකොට මේක ආවම අර පුද්ගලයා එක්ක තරහා වෙලා මේ පැත්ත ගනීවි කියලා කියන්නේ. ඒක කිසිසේත්ම ඒ පුද්ගලයා කරපු දෙයක් නෙමෙයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මෙහෙම තියෙන්නේ. දැන් එයාගේ පැරණි ඉදිකිරීමක් මේකෙ තිබුණා. දැන් ඒකෙන් කොටසක් කඩලා පාරට අත්පත් කර ගෙන තියෙනවා. පර්චස් දෙකයි ගාණක ඒ ඉඩම ඉදිකිරීමක් එක්ක තමයි දැනට තියෙන්නේ. මේකෙ මම හිතන්නේ වැසිකිළි පහසුකම් ඒ මුකුත් නැහැ. කලිනුත් මේක ඉදිකරන්න ගිහිල්ලා නතර කරපු එකකුත් තියෙනවා. දැන් හැබැයි මේක සම්පූර්ණයෙන්ම ඉවත් කරන්නේ නැත්නම් තියෙන ගොඩනැගිල්ල පවත්වා ගෙන යන්න එයාට අවසරය තියෙනවා නම් ප්‍රශ්නය තියෙන්නේ එතන. අර කියන පහසුකම් ගන්න එක ප්‍රශ්නයක්. ළිඳක් තියෙනවා එහා පැත්තේ. අසල්වැසියන්ගේ ළිං තියෙන්නේ ඒ ආසන්නයේ. මේකට විද්‍යාත්මක ක්‍රමවේදයක් තියෙනවාද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට කිසිසේත්ම ක්‍රමවේදයක් නැහැ. පර්චස් දෙකයි ගාණක ඉඩමක වැසිකිළියක් ඉදිකරන්න දෙන්න බැහැ එහා පැත්තේ ළිඳකුත් තියෙද්දි. එයාට තිබුණේ මන්ත්‍රීතුමා එයාගේ මහ ඉඩම විකුණනකොට ඔය ඉඩම් කෑල්ලත් විකුණලා දාන්න. එයා ඇයි එතන පර්චස් හතරක් ඉතුරු කරේ. ඔන්න ඔතනයි ගැටළුව තියෙන්නේ. අපිට ඉතිං ඒවාට උත්තර හදන්න බැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ පෞද්ගලික දේවල්නේ. දැන් එතන වෙන ප්‍රශ්න තියෙනවා මම හිතන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මීට වඩා ඒක ගැන කතා කරන්න එපා. කාලය වැය කිරීම වැඩක් නැති දෙයක්. අපිට ඒකට අවසරයක් දෙන්න බැහැ, දෙන්නෙත් නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම ඔබතුමාට මේකට අවසර දෙන්න කියනවා නෙමෙයි. දැන් ඇත්තටම ඒ කරපු ඉදිකිරීම පවත්වා ගෙන යනවානේ. එතකොට ඒකෙ ප්‍රශ්නයක් ආවොත් මොකද කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා හැමතිස්සෙම ඉන්නේ සියලුදෙනා ඉන්න පැත්තේ නෙමෙයි, අනිත් පැත්තේ. ඒක තේරුම් ගන්න. අපිව අපහසුතාවයට ලක් කරන්න එපා. ඕකට වෙනත් ක්‍රියාමාර්ගයක් නැහැ. අපිට කියන්න බැහැ එයාට මේ කරන එක කරගෙන යන්න කියලා. මොකද, පර්චස් දෙකයි ගාණයි ඉඩම තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපිට දෙයක් ඇවිල්ලා කිව්වම ඒක නිවැරදි කරන්න ඕනනේ. එයාගේ සහෝදරයා එක්කත් මම කතා කරා. එයාගේ සහෝදරයා මගේ හිතවතෙක්. අපි එක පන්තිවල හිටියේ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ මමත් ඉන්න තැන. මාත් එක්කත් ඇවිල්ලා මේ සම්බන්ධව කතා කලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා කෙටියෙන් කියනවා නම් ඕක මෙහෙමයි. එක්කෝ ඒ මනුස්සයා ඒ පර්චස් හතරත් දාලා ඉඩම විකුණන්න ඕන. එයා හොඳටම දන්නවා පර්චස් හතරක් ඉතුරු කර ගන්න කොට මේකට අනුමැතියක් ගන්න බැහැ කියලා. එක්කෝ එයා ඒකත් මාර්ග සංවර්ධන අධිකාරියට ගන්න කියන්න ඕන. ඒක ඉවරයක් කර ගන්න ඕන. අපිට බැහැ සභාව විදියට ඒ පර්චස් දෙකයි ගාණට තීන්දුවක් ගන්න. මම මේක කියන එකත් වැරැද්දක් වේවි. එයාට මේක තාවකාලිකව අටවාගෙන ඉන්න කියලා කිව්වමත් කියාවි ඔන්න සභාපතිතුමා කියපු නිසා කරගෙන ගියා කියලා. කතාව කෙටියෙන්ම එච්චරයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභාවේ තීන්දුව ඒකට අනුමැතිය දෙන්නේ නැහැ කියන තැනනේ තියෙන්නේ. ඒක අපිට ගැටළුවක් නැහැ. මම කියන්නේ අසල්වාසින් ඇවිල්ලා කතා කරන කොට අපි මොකක් හරි උත්තරයක් දෙන්න ඕනනේ අපිට තියෙන නීත්‍යානුකූලභාවයත් එක්ක. මම මේ නිලධාරීන්ගෙන් ඒක දැන ගන්න අහන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා මේක දන්නවානේ. පර්චස් හයකට අඩු එකකට අනුමැතිය දෙන්න අපිට කතා කරන්නවත් බැහැනේ. ඒකෙදී අපි ඔය කතාව නවත්වමු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම කියන්නේ තියෙන එක ඉවත් කරන්න පුළුවන් මොකක් හරි තියෙනවාද, එතන ගොඩනැගිල්ලක් තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකත් අපිට කියන්න බැහැ මන්ත්‍රීතුමා. එයාගේ ඉඩම අපිට අනුමත කරන්න බැහැනේ. අපි කිව්වේ වෙනම එකක් හදන්න එපා කියලා. මොකද ඒ කිව්වේ මනුස්සකම සලකලා. නැතුව නිකං අපි මේ ඒක අනුමත කරනවා නෙමෙයි. අපිට එහෙම හැකියාවක් නැහැ. එයා කරන්න හැදුවේ ඒක නෙමෙයි. එයා කරන්න හැදුවේ වටෙන්ම බේස් දාලා ඉවර වෙලා ඒක තට්ටු තුනකට විතර හදන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක නිකං කරන්න බැහැනේ. ඒකට අදාළ පහසුකම් තියෙන්න ඕනනේ. අදාළ පහසුකම් නැතුව කොහොමවත් ඒක අනුමත කරන්න බැහැනේ. ඒක නීත්‍යානුකූලත් නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක ඔබතුමා තේරුම් ගන්න ඕන කාරණාවක්. එයා ඇයි පර්චස් හතරක් එතනින් ඉතුරු කර ගත්තේ. එයාගේ ඔය අරමුණ ඇතුව තමයි ඒක කරේ. එයාට තට්ටු තුන හතරකට ගොඩනැගිල්ල හදන්න තියෙන අරමුණ ඇතුව තමයි ඒ පර්චස් හතර ඉතුරු කර ගත්තේ. ඒකයි වුණේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, පලාගල කන්ද ප්‍රදේශයේ මාර්ගයට මායිම්ව තාප්පයක් ස්ථිර වශයෙන් ඉදිකිරීමක් පහුගිය කාලයකදී පැවතුණා. එම තාප්පය ඉදිකිරීම සභාව විසින් තහනම් කරා. නමුත් රාත්‍රී කාලයේදී ඒ සම්පූර්ණ තාප්පය ඉදිකරලා නිම කරා. ඊට පස්සේ අනිත් මායිම පාරකට මායිම් වන තැනක්. එම මාර්ගයේ කිසිවක් ඉදිනොකරන ලෙස සභාව දැනුම් දී තිබුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි එයාට දැනුම් දීලා වහාම ඒක නැවැත්තුවා. අපි ලිඛිතව දැනුම් දීලා තියෙනවා එයා ඒක අයින් නොකරොත් නීතිමය ක්‍රියාමාර්ග ගන්නවා කියලා එයාට විරුද්ධව.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඊයේ දිනයේදී මමයි, තාක්ෂණ නිලධාරිතුමයි එතනට ගියා. ඒක ඉවත් කරලා නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි එයාට විරුද්ධව නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගන්නම්. අපි ගිය සතියේ ඒක දැනුම් දීලා තියෙනවා. එයා ඒක නොකරොත් එයාට විරුද්ධව අපි නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගන්නවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඒ නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගන්න.

සභාපතිතුමනි, අද අපේ ප්‍රාදේශීය සභාවට එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් මන්ත්‍රීවරයෙක් හැටියට තෝරා පත් කරලා එවලා තියෙනවා කුලරත්න සහෝදර මන්ත්‍රීතුමාව. අපි ඉතාමත් සුහදව එතුමාව පිළිගන්නවා. ඒ වගේම එතුමා නවක මන්ත්‍රීවරයෙක් නොවුණත් මේ සභාවට මන්ත්‍රීවරයෙක් හැටියට තෝරා පත් කර එවීම පිළිබඳව අපි අපගේ සතුට මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. එතුමා බුද්ධිමත්, උගත්, පරිණත මහජන නියෝජිතයෙක් හැටියටයි අපි හඳුනාගෙන තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මාර මිනිස්සු. කියාස් මන්ත්‍රීතුමා යනකොට දුකයි, අසාධාරණයි කිවුවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** කියාස් මන්ත්‍රීතුමා යන වෙලාවේදී මම කතා කරේ නැහැ. ඒ නිසා මට මේක කියන්න පුළුවන්. මම එතුමාට කණගාටුව ප්‍රකාශ කරේ නැහැ. එහෙම දිව දෙකට කතා කරන්නේ නැහැ මම. එවෙලේ කතා කරා නම් දැන් කතා කරන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක බලන්න ඕන. ඒක මට මතක නැහැ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මළගෙදරයි, මගුල් ගෙදරයි දෙකක්නේ ගරු සභාපතිතුමා. අපි එවෙලේදී කණගාටු වෙනවා. මෙවෙලේදී සතුටු වෙනවා. කොහොමත් දේශපාලනයේදී ගියාම ඉවරයි, ආවොත් හොඳයි. ඒක සාමාන්‍ය දෙයක්නේ. නමුත් මම කියාස් මන්ත්‍රීතුමාට කණගාටුව ප්‍රකාශ කරේ නැහැ. ඉතිං අපේ කුලරත්න මන්ත්‍රීතුමා පෝද්දල ප්‍රදේශය තමයි නියෝජනය කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔය ක්‍රමවේදය අපිත් ඉගෙන ගන්න ඕන. ඒක මරු.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඒකට ඉවසන් ඉන්න ඕන සභාපතිතුමා රනිල් වික්‍රමසිංහ මැතිතුමා වගේ අනිත් අවස්ථාව එනවා නේද කියලා. මේක එන බව දන්නවානේ. ඒ නිසා කෝච්චිය යනකම් දුම්රිය නැවතුම්පොලේ ඉවසාගෙන ඉන්න ඕන. කලබල වුණොත් ඉවරයි. ඒක නිසා අපිට මෙතුමාට එක සිතින් සුභ පතන්න පුළුවන්. එතකොට එතුමා ප්‍රායෝගිකයි. මම එතුමාව දීර්ඝ කාලයක සිට දන්නවා. එතුමා ප්‍රායෝගික පුද්ගලයෙක්. ඒ නිසා එතුමා මේ පොළවේ පය ගහලා ඉන්න ජනතා නියෝජිතයෙක් හැටියට මම හඳුන්වනවා. මේ බෝපෙ පෝද්දල ප්‍රදේශයේ ජනතාවට සේවයක් කරන්න, සහනයක් සලසන්න අපි ගනු ලබන සියළු තීන්දු තීරණයන්ට එතුමාගේ සහයෝගය අපිට ලබා දීලා හොඳින් කටයුතු කරන්නට ශක්තිය ධෛර්ය ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතුමා ඒකට දක්ෂ මන්ත්‍රීවරයෙක්. එතුමා සුහදව කටයුතු කරයි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එතුමා මටත් අවුරුදු හත අටකට උඩදී පුද්ගලික උදවුවක් සභාව සම්බන්ධ දේකදී කරලා තියෙනවා. ඒකත් සිහිපත් කරනවා. එතුමාට මේ මන්ත්‍රීධුරයේ කටයුතු ඉතාමත් සාර්ථකව ඉටු කර ගෙන යාමට අවශ්‍ය ශක්තිය හා ධෛර්ය ලැබේවා කියලා අපි ප්‍රාර්ථනා කරනවා.

**ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා ඃ-** බොහොම ස්තුතියි. මට ඉතාමත් සතුටුදායක දවසක් අද. බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව මම මීට ඉහතදී වසර හතරක් නියෝජනය කරලා තියෙනවා. මේ සභාව තුළ මේ ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා, අද දවසේ මෙතන නොමැතිව ඉන්න ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමත්, ඒවගේම ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් වන ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමත්, ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා, ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා, ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා, ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා, ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා, ගරු මන්ත්‍රිනී එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය, ගරු මන්ත්‍රිනී ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය, ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා, ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා, ගරු මන්ත්‍රිනී ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය, ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය, ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා, ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා, ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා, ඒවගේම අපේ ලේකම්තුමාටත් ස්තුතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොම හරි දූන් ස්තුතිය ප්‍රකාශ කරපු මන්ත්‍රීතුමාගේ නම කියවුණේ නැහැ. ඒක තමයි දේශපාලනය කියන්නේ.

**ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා ඃ-** ඒකත් තියෙනවා. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා, ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා, ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය, ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමාටත් ස්තුතියි. දීර්ඝ කාලයක් තිස්සේ මන්ත්‍රීවරුන් සේ අපි එකට ක්‍රීඩා සමාජවල නිරත වුණා. ඒ කාලයේ ඉඳන්ම අපි ආශ්‍රය කරපු පුද්ගලයෝ. ඒ නිසා තමයි මම එතුමාගේ නම අන්තිමටම කිව්වේ. මොකද මම ගැන පැහැදිලි කිරීම සම්බන්ධයෙන් එතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ සභාවේ තාක්ෂණ නිලධාරීතුමන්ලා ඒ වගේම කාර්ය මණ්ඩලයත්, ප්‍රාදේශීය සභාවේ කම්කරුවන් සියළුදෙනාමත් මේ ප්‍රාදේශීය සභාවේ සියළුදෙනාමත් ඉතාමත් ගෞරවයෙන්, ආදරයෙන්, භක්තියෙන් මතක් කරනවා. මේ සියළුදෙනාම බොහොම වැදගත්.

අපේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව කියන්නේ ලංකාවේ තියෙන වටිනාම ජන කොටසක් ජීවත්වන ප්‍රදේශයක්. ශ්‍රී ලංකාව තුළ තිබෙන සශ්‍රීකම ප්‍රදේශයක් මේක. කරදර වලින් බැහැරව තිබෙන ප්‍රදේශයක් මේක. ඒ නිසා මේකෙ ඉන්න බලගතුම පුද්ගලයා තමයි ප්‍රාදේශීය සභාවේ සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා. එතුමා මේ බලගතු නායකත්වය අරගෙන මේ ප්‍රදේශය තුළ බොහොම අවංකව සේවය කරන, අපි සමග සහෝදරත්වයෙන් කටයුතු කරන පුද්ගලයෙක්. ඒ නිසා ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා සියළුදෙනාටමත් මතක් කරනවා අපි සහෝදරයන් සේ මහජනයා වෙනුවෙන් ඇවිල්ලා ඉන්නේ. කැපකිරීමක් කරන්න තමයි මේ මන්ත්‍රීධූරය භාරගෙන ඉන්නේ. මේ මන්ත්‍රීධූරය අපි භාර ගත්තේ බෝපෙ පෝද්දල කියන වැදගත් ප්‍රදේශය නියෝජනය කරන්න ආපු සභිකවරුන් විදියට. ලංකා ඉතිහාසය ගැන කිවුවොත් මේ බෝපෙ පෝද්දල කියන්නේ සියළුම උගතුන් සහ පහළ මට්ටමට යනකම් සියළුම දෙනා අංග සම්පූර්ණයෙන් ඉන්න ප්‍රදේශයක්. බෝපෙ පෝද්දල ප්‍රදේශයේ මහජනයා වෙනුවෙන් නියෝජනය කරන අවස්ථාව තමයි මේක. ඒ නිසා බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව ඉතාම වාසනාවන්ත ප්‍රාදේශීය සභාවක්. සියළුදෙනාම සහෝදරවරුන් සහ සහෝදරවරියන් සේ සභික තනතුරු අරගෙන ප්‍රදේශය තුළ බොහොම වැදගත් කටයුත්තක් ඉෂ්ට කරනවා. මැති ඇමතිවරු, මන්ත්‍රීවරු වගේම මම නියෝජනය කරන අපේ පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමාවත්, අපේ පක්ෂයේ සභාපති වජිර අබේවර්ධන මැතිතුමාවත්, මේ අවස්ථාවේදී සිහිපත් කරන්න ඕන. මොකද එතුමන්ගේ අනු දැනුම උඩ තමයි මම මෙතනට පැමිණියේ. මීට ඉහත හිටපු මාගේ මිත්‍ර හුසේන් කියාස් මැතිතුමා යම් කිසි ප්‍රශ්නයක් උඩ මෙතනින් නෙරපා හැරියා. ඒ නිසයි මට මේ තනතුර ලැබුණේ. සියළුදෙනා සමග අපි ඉතාමත් කුළුපගව, මිතුරුකමින්, හිතෛෂීව මහජනයා වෙනුවෙන් කැප වෙනවා කියන එක මම ප්‍රකාශ කරනවා. මේ වැදගත් බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ සියළුම ප්‍රාදේශීය නායකයන් ඉන්නවා. අපි දූන් මෙතනදී බොහොම වැදගත් විදියට සියළුදෙනා සහෝදරවරුන් සේ කතා කරා. ඇත්තටම ඒක වැදගත්. මේ සභාව උත්තරීතර සභාවක්, වැදගත් සභාවක් කියලා කියමින් ඔබ සියළුදෙනාටම සම්මා සම්බුදු සරණ ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. සභාව ඉදිරියට ගෙනියන්න දිනෙන් දින දියුණු වේවා කියලා කියනවා. ගරු සභාපතිතුමා ඇතුළු සියළුදෙනාටම මේ අවස්ථාවේදී ස්තුතිය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. සියළුදෙනාටම තෙරුවන් සරණයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මතක නැති වේවි කියලා මේක කියන්නේ. සුමිත් ජයසේකර උප සභාපතිතුමාට අසනීප තත්ත්වයක් නිසා අද දිනයේදී මහා සභා රැස්වීමට සහභාගි වීමට නොහැකියි කියලා දැනුම් දුන්නා. එතුමාට නිවාඩු අනුමත කරන්න මම මේ අවස්ථාවේදී යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම ප්‍රගතිය ගැන කතා කරන්න ඉස්සෙල්ලා වෙනත් දෙයක් ගැන වචනයක් දෙකක් කතා කරන්න ඕන අපේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය ගැන. ඔබතුමන්ලා හරි ඒකට ඉල්ලීමක් කරන්න. මට ඉඩක් තිබුණේ නැහැ ඒක යෝජනාවක් විදියටම ගේන්න. මොකද හේතුව මේ පහුගිය දවසක ප්‍රශ්නයක් මතු වුණා. ලියනගේ මන්ත්‍රීතුමත් මම හිතන්නේ ඒක ගැන දන්නවා. රට යන ළමයෙක් හිටියා. ඒ ළමයා නැවකට යන්න ඕන වැඩ භාර ගන්න. ඇත්තටම අපි ඒකට සන්තෝෂ වෙන්න ඕන. මොකද, ඒ අය රටට විදේශ විනිමය ගේනවා. නමුත් මේකෙදී මීපාවල ප්‍රදේශයේ ඉන්න මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාගෙන් ලබා ගන්න ඕන නිරෝධායනය වුණේ නැහැ කියන සහතිකය. ඉතිං ඒක ගන්න කතා කරහම මට කතා කරපුවා මගේ ළඟ තියෙනවා. අනිත් එකත් කියන්න ඕන. මම රෙකෝඩ් කරනවා. මගේ ඒවා ඕන කෙනෙක් රෙකෝඩ් කරන්න. කිසි ප්‍රශ්නයක් නැහැ. මම බයත් නැහැ. ඕන තැනක කියන්න පුළුවන් ඒවා මම කියන්නේ. එතකොට මේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා කතා කරපුවා දැක්කොත් එහෙම හරියට දුක හිතෙනවා. මේ ඉල්ලන්නේ හොර සහතිකයක්වත්, වෙන මොකක්වත් නෙමෙයි. මේ ඉල්ලන්නේ මෙයා නිරෝධායනය වුණේ නැහැ කියන සහතිකය. එහෙම ප්‍රශ්නයක් තිබුණේ නැහැ කියන එක ඉල්ලන්නේ. ඒක දෙන්නේ නැහැ. මේ ප්‍රශ්නයට එයාලා මොකක් හරි කරලා ගත්තා. මොන ක්‍රමයටද ගත්තේ කියලා මම අහන්න ගියේ නැහැ. කරුණාකරලා ඒකට ඉල්ලීමක් කරන්න. ඒ වගේ අවශ්‍යතාවයක් ආවොත් අනිවාර්යයෙන්ම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි

කාර්යාලයෙන් ලබා දෙන්න කියලා කියන්න ඒ සහතිකය. මොකද එහෙම ප්‍රශ්නයක් මතු වෙච්ච නිසා තමයි ඒක කිවුවේ.

ඊළඟට මම ඉල්ලා සිටිනවා මේ ගැන. කරුණාකරලා අපි අහන්න ඉස්සෙල්ලා දැන් මෙතෙක් නඩු දාපු අනවසර ඉදිකිරීම් සහ ගොඩකිරීම් ගැන තියෙන ප්‍රගතිය අදාළ නිලධාරීන් ලවා සභාවට ඉදිරිපත් කරන්න හැම මාසයකම. මේ නඩුව තියෙනවා, මෙදා මේකයි වුණේ කියලා ඒ තත්ත්වයන් සම්බන්ධව සභාවට ඉදිරිපත් කරන්න කියලා ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට අවුරුදු පහ පැනපු, ඒ කියන්නේ වෙන්දේසි ඉඩම්වල තියෙන පාරවල් ප්‍රතිසංස්කරණය අවුරුදු පහ පනින්න කලින් කරන්න ඕන කියන තීන්දුව තියෙනවා. ඒකට ගිවිසුමකට ඇවිල්ලා තියෙනවා. ඉතිං ඒක නිසියාකාරව ක්‍රියාත්මක වෙන්නේ නැහැ. දැන් අද වෙන කොට බලන්න ඊරියගහදූව පාර ගැන. සුමිත් ජයසේකර උප සභාපතිතුමා අද මෙතන ඇත්තේ නැහැ. එතුමා විශේෂයෙන්ම බලන්න ඕන පාරක් ඒක. ඒක ගන්නම දෙයක් නැහැ දැන්. ඒකෙ මොකක්වත්ම නැහැ දැන්. ඉතිං මේවා ගැන බලන්න ඉන්නේ ගුණසේකර තාක්ෂණ නිලධාරිතුමා නේද ඒ පැත්තට. කරුණාකරලා ඒවා බලන්න. ඒ ලැයිස්තුව වහාම ගන්න. අවුරුදු පහ වෙනකම් දශමයටම ඉන්නේ නැතුව ඒක ගන්න. ඒක අරගෙන ඉදිරිපත් කරන්න.

ඊළඟට මම මේක ගැන ඉල්ලා සිටිනවා. ඇත්තටම යෝජනා කිහිපයකුත් ගෙනාවා මේකට. අපි මේ පොඩි මිනිස්සුන්ට ක්‍රියාමාර්ග ගන්නවා. ලොකු මිනිස්සුන්ටත් ක්‍රියාමාර්ග ගන්න කියලා කියනවා. දැන් දහනායක එකට නඩු දාලා තියෙනවා. එතනින් ගියාම දැන් ඒකෙ තත්ත්වය ගැන අහන්න ඕන. ඊළඟ එක විදියට ලීඩ්ස් ඉන්ටර්නැෂනල් එකට නඩු දාන්න භාර දීලා තියෙනවා. ඒක දාලා තියෙනවා. ඊළඟට බොහොම පැහැදිලිවම ග්‍රෑන්ඩ් පැනරෝමා එකේ තත්ත්වය කොහොමද, අනේ කරුණාකරලා ඊළඟ සභාව වෙනකම් නම් ඉන්න එපා. ඒ ගනිපු ක්‍රියාමාර්ග ගැන අපිට දන්වන්න. දැනට තියෙන ප්‍රගතියත් අපිට දන්වන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එතනදී අබේසේකර මන්ත්‍රීතුමා අපේ නීතිඥ මහත්වරු ඇහුවා ලීඩ්ස් ඉන්ටර්නැෂනල් එකේ ලක්ෂ හතළිස් ගාණක දඩ මුදල ලබා ගන්නවාද කියලා. අපි කිවුවා ඒකට එකඟ නැහැ කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ඒක නෙමෙයි. ඊට වැඩිය ගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** අපි කිවුවේ විශ්වවිද්‍යාලයෙන් හරි, එන්.බී.ආර්.ඕ. එකෙන් හරි ඉස්සෙල්ලා ඩ්‍රෝවින් ස්ට්‍රක්චර් එක ගේන්න කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ඒක ගේන්න ඒ අයට කියන්න ඕන. දැන් ඔබතුමාට මේකට මම හොඳ උදාහරණයක් කියන්නම්. අපේ ඉඩම් කැල්ලේ පහළ තියෙන්නේ ග්‍රෑන්ඩ් පැනරෝමා එක. මේවා කරාට පස්සේ ඉල්ලනවා එන්.බී.ආර්.ඕ. එකෙන් රිපෝට් එක. ඉතිං ඒ අය ආයේම මැනලා කොහොමද ඒක දෙන්නේ. මේවා අන්තිමට මහ විහිළු වෙනවා. දැන් ඒකෙ සභාපතිතුමා බලන්න ඒ ගෙදර අයව අමාරුවේ දාන්නේ අපි ඒක හදන්න දීලා. දැන් මොකක් හරි කරලා ඒක නිවැරදි කිරීම කරනවා නම් හරි. ඒවගේ ඒවා එන්නේ නැහැ. අර අතන හදපු තට්ටු තුනේ ගේ වගේම තමයි ඒක. අපි ඒකට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න ඕන. මොකද හේතුව ඒ වගේ තැනක එකකට ක්‍රියාමාර්ග ගන්නේ නැත්නම් ඒක තේරුමක් වෙන්නේ නැහැ. එහෙමනම් ඉතිං අපි කිසිකෙනෙකුට මේ වගේ තීන්දු ගන්න නරකයි. ඒවාට තීන්දු ගන්න ඕන. ඒ ගෙදර පෙනි පෙනීම පාරේ හදන්නේ. අපේ නිලධාරීන්ගේ ඒක බලාගෙන හිටියේ. මගේ ළඟ තියෙනවා ඒකෙ ඔක්කොම විස්තර ටික. මම ඒවා ඉදිරිපත් කරන්නම්. කොච්චර කාලයක් තිස්සේ ඉඳන් මේක ඉදිරිපත් කරනවාද, තව වෙනකම් ඒක බැරි වෙලා තියෙනවා. හැමදාම ඇහුවම ඒකට මොකක් හරි කියනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා :-** අබේසේකර මන්ත්‍රීතුමා, අලුත් මන්ත්‍රීතුමාට ඔබතුමා සුභපතන්නේ නැද්ද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** මම ඒක ගැන වෙනම කතා කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා :-** මම නිකන් ඒක මතක් කරා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** මම ඔබතුමා මතක් කරපු නිසා කියන්නම්. මම කොහොමත් ඒක අන්තිමට කියන්න හැදුවේ. සුභ පතනවා විතරක් නෙමෙයි, වෙනත් කතාවකුත් කරන්න තියෙනවා. ඒ තමයි මේක සභාව දැනගන්න ඕන. මේක රටේම මිනිස්සු දැන ගත්තත් කමක් නැහැ. දැන් ඔබතුමන්ලා දන්නවා කියාස් මන්ත්‍රීතුමාගේ මන්ත්‍රීධූරය අහිමි වුණේ කොහොමද කියලා. ඒ කියන්නේ ඒක පක්ෂයක විනය පිළිබඳ ප්‍රශ්නයක්. ඉතිං හැමතැනම විනයක් කියලා එකක් තියෙනවා. හැම පක්ෂයකමත් ඒක තියෙනවා. හැම ගෙදරකමත් ඒක තියෙනවා. හැම තැනකම විනයක් තියෙනවා. හැබැයි එකක් තියෙන්නේ විනය පිළිබඳ ඒ ප්‍රශ්නවලදී අබේසේකර නෙමෙයි තීන්දු ගන්නේ. අබේසේකර ගනිපු කිසි තීන්දුවක් නැහැ. දැන් ටෙක්ලා මන්ත්‍රීතුමිය බොහොම සුහදව මාත් එක්ක කිවුවා අබේසේකර මන්ත්‍රීතුමා තමයි කියලා ඔය ඔක්කොම කරන්නේ. එතකොට ලංකාවෙන්ම මම වෙන්න ඕන ඒක කරන්නේ. මම විනය ගැන නෙමෙයි

කරන්නේ. වෙන එකක් කරන්නේ. දැන් වැඩක් තියෙන්නේ කියාස් මන්ත්‍රීතුමා අපි එක්ක බොහොම හිතවත්ව හිටියේ. අපි දෙන්නා එකට ආපු මන්ත්‍රීවරු. නමුත් එකක් තියෙනවා. ඒ විනය පිළිබඳ ප්‍රශ්නවලදී මේ තීන්දු අරගෙන තියෙන්නේ පක්ෂය විසින්. හැබැයි මේවා අබේසේකර නෙමෙයි ගන්නේ. දැන් මෙතුමා මාත් එක්ක ඉඳගෙන කිවුවා වජිර හිටපු ඇමතිතුමා ළඟදී කතාකරලා වජිර හිටපු ඇමතිතුමා වාඩි වෙන්න කියලා මට බැන්නා කියලා. ඊයේ තමයි විනාඩියකට විතර වජිර හිටපු ඇමතිතුමාව හමුවුණේ අහම්බෙන්. නැත්නම් මට හම්බවෙලත් නැහැ. අපෙන් අහලා ගනිපු තීන්දුවක් නෙමෙයි මේ. හැබැයි මොකක් හරි අදහසක් මට දක්වන්න ආවා නම්, මගෙන් ඇහුවා නම්, මේකෙ ඉන්න අත්දැකීම් තියෙන කෙනෙක් විදියට මම මීට වඩා වෙනත් දෙයක් කියනවා. මම කියනවා මීටත් වැඩිය වෙනස් විදියක ක්‍රියාමාර්ගයක් ගන්න කියලා. ඒ කියන්නේ මේ සියළුදේටම. නමුත් වැඩක් තියෙන්නේ ඒවා වෙලා ඉවරයි. කුලරත්න මන්ත්‍රීතුමාට මම අලුතෙන් සුභ පතන්න දෙයක් නැහැ. එතුමා එනවා කිවුවම ඉස්සෙල්ලම සන්තෝෂ වුණ මිනිහෙක් මම. මොකද හේතුව අපි බොහොම කිට්ටුවෙන් එකට ඉන්නේ. ඉතිං එතුමාට අපි සුභ ප්‍රාර්ථනා කරනවා. සුභ ප්‍රාර්ථනා කරන්නේ මොකක්වත් නෙමෙයි. සුහදකම තියෙනවා. මේක ඇතුලේදී නීතියයි, හරිදේයි එක්ක එකට ඉන්න ඔබතුමාට ධෛර්යය, ශක්තිය, ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

දැන් නිකන් කිවුවොත් එහෙම කියාස් මන්ත්‍රීතුමා මෙතන නැති හින්දා මේවා ගැන කතා නොකළ යුතුයි. මේක කතා කරලා තියෙන නිසා කතා කරාට කමක් නැහැ. නමුත් ඊට එහාට මම කතා කරන්නේ නැහැ. ඇත්තටම ඉතිං මම එහෙම හිනා වුණාම ඇති කතා නොකර.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ වගේම තමයි මම මේක අත්දැකීමෙන් කියන්නේ. සියළු මන්ත්‍රීවරු දැනගන්න ඕන අන්තිමට තමන්ට තමන් විතරයි කියන එක. කණ්ඩායම් හැදෙයි, අරක කරයි, ඔය මුකුත් නැහැ තමන් වලට වැටෙන කොට. එතකොට තමන් එක්ක ඒ වලට එන්න කිසි කෙනෙක් නැහැ. ඒක දැනගන්න ඕන සියළුදෙනාම. ඒක කාටත් පොදු ධර්මතාවයක්. කියාස් මන්ත්‍රීතුමා හොඳට හොඳයි, නරකට නරකයි කියලා මම කියනවා. එතුමා සමහර දේවල් වලට විරුද්ධව කතා කරා. සමහර දේවල් වලට පක්ෂව කතා කරා. මම හිතන්නේ එතුමා සාධාරණ තැනක හිටපු කෙනෙක්. අන්තවාදී තැනක නැතුව විපක්ෂයේ හොඳ තැනක එතුමා හිටියා. ඒක මම අදටත් කියන කතාවක්.

(ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම දැන් මේක ඔබතුමාගෙන් අහන්නේ දිගට ගෙනියන්න නෙමෙයි. ඔබතුමා දන්නවා එතුමා විරුද්ධ පක්ෂයේ නායකයා. මට දැන් මේ කටු ඔටුන්න වැටිලා ගොඩක් කල්. මේ සභාවටත් ඒක එවලා තියෙනවා. හැබැයි මම ඒක පාවිච්චි කරන්නේ නැහැ. හැබැයි මම විරුද්ධ නම් විරුද්ධ වෙන දේට පෙනී සිටිනවා. අපිට පෞද්ගලික ප්‍රශ්න නැහැ මෙතන. මීට ඉස්සර සභාවල දැනට වඩා සුහදතාවයක් තිබුණා. අපි සභාව ඉවරවෙලා ගිහින් එක තැනක හිටියා. දැන් ඒක එහෙම නැහැ. ඒක ඉතින් වෙන කතාවක්නේ. නමුත් සභාපතිතුමා මම අහනවා මේක හරිද කියලා. ඔබතුමාම ඒක කියන්න. ලියුමට අත්සන් කරලා ඉවරවෙලා ඔබතුමා ළඟට ඇවිල්ලා වොයිස් කට් එකක් දීලා ඒ වැඩේ කරගෙන යන එක හරිද කියලා කියන්නකෝ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකෙදි එතුමාට වැඩේ කරගන්න ඕන වුණාම අනුගමනය කරන ක්‍රියාමාර්ගයක්. ඉතිං ඒක එතුමාට හරි වෙන්න පුළුවන් අපිට හරි නැති වුණාට. එතුමා මේ සභාවේ බොහොම විවෘතව ගොඩක් දේවල් වලට විරුද්ධව විවේචන එල්ල කරා. සමහර දේවල් වලට බොහොම පක්ෂව කතා කරනවා. ඉතින් ඒක මම කොයිවෙලාවකවත් නැහැ කියලා කියන්නේ නැහැ. පද්මසේන සභාපතිතුමා ඉන්න කාලයේදී විරුද්ධව කතා කරන වෙලාවල් වගේම, මම පක්ෂව කතා කරපු වෙලාවල් තියෙනවා. ඒ වගේම අපි ආණ්ඩු පක්ෂය විදියට විරුද්ධව වැඩ කරද්දී, විරුද්ධ පක්ෂයේ අය පද්මසේන සභාපතිතුමාට සහයෝගය ලබා දීලා වැඩ කරපු අවස්ථාවල් තියෙනවා. ඔබතුමා ඉන්න මතය අපි විරුද්ධ පක්ෂය, ඒ නිසා අපි විරුද්ධයි. මේ සභාපතිවරයා මොනවා කරත් ඔබතුමන්ලාගේ මතය විරුද්ධ වෙන්න ඕන කියන එක.

(ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** විරුද්ධ පක්ෂයේ මතය නෙමෙයි. එතුමා ගොඩ නගපු මතයක් තියෙනවා. ඒ කතාව අහන්න. මම ඕන නම් ඒක අහන්න දෙන්නම්. මොකක්ද කිවුවේ, මට ප්‍රතිපාදන දීලා තියෙනවා ඒ නිසා කොහොමද විරුද්ධ වෙන්නේ කියලා. දැන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත් ප්‍රතිපාදන ලබා දෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාටද ප්‍රතිපාදන දීලා තියෙන්නේ. එක රුපියලක් දීලා නැහැ. මෙතන ඉන්නවා තාක්ෂණ නිලධාරීන් අහන්න ඕන නම්. එක රුපියලක ප්‍රතිපාදනයක් කියාස් මන්ත්‍රීතුමාට ලබා දීලා නැහැ. මම ඒක වගකීමෙන් කියන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ කොට්ඨාශයේ කෙරුණ වැඩ ටික කරේ එතුමානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ. ලයිට් එකක් දාන්න ඕන වුණාම එතුමා වාහනය එක්ක ගිහින් ඒක දානවා. මට ඒක වළක්වන්න බැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක නෙමෙයි මම කිවුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නම් මොකක්ද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒකෙ පාරවල් දැම්මා. කාණු දැම්මා. ඒවා කරේ එතුමානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එහෙම නම් එතුමා ඉඳගෙන කිවුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අයගේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තිබුණ කාලේ ගෙනාපු ප්‍රතිපාදන වලන් එතුමා වැඩ කරේ. නමුත් අපේ සභාවේදී වැරදි අර්ථකථනයක් දෙන්න එපා. ඔබතුමන්ලා දැන් කියාස් මන්ත්‍රීතුමාගෙන් අහන්න. මේ සභා ප්‍රතිපාදන වලින් එක රුපියලක් එතුමාට ලබා දීලා නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේක ගැන එතුමා නැතුව කතා කරන එක වැරදියි. මේක ඉවරවෙලා සුහදව ඕක ගැන කතා කරමු ඕන නම්. මම කියන්නේ විරුද්ධ පක්ෂය කියන්නේ හැම එකටම විරුද්ධව ඉන්නවා කියන එක නෙමෙයි. අපි එහෙම හිටියේ නැහැ. අපි ඉඳලා තියෙනවා ඕන තරම් පක්ෂවල. නමුත් එකක් තියෙනවා සභාපතිතුමා. විරුද්ධ වෙන්න ඕන දේට විරුද්ධ වෙන්න ඕනනේ. දැන් මේ සභාවේ ඔබතුමන්ලාගෙන් බල්බ් එකක්වත් ඉල්ලන්න මම ඇවිල්ලා නැහැ. මොකද හේතුව ඒක ලැබෙන්නේ නැහැ. ඕක පෙන්වලා ඉවරවෙලා ඡන්දය ගන්න එක, මක්කා හරි ටිකක් ගුලි කරලා තියලා ඒක දීලා ඡන්දය ගන්න එකයි දෙකක් සභාපතිතුමා. ඒක අමතක කරන්න එපා. ඒක ඉතිං ඔබතුමයි, මමයි හම්බවුණාම කතා කරමු. මේක සියක් වාරයක් කතා කරලා තියෙනවා. ස්තුතියි.

**<u>සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.</u>**

මීළඟ මහා සභා රැස්වීම 2021-08-18 වන බදාදා දින පෙ.ව 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.